# කාන්තා සවිය

2024



ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ප්‍රකාශනයකි

# කාන්තා සවිය
# 2024

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

# කාන්තා සවිය

**උපදේශකත්වය**
යමුනා පෙරේරා
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

චම්පා උපසේන
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

**අධීක්ෂණය**
පී.එල්. සුසන්ත ධර්මකීර්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

**සංස්කරණය**
සමුද්‍රා ගුණවර්ධන - සංවර්ධන නිලධාරී
පවිත්‍රා රසාංජලී ජයරත්න - සංවර්ධන නිලධාරී
ප්‍රියන්තා සෙනෙවිරත්න - වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර
ප්‍රියංගා කුමාරි - සංවර්ධන නිලධාරී
රසිකා ප්‍රියදර්ශනී - සංවර්ධන නිලධාරී
ශාරිකා සිල්වා - සංවර්ධන නිලධාරී

**කවරය සහ පරිගණක පිටු නිර්මාණය**
යශිකා නිලුක්ශි අමරවංස - සංවර්ධන නිලධාරී

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
තෙවන මහල, සෙත්සිරිපාය අදියර 11
බත්තරමුල්ල

දුරකතන - 0112186348 ෆැක්ස් -0112187271
ඊමේල්-womensbureau.wa@gmail.com

සදන්නට සුන්දර ලොවක්
කරමු ගැහැනිය ශක්තිමත් ...! 8

කාන්තා කාර්ය සංවිධාන තුලින්
සමානාත්මතත්වයෙන් පිරි සමාජයක් 13

මිදුණු කඳුළු 20

නිර්වාණය හා ස්ත්‍රිය 26

Violence against women – The
Human Rights Perspective 32

ඔබ සතුටින් සිටින්නේ ද? 34

ශ්‍රී ලංකා කාන්තාවන්ගේ සමාජ තත්ත්වය
ලිබරල් ස්ත්‍රී න්‍යායේ උපයෝගීතාවය 36

ආර්ථිකයට සවියක් වන ඇය 42

"ඇයට බුද්ධිය හා ශක්තිය" 45

අපරාධ වින්දිතභාවය හා කාන්තාව 49

Invest in Women: Accelerating
progress through poverty
Reduction in Sri Lanka 53

ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩසටහනක්
සඳහා ව්‍යාපෘති වාර්තාවක් ලියන්නෙ
කොහොම ද ? 57

කවි පිටුව 63


මෙම කෘතියේ පළ කර ඇති ලිපිවල අදහස් සහ අයිතිය
එම ලේඛකයාගේ බව සැලකිය යුතුය



**කාන්තා හා ළමා කටයුතු**
**රාජ්‍ය අමාත්‍යංශයේ**
**අමාත්‍යතුමියගේ පණිවුඩය**

කාන්තාව සොබාදහම ලෝකයට මැවූ අපූර්වතම නිර්මාණයයි. ලෝකයේම ජීවය, සුන්දරත්වය, ආරක්ෂාව, වගකීම, වගවීම, ආදී පරිණත සෑම වචනයකම ඇය හා බැඳුණු සබැඳියාවක් ඇත. කාන්තාව හා බැඳුණු ඇගේ දැනුම් සම්භාරය විහිදී යන පරාසය කොපමණදැයි නිශ්චය කළ නොහැක. සැබවින්ම අම්මා යන ආදර නාමයෙන් ඇය ලොවට ජීවීන් එක් කරන්නී ය. ඔවුන් යහගුණයෙන් පිරි සමාජයක් වෙත යොමු කිරීමට වෙර දරන්නී ය. එමෙන්ම තම දරු පරපුර හදා වඩා ගැනීමේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන්නී ය. ඔවුන්ගේ අනාගතය ගැන සිතා ඊට අඩිතාලම් සකසන්නී ය. එමෙන්ම බිරිඳක ලෙස ඇය සිය සැමියා මෙන්ම සිය පරපුරම උදෙසා මහගු මෙහෙයක් ඉටු කරන්නී ය. දියණියක, මිත්තණියක, ඥාතිවරියක ලෙස සිය වගකීම් හා වගවීම් නොමසුරුව දරන්නී ය.

ඇය වෘත්තීයමය වශයෙන් ඉටු කරන කාර්යභාරය තවත් පැතිකඩකි. සිය අධ්‍යාපනය ලබන කාල සීමාව, කාර්යයාලයේ, පාසලේ, වැඩපොළේ නියමිත කාලසීමාව තුළ ඉටු කළ යුතු කාර්යභාරය ද වෙනසක් නොමැතිව සම ලෙස දරමින් ඉටු කරනු ලබයි. සිය අයිතිවාසිකම් ලැබිය යුතු ගරුත්වය, ප්‍රසංශා, සතුට ඇයට හිමි විය යුතුමය යන්න පිළිබඳ අපේක්ෂාවක් ද ඇය තුළ නැත. එමෙන්ම ඇය වෙත නැගෙන දහසක් චෝදනා ද වග විභාගයකින් තොරව සම සිතින් දරනු ලබයි. එවන් කාර්යභාරයක් ඉටු කරමින් විරියෙන් පෙරට ඇදෙන ඇය සකල දැනුමෙන් සන්නද්ධ කිරීම රටකට ප්‍රගතියක් නොවන්නේ කවර පැතිකඩකින් දැයි සිතා ගත නොහැක.

2024 කාන්තා සවිය සඟරාව ඇය පිළිබඳ ව නගන හඬ තුළින් යහපත් ප්‍රතිඵල ලැබේවා යි පතමි.

**කලාකීර්ති ගීතා සමන්මලී කුමාරසිංහ**
**රාජ්‍ය අමාත්‍ය**
**කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**



## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ පණිවුඩය

කුසලතාවන්ගෙන් පරිපූර්ණ වූ මිනිසුන් රටකට වටිනා සම්පත් වන අතර එවන් සම්පත් මෙලොවට තිළිණ කළ කාන්තාවන් ඒ සඳහා ඉටු කරනු ලැබූ යුග මෙහෙවර ද අපරිමිත ය.

හෙට දින සොඳුරු ලොවක් බිහි කිරීම උදෙසා ඇය සවිමත් වූයේ කෙසේ ද, ඇගේ භූමිකාවන් මොනවා ද, ඇගේ කැප කිරීම් කවරක් ද, යන්න අප අපගෙන්ම විමසා බැලිය යුතු ව ඇත. අප්‍රමාණ ඇගේ සේවාවන් අතර හඬක් නොනැගෙන මිලක් නොමැති සේවා කොපමණ තිබේ දැයි වැටහෙනු ඇත. කාන්තාව සතු නිවැරදි තීරණ ගැනීම, ගැටලු නිරාකරණය, ආත්ම අවබෝධය, සහකම්පනය, විචාරශීලී බුද්ධිය, නිර්මාණශීලීත්වය, රසවින්දනය වැනි සියුම් කුසලතාවන් මෙන්ම ශිල්පීය දැනුමෙන් ද පෝෂණය කිරීම රටකට සිදු කරනු ලබන ප්‍රබලම ආයෝජනයක් වනු ඇත.

එම ආයෝජනය වඩාත් ඵලදායී කරනු පිණිස, රසවින්දනය හා දැනුම එකිනෙකා අතර හුවමාරු කරගැනීමත්, එම නිර්මාණාත්මක ක්ෂේත්‍රයන් ඔස්සේ තම හැකියාවන් ඔපමට්ටම් කරගැනීමත් 'කාන්තා සවිය' සඟරාවේ අරමුණයි.

"ඇයට ශක්තිය දැයට ප්‍රගතිය" යන තේමාව යටතේ 2024 ජාත්‍යන්තර කාන්තා දිනය මුලික කොට ගෙන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් එළි දක්වනු ලබන කාන්තා සවිය සඟරාව ඇය දිරි ගැන්වීමට සහායක් වනු ඇතැයි විශ්වාස කරමි.

**යමුනා පෙරේරා**
**ලේකම්**
**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**



## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය

සියවස් ගණනාවක සිට කාන්තාවන් වෙනුවෙන් නැගෙන හඬ, නිහඬ හඬ දහසක් අර්ථකතනයන්ට බඳුන් වී ඇත. ඇය ඉටු කරනු ලබන අමිල සේවයට අගයක් දෙන්නට කෙතරම් වෙර වෑයම් දැරුව ද එය තවමත් නියමිත අගය වටහා නොගත් සේවාවකි. මවක, දියණියක, බිරිඳක, මිත්තණියක, ඥාතිවරියක ලෙස ඇයගේ කාර්යභාරයත් ශිෂ්‍යාවක, වෘත්තීයමය වශයෙන් කාර්යාලයේ වැඩපොලේ  කෙත්බිම් වැඩබිම් ආදී මෙකී නොකී තැන්වල ඇය ඉටුකරනු ලබන මිල කරනු ලබන කාර්යභාරයත් දිවා රාත්‍රී ඉටුකරනු ලබන අඛණ්ඩ සේවාවක් වැනි ය.

එබැවින් ඇය ආර්ථික සාමාජික හා උපදේශනාත්මක වශයෙන් සියලු අංශයෙන් දැනුවත් කිරීම යුග මෙහෙවරක් වී ඇත. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය දැයේ කාන්තාවන් වෙනුවෙන් පුදනු ලබන වැඩසටහන් මාලාවේ අරමුණ වන්නේ ඇය සකල දැනුමෙන් සම්පූර්ණ කිරීමයි. එය කාන්තාවක් ලෙස ඇය ලබන වටිනා ආභරණ ගොන්නකි. එකී ආභරණ තුළින් එළිය වන්නේ ඇය පමණක් නොවේ. ඇය සිය පවුල බබළවන අතරම එය රටක බැබළීමට හේතු වේ. මන්ද දැයට දිරියක් වන කාන්තාවන් තමාගෙන් ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳ මනා වගකීමක් දරන බැවිනි.

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය අඛණ්ඩව වසරකට වරක් ඉදිරිපත් කරනු ලබන කාන්තා සවිය සඟරාව සියලුම කාන්තාවන් වෙනුවෙන් පිදෙන උපහාරයකි. ඇය වෙනුවෙන් නැගිය යුතු හඬ අර්ථවත් කරන්නට දරනු ලැබූ වෑයම හෘදයාංගමව ඔබ වෙත පිරිනමමි.

**චම්පා උපසේන**
**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**


# සදන්නට සුන්දර ලොවක් කරමු ගැහැනිය ශක්තිමත්...

**එස්. ඒ. ඉරේෂා මධුවන්ති**
**ශිෂ්‍ය උපදේශක**
**වාණිජ හා මූල්‍ය කලමනාකරණ අධ්‍යයන පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

සමාජය තුළ පවත්නා කුඩාම සමාජ සංස්ථාව ලෙස පවුල් සංස්ථාව දැක්විය හැකිය. මෙකී පවුල් සංස්ථාව හරහා නියෝජනය වන කාන්තා නියෝජන මුළු මහත් සමාජය පුරාම ව්‍යාප්තව පවතින අතර සමාජයේ ප්‍රබලතම ගාමක බලවේගයක් ලෙසින් කාන්තා ක්‍රියාකාරීත්වය හඳුන්වා දීම යුක්ති සහගතය.

මන්දයත් හිරුටත් පෙර පිබිද සියලු වැඩ අහවර කොට පවුලේ සාමාජිකයන්ගේ ගමන් මගට ඇවැසි ශක්තිය ලබා දෙමින් සියල්ලන්ටම පසුව නිදාගත් එකම තැනැත්තිය කාන්තාව යි. වත්මනයේ කාන්තාව නම් වචනය සමඟ බද්ධව ඇසෙන අනෙක් වචන කිහිපය ලෙස "කාන්තා හිංසනය", "ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය" යන වචන කිහිපය පෙන්වාදිය හැකිය. වර්තමාන සමාජය තුළ කාන්තාව නොයෙකුත් ආකාරයේ හිංසනයන්ට සහ පීඩනයන්ට මෙන්ම තමා ජීවත්වන කුටුම්භය තුළද විවිධ පීඩනයන්ට මුහුණදෙනු ලබයි.

මෙවන් තත්ත්වයක් තුළ සමාජය විවිධ වු පාර්ශ්වයන් මේ පිළිබඳ විවිධ අදහස් උදහස් ඉදිරිපත් කරමින් සමාජය තුළ කතිකාවත් නිර්මාණය කරනු ලබමින් පවතී. මෙකී තත්ත්වයක් තුළ කාන්තාව මුහුණ දෙනු ලබන හිංසනමය අවස්ථාවන් සහ තම ගෘහය තුළ මුහුණ දෙනු ලබන ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් පිළිබඳ ගවේෂණාත්මකව සොයා බැලීම සමාජය තුළ පවත්නා කාලීන අවශ්‍යතාවයක් බව මනාව පැහැදිලි වේ.



විවාහය පදනම් සාධකය කරගනිමින් පවුල නිර්මාණය වේ. එතැන් පටන් දරුවන් හදා වඩා ගනිමින් සමාජය සමඟ අන්තර් සම්බන්ධතා පවත්නා පවුල් ඒකකය සමාජය තුළ පිළිගැනීමට ලක්වේ. කාන්තාව සැමියාට

බිරිඳක් වන අතර දරුවන්ට මවක් ද වන අතර පවුලේ මූලික පදනම් සාධකය ඇයයි. නමුදු මෙකී කාන්තාව තමා විසින් නිර්මාණය කරනු ලැබූ පවුල් ඒකකය තුළින් කායික, මානසික මෙන්ම වාචිකව විවිධ වූ හිංසනයන්ගෙන් යුත් පීඩාකාරී ප්‍රචණ්ඩ තත්ත්වයන්ට ගොදුරුවන අතරම සමාජය හමුවේද එවන් අගතිගාමීත්වයන්ට පත්වනු දැක ගත හැකිය.

පවුල තුළින් සිදුවනු ලබන කාන්තා හිංසනය හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව විමසීමේදී අවස්ථා රාශියක් යටතේ ඇය මෙකී ඛේදවාචකයට ගොදුරු වන බව පැහැදිලිය. බීමත් සැමියා විසින් විවිධ අඩත්තේට්ටම්වලට ලක් කිරීම සැමියා විසින් ලිංගිකමය වශයෙන් පීඩාවන්ට ගොදුරු කිරීම, කුඩා දරුවන් රැකබලා ගැනීමේදී හා දරුවන් ලොකු මහත් වූ පසු ඔවුන්ගේ අවශ්‍යතා පූර්ණය කිරීමේ දී ඇතිවන පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ දීම, නැන්දම්මා ලේලි ගැටුම් ආර්ථිකමය වශයෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් විවාහයට පෙර ලැබුණු ආදරය සහ ගෞරවය විවාහයෙන් පසු නොලැබීමෙන් ඇතිවන ඉච්ඡාභංගත්වය ආදිය මගින් සමාජය තුළ කාන්තාව හිංසනයටත් ගෘහස්ථ ප්‍රචණ්ඩයත්වයටත් නිරන්තරයෙන් ලක්වන බව පැහැදිලි වේ.

මේ තුළ ඇති සුවිශේෂී බව වන්නේ පවුල තුළින් ඇය කෙරෙහි ඇතිවනු ලබන හිංසනය සහ ප්‍රචණ්ඩත්වය පසුව සමාජය තුළට ද විසරණය වීමයි. ඉහත දක්වනු ලබන අවස්ථා යටතේ කාන්තාව හිංසනයට සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත්වන අතර එකී අවස්ථාවන් සියුම්ව පරීක්ෂා කර බැලීමේදී සමාජයේ නෙත නොගැටුණු තත්ත්වයන් යටතේ ද කාන්තාව හිංසනයටත් ප්‍රචණ්ඩත්වයටත් ගොදුරු වන බව පැහැදිලි වේ.

බීමත් සැමියා විසින් ම විවිධ අඩත්තේට්ටම්වලට ලක් කිරීම තුළ විඳින දැඩි කායික හා මානසික පීඩාව වර්තමාන සමාජගත පවුල තුළ ඇති ප්‍රබල ඛේදවාචකයෙකි. ප්‍රේම සබඳතාවක් මත හෝ යෝජිත විවාහයකින් තමන් විවාහ කර ගන්නා සහකරුගෙන් කිසි දිනක බීමත් හැසිරීම් රටාවක් බලාපොරොත්තු නොවේ. එසේම තම සහකරුවා ගෙන යනු ලබන සංවරශීලී ප්‍රතිරූපය එකවර විවාහයෙන් පසු බේබද්දෙකු දාමරිකයෙකු බවට පරිවර්තනය වේ. එසේම කාන්තාව දැඩි චිත්ත සන්තාපයට පත්වීමත් සමග කායිකවත් මානසිකවත් සබඳතා පැවැත්වීම ප්‍රතික්ෂේප කිරීමත් සමග බොහෝ අවස්ථාවල පහර කෑමට ලක්වේ. ඇතැම් අවස්ථාවලද සැමියාගේ බලවත් පෙරැත්ත මත මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වූ කාන්තාවන්ද දක්නට ලැබේ. බීමත් සැමියා නිරන්තරයෙන් බිරිඳ සමඟ අඩදබර කරනු ලබන්නේ තමාගේ ප්‍රබල ඒකාධිපති අවශ්‍යතාවයන් මත පිහිටාය.

වරෙක එය ආහාරමය අවශ්‍යතාවයක් විය හැකිය. වරෙක එය ලිංගික අවශ්‍යතාවයක් විය හැකිය. මෙවන් තත්ත්වයක් තුළ විවාහ සංස්ථාවේ බිරිඳ කායිකවත් මානසිකවත් දූෂණය වීම වේ. බීමත් සැමියා බොහෝ විට පහර දෙනු ලබන්නේ තම දරුවන් ඉදිරිපිටදීය. මෙය දකින ගැහැනු දරුවාගේ මනස තුළ තම පියා පිළිබඳ සෘණාත්මක වෛර සහගත සිතිවිල්ලක් මනසේ ඇතිවේ. පසුකාලීනව එම දියණියන්ට විවාහය පිළිබඳ ඇති වන්නේ සෘණාත්මක ආකල්පයකි. එම නිසා දරුවන් නිසි වයසේ දී විවාහ කරදීම මව හා පියා සතු ප්‍රබල වගකීමකි.

සැමියාගේ දැඩි බීමත්කම හේතුවෙන් පවුලේ ආර්ථික ශක්තිය දැඩි පිරිහීමකට ලක්වේ. බීමත්කම තුළින් බිරිඳට ලැබෙන පීඩනය දරා ගත නොහැකි වීම තුළ දික් කසාද වීම, අනියම් සබඳතා පැවැත්වීමට යෑම, ගණිකා වෘත්තිය සිදුකිරීම වැනි අගතිගාමී වෘත්තියන්ට පවා යොමුවීමට ඇයට සිදු වේ. පවුලේ සමගිය බිඳුණ විටදී හා දික්කසාදයට ලක් වූ ගැහැණියක් ලෙස සමාජයේ ගොදුරු ඇස ඇය වෙත යොමු වේ. අවසානයේ සමාජයේ අපහාසයට හා ගර්හාවයට ලක්වන්නේ ද කාන්තාවයි.

හිංසනයට හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වයට පත්වනු ලබන ප්‍රබලතම අවස්තාවක් ලෙස සැලකිය හැක්කේ සැමියා විසින් ඇති කරනු ලබන ලිංගික හිංසාපිඩා සහ විකෘතිකාමාශා තෘප්ත කර ගැනිමට දරන ප්‍රයත්නයයි. විවාහය තුළ ලිංගික සබඳතාවක් අර්ථාන්විත වන්නේ දෙදෙනාගේම කැමැත්තෙන් සිදු වන කායික මානසික ක්‍රියාවලියක් ලෙසිනි. විවාහයට පෙර ප්‍රේම සබඳතාවයක් පවත්වන පෙම්වතෙකු සහ පෙම්වතියක යෝජිත විවාහක යුවලකට වඩා එකිනෙකා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරිම බහුලය.

යෝජිත විවාහයකදී දෙදෙනා හමුවන්නේ අවස්ථා කීපයකදී පමණි. විවාහයෙන් පසුව කාන්තාව ඇතැම් විට නිදියහන තුළදී ලිංගිකමය වශයෙන් හිංසා පීඩා තත්ත්වයන්ට හා විවිධ විකෘතිකාමාශා තත්ත්වයන්ට සැමියා හරහා ගොදුරු වේ. මේ සියලු කාරණා දරා ගත නොහැකි වූ තැන කාන්තාව දික්කසාදයට යොමුවේ. එහි සැබෑ තත්ත්වය නොදත් ඥාති හිතමිත්‍රාදීන් සහිත සමාජයේ චෝදනා කරනු ලබන්නේ බිරිඳගේ පාර්ශ්වයටය. දැඩිව නිල් චිත්‍රපට, අසභ්‍ය වීඩියෝ දර්ශන හරහා විකෘති මනසක් ඇතිකොටගෙන එවන් ක්‍රියාකාරකම් තම බිරිඳ සමඟ අනුකරණයට යෑම තුළින් ඇය දැඩි මානසික හා කායික පීඩාකාරී තත්ත්වයන්ට පත්වෙයි. එය ප්‍රතික්ෂේප කළ විට සපා කෑම, පහර දීම, පිලිස්සීම ආදිය සැමියා විසින් සිදු කරනු ලබයි. විකෘතිකාමාශාවන් සහිත සැමියන් තම බිරිඳ නිදියහන තුළ මිතුරන්ට විකිණීම, මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවීමද විකෘතිකාමාශාව ඇති කිරීමටත්, ලිංගික බෙලහීනතාවය ඇති කැරලීමටත් දෙයාකාරයෙන්ම බලපායි. මේ දෙයාකාරයෙන්ම කාන්තාවට ඇති කරනු ලබන්නේ හිංසාකාරී පීඩාකාරී හැඟීමක් පමණි.

දරුවෙකු පිළිසිඳගත් තැන සිට දරුවෙකු හදා වඩා ගැනීම දක්වා සමස්ත ක්‍රියාදාමය කාන්තාවගේ මූලිකත්වයෙන් සිදුවේ. ඇතැම් විට තම ස්වාමියාගේ සහයෝගයක් නොමැතිව එය තනිව කරට ගනිමින් සිදුකරනු ලැබේ. මේ තුළ ඇතිවන ආතතිය හරහා ඇයගේ බාහිර රූපය පවා විකෘති තත්ත්වයට පත්වේ. මෙම වෙනස්වීම දරා ගත නොහැකි වුවොත් ඔහු අනියම් බිරිඳක් වෙත යාම තුළින් බිරිඳ තවත් අපහසුතත්ත්වයන්ට පත් වේ. දරුවන් සිටින නිසා ස්වාධීන ඍජු තීරණ ගැනිමටද ඇයට නොහැකි වේ. එවන් තත්ත්වයක් තුළ බිරිඳ දරුවන් වෙනුවෙන් ජීවත්වන මවක් ලෙසින් ඉදිරි ගමනට මුහුණ දෙමින් දරුවන්ගේ අධ්‍යාපන සහ විවාහ අවශ්‍යතාවයන් පූර්ණ කිරීමට කැපවනු ලැබේ. ගැහැණු දරුවෙකු හිතුවක්කාර විවාහයකට යොමු වීම තුළ සැමියා ඇතුළු සමස්ත සමාජයේ චෝදනාව එල්ල වන්නේ බිරිඳ වෙතයි. මවක් ලෙස නිවැරදිව දියණියන් හැදුවේ නැහැ යන චෝදනාව ඇයට එල්ල වෙයි. ඇතැම් විට දියණිය මෙවන් තත්ත්වයකට යොමු වූයේ පියාගේ බීමත්කම

හෝ පවුලේ දරිද්‍රතාවය තුළින් ඇතිවනු ලබන පීඩනය නිසා විය හැකිය. අවසානයේදී වැරදිකරුවා වන්නේ මවයි. කාන්තාවට පමණක් චෝදනාව දිගු කොට සමාජයේ නිහඬ වීම තුළ කාන්තා හිංසනයට හා ගෘහස්ථ ප්‍රචණ්ඩතවය් සමාජයේ දරුණු පිළිලයක් බවට පත්වෙමින් පවතී.

වත්මන් සමාජයේ විවාහක බිරිඳට ඇති ප්‍රබලතම අභියෝගයක් ලෙස විවාහයෙන් පසු මවක් වීම යන්න බලපායි. වර්තමාන සංකීර්ණ සමාජයේ ආහාරවල සංයුතිය වෙනස් වීම ආදී විවිධ කරුණු කාරාණා  හේතුවෙන් බොහෝ විවාහක කාන්තාවන් නිර්දාරකාභාවයට පත්වීම දැක්විය හැකිය. විවාහයෙන් පසු තම පවුලේ ආදරය සහ රැකවරණය ස්ථිර වශයෙන් ලබා ගැනීම සඳහා විවාහක බිරිඳකට විවාහක සැමියාට ජාතකව දරුවන් බිහිකළ යුතුය. එය අපොහොසත් වූ විට ඇය "වඳ ගැහැණියක්" යන සංකල්පය හරහා පවුලේ සාමාජිකයන්ගෙන් පළමුවත් සමාජයෙන් දෙවනුවත් ඇය හංවඩු ගසනු ලබයි.

එසේම පූර්ව වෛවාහක ලිංගික සබඳතාවල යෙදීම නිසා නොදැනුවත්කම නිසා ගැබ් ගැනීමට ලක් වූ අවස්ථාවල එයට මුහුණ දීමට නොහැකි වූ තැන නීත්‍යානුකූල නොවන ගබ්සා සිදුකිරීම පසුකාලීනව ඇයට දරුවන් අහිමිවීමේ තත්ත්වයන් ඇති වේ. එසේම ඇතැම් විට අදාළ ගබ්සා කඩවල සිටින වෛද්‍යවරු යැයි කියන තිරිසනුන් සමඟ ඇයට යහන්ගත වීමට ද සිදුවන වාර ද අනන්තය. මේ සියල්ල ඇය තනිව විඳ දරා ගනිමින් මානසිකව, කායික මෙන්ම වාචිකව දැඩි පීඩනයකට ලක්වේ. නිර්දාරකභාවයේ දැඩි පීඩනයත් හිංසනයත් අවසන දික්කාසාදයකින් කෙළවර විය හැකිය. තවද නැන්දම්මා හා ලේලි අතර පවතින ඝට්ටනයද වර්තමානයේ දික්කසාදයට හේතු පාදක වන කරුණක් බවට පත්වේ. ලාංකීය ජන සමාජයේ විවාහ සංස්ථාව තුළ පිතෘ මූලික ගමන් මගක් පෙන්වනු ලබයි. බොහෝ විට තීරණ ගනු ලබන්නේ ස්වාමි පුරුෂයාගේ පාර්ශවයයි. එය සාමාජීය, සංස්කෘතික වශයෙන්ද එම තත්ත්වය ලබා දී ඇත. නමුත් සිදුවිය යුත්තේ ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනගෙම අදහස් ක්‍රියාත්මක කිරීමයි.

නමුත් බොහෝවිට සිදුවන්නේ ඊට හාත්පසින්ම වෙනස් වූ කරුණකි. ඇතැම් පවුල් සංස්ථාවල විවාහයේ සිටම සියලු තීන්දු තීරණ ගනු ලබන්නේ ස්වාමිපුරුෂයා විසිනි. එපමණක් නොව සියලු කායික හා මානසික සම්බන්ධතා පැවැත්වීම පුරුෂයාගේ අණසකට යටත්ව කළ යුතුය. දරුවන් හදා වඩා ගත යුත්තේ ද ස්වාමියාට අවැසි පරිදිය.

මෙවැනි තත්ත්වයක් තුළ බිරිඳට යාන්ත්‍රීකරණයට ලක්ව ඉමහත් චිත්ත පීඩාවෙන් යුතුව කල්ගත කිරීමට සිදුවෙයි. ලාංකීය ජන සමාජය තුළ අදවන විට පවා පවුල තුළ ගැහැණු දරුවෙකු ඉපදුනු විට පළමුව පියා හා මව යටතේද, පසුව විවාහපත් වූ පසු සැමියා යටතේද, සැමියා මිය ගියහොත් වැඩිමහල් පිරිමි දරුවන් යටතේද ජීවත්වීමට සිදුවන අවස්ථා සමාජයේ සුලභය.

මේ තත්ත්වය තුළ ඇයගේ සිතුම් පැතුම් හැඟීම් නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවේ.

සමාජය තුළ කාන්තාව සම්බන්ධයෙන් පවත්නා දැක්ම වන්නේ ළඳ බොලඳ මටසිලිටු අදහස් උදහස් ඇති සුන්දර තැනැත්තියක් ලෙසිනි. නමුදු මටසිලිටු ශක්තියට නොදෙවැනි ශක්තින් සමුදායක් ඇය තුල පවතී. ඇය සැමියාගෙන් මෙන්ම සමාජයේ සියලු පාර්ශවයන් වෙතින් ආදරය, රැකවරණය නිරන්තරයෙන් බලාපොරොත්තු වේ. විවාහයට පෙර තම පෙම්වතාගේ ආදරය, රැකවරණය, ගෞරවය ලද ඇය විවාහ දිවියට ඇතුලත්ව කෙටි කලක් ගතවෙත්ම පෙර වු ආදරය, රැකවරණය, ගෞරවය ක්‍රමානුකූලව අඩුවන අවස්ථා දැකිය හැකිය.

කාන්තා හිංසනය හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ විමසීමේදී එයට බලපානු ලබන හේතු කාරාණා පුරුක් දාමයක් මෙන් එකිනෙකට සම්බන්ධව පවතින බව පැහැදිලිය. කාන්තාවගේ ශ්‍රමදායකත්වය ජාතික සංවර්ධනයට යොදා ගැනිමේදී නිවැරුදිව ගණනය කිරීමට නොහැකි වන්නේ උදෑසන අවදි වු තැන සිට රාත්‍රි නින්දට යන තුරාම ඇයගේ දායකත්වය නොමසුරුවම ලැබෙන හෙයිනි. කාන්තාව නිවසේ සියලු වැඩ කටයුතු සමබරව පවත්වා ගනිමින් සැමියා, දරුවන්, ඥාති හිතමිත්‍රාදින් පිළිබඳ ආත්මාර්ථකාමීත්වයෙන් තොරව පරාර්ථකාමී මැදිහත් සිතින් සියල්ලන් පිලිබඳ සොයා බලන එකම තැනැත්තිය වනු ඇත. කාන්තාවට සමාජයෙන් ලැබිය යුත්තේ සම තැන නොව නිසි තැනය.

කාන්තා හිංසනය හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ අවධානය කොට ඇයට ආදරය, රැකවරණය, ගෞරවය ලබා දෙමින් කාන්තාවගේ විවාහ ජීවිතය විඳින ජීවිතයක් බවට පත් කරලීමේ උදාරතර වගකීම හා යුතුකම සමස්ත සමාජයේ කරමත පැටවී ඇති බව අවධාරණය කළ යුතුය.



# කාන්තා කාර්ය සංවිධානතුළින් සමානාත්මතත්වයෙන් පිරි සමාජයක්

**සුමේධ වීරසේකර**
**කාන්තා සංවර්ධන කටයුතු පිළිබඳ විශේෂඥ**
**"කාන්තාවන් ව්‍යවසායකත්වය නායකත්වය හා ජාලකරණය මගින් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ JICA ව්‍යාපෘතිය"**

කාන්තා කාර්ය සංවිධානයක් යනු ආගම්, පංති, කුල, දේශපාලන හෝ වෙනත් කවර හෝ සමාජ විෂමතාවකින් තොරව අවුරුදු 18 ට වැඩි ඕනෑම කාන්තාවන් පිරිසක් එක් රැස් කර ගොඩනගාගන්නා සංවිධානයයි. ආර්ථික, සමාජ, සංස්කෘතික, සුභසාධනය ඇතුළු සමාජමය මෙහෙවරක් සඳහා මෙම කාන්තා කාර්ය සංවිධාන බිහි කළ හැක. හුදෙකලා බව තුරන් කිරීම, දැනුවත් කිරීම, දැනුම හුවමාරු කරගැනීම, ගැටළු සාකච්ඡා කිරීම තම සතුට හා ශෝකය බෙදා ගැනීම,සමාජ හරයන් හා සාරධර්ම රැකගැනීම ආදී විවිධ ක්ෂේත්‍රයන් තුළ සිය දායකත්වයට මෙම සංවිධාන ඉවහල් වේ. මේවා කාන්තා සමිති යනුවෙන්ද හැඳින්වේ. (කාන්තා කාර්ය සංවිධාන පිහිටුවීම හා පවත්වා ගෙන යාම-ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ පොත් පිංච-පිටු අංක 1) ඉහත ප්‍රකාශනයෙන් කැපී පෙනෙනුයේ කාන්තා කාර්ය සංවිධාන යනු අප සමාජයේ පිරිමි පාර්ශ්වයම මෙන්ම කාන්තාවන්ටද සමාන අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා මහත් අභිරුචියෙන් හා කැපවීමෙන් ක්‍රියා කරන සංවිධානයක් බවයි.

එහෙත් සැබෑ ලෙස ඔවුන් තුළ එකී ආර්ථික, සමාජ, සංස්කෘතික, සුභසාධනය ඇතුළු සමාජමය මෙහෙවරක් සඳහා ඔවුනට අවස්ථාව උදා වී තිබේද යන්න සොයා බැලීම වටියි.

### 1. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යනු කවරේද ?

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මගින් කාන්තාවන්ට සහ පිරිමින්ට පූර්ණ සමානාත්මතාවය සහ සාධාරණ ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වන පරිදි කොන්දේසි සහ අවස්ථා නිර්මාණය කිරීම අරමුණු කරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ හරය අත්විඳීමට මූලධර්ම දෙකක් ඇත. එනම්, සාධාරණත්වය සහ අපක්ෂපාතීත්වයයි. සාධාරණත්වය යනු පක්ෂග්‍රාහී හෝ අගතියෙන් තොරව සාධාරණ ලෙස සැලකීම සමඟ සම්බන්ධ වන අතර අපක්ෂපාතීත්වය යනු සියලු පාර්ශ්වයන්ට සමානව සැලකීම ලෙස අර්ථ දැක්වේ. සමානාත්මතාවය, එහි සරලම වචන වලින් අදහස් කරන්නේ ඔවුන් සිටින ප්‍රජාවන් හමුවීම සහ සියලු ප්‍රජා සාමාජිකයින් සඳහා සමාන ප්‍රතිඵල නිර්මාණය කිරීමට අවශ්‍ය පරිදි සම්පත් සහ අවස්ථා

වෙන් කිරීම මෙමගින් පැහැදිලි කෙරේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ විවිධ ආයතනය විසින් නිර්වචනය කරන ලද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වඩා උචිත බව පෙනේ.

කාන්තාවන්, පිරිමින් සහ සියලුම ලිංගභේදයන් අතර ප්‍රතිලාභ සහ වගකීම් බෙදා හැරීමේ සාධාරණත්වය සහ යුක්තිය සැපයීමයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැදගත් වන්නේ, ඓතිහාසික වශයෙන්, ලොව පුරා සමාජයන්වල කාන්තාවන්, සංක්‍රාන්ති ලිංගිකයන් සහ ද්විමය නොවන පුද්ගලයින් පිරිමින්ට වඩා "දුර්වල" හෝ අඩු වැදගත්කමක් ලෙස සලකන බැවිනි.

අද, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය රැකියාවේදී, නිවසේ සහ සමාජයේ පිරිමින්, කාන්තාවන් සහ සියලුම ලිංගභේදයන්ගේ භූමිකාවන් සහ අපේක්ෂාවන් හැඩගැස්වීමට සහ වෙනස් කිරීමට උපකාරී වී ඇත. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලුම මිනිසුන් ඔවුන්ගේ දක්ෂතා, කුසලතා සහ හැකියාවන් සඳහා පිළිගත් විට අපගේ ලෝකය වඩා හොඳ තැනක් වේ. (උපුටා ගන්නා ලදී - unitedwaynca.org/blog/what-is-gender-equity)

**2. අපගේ අභිලාශය**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවි බලගැන්වීම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රජයේ හා සංවර්ධනය සඳහා ක්‍රියා කරන ආයතන වල මෙන්ම සියලුම කාන්තාවන්ගේ ඒකායන අභිලාශය වනුයේ කාන්තාවන් පිරිමින් හා සමතත්වයෙහි ලා සැලකීමයි. සැබෑ ලෙසම ඔවුන් තුළ හෝ මෙම සමාජය තුළ එවන් පසුබිමක් නිර්මාණය වී ඇත්දැයි සිතන විට තවමත් අපට සැක හා බිය ඇතිවේ.

තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව, ගැහැනු ළමයින්ට සහ කාන්තාවන්ට ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට ලෝකයට ඉතිරිව ඇත්තේ වසර හතක් පමණක් වන අතර එක්සත් ජාතීන්ගේ කාන්තා සහ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු අංශයේ නව වාර්තාවක් මගින් ගෝලීය ස්ත්‍රී පුරුෂ භාවය සඳහා ඉතිරිව ඇති විශාලතම අභියෝග ඉස්මතු කරයි. එනම්,ලොව තුළ කාන්තාවට ඇති පිළිගැනීම හා පත්ව ඇති තත්වය මෙහි කදිමට විදහා පායි. එකී තිරසාර සංවර්ධන ඉලක්ක අතර ,

**i. නායකත්වයේ කාන්තාවන් නොමැතිකම**

පාර්ලිමේන්තු ආසනවලින් සියයට 27ක්, පළාත් පාලන ආයතනවලින් සියයට 36ක් සහ කළමනාකරණ තනතුරුවලින් සියයට 28ක් පමණක් කාන්තාවන්ට හිමිව ඇති බැවින්, තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි විවිධ දෘෂ්ටිකෝණයන් නොමැතිකම, පුළුල් ප්‍රතිපත්ති සම්පාදනයට බාධාවක් වේ.

## ii. දිළිඳුකම සහ ආර්ථික අවස්ථා නොමැතිකම

2030 වන විට මිලියන 340 කට වැඩි කාන්තාවන් සහ ගැහැනු ළමයින් අන්ත දරිද්‍රතාවයේ ජීවත් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙය දිනකට USD 2.15 ට වඩා අඩු ආදායමක් ලබන ගෝලීය කාන්තා ජනගහනයෙන් සියයට 8 ක විස්මයජනක ප්‍රතිශතයක් නියෝජනය කරයි. දරිද්‍රතාවයෙන් මිදීමට මාර්ගයක් සැපයීම සඳහා සමාජ ආරක්ෂණ, යහපත් රැකියාවකට ප්‍රවේශය සහ වෙනත් ආධාරක පද්ධති වහා අවශ්‍යය වේ.

## iii. රැකියා ස්ථානයේ වෙනස්කම් කිරීම සහ අසමානතා

වැඩ කරන වයසේ සිටින කාන්තාවන්ගෙන් සියයට 61 ක් පමණක් ශ්‍රම බලකායට සහභාගී වන අතර, එම වයසේ සිටින පිරිමින්ට සාපේක්ෂව සියයට 91ක් වේ. මෙය ආර්ථික වර්ධනයට මෙන්ම සමාජ ප්‍රගතියට ද බලපායි. එමෙන්ම එය , ශ්‍රම ආදායමෙන් උපයන සෑම ඩොලරයක් සඳහාම, කාන්තාවන් උපයා ඇත්තේ ශත 51 ක් පමණි.

## iv. නොගෙවූ රැකවරණ කාර්යයේ අසමතුලිතතාවයක්

වත්මන් ගමන් පථය අනුව, කාන්තාවන් සහ පිරිමින් විසින් නොගෙවූ රැකවරණය සඳහා ගත කරන කාලය අතර පරතරය සුළු වශයෙන් අඩු වනු ඇත, නමුත් 2050 වන විට ගෝලීය වශයෙන් කාන්තාවන් තවමත් පිරිමින්ට වඩා සියයට 9.5කින් (දිනකට පැය 2/3ක්) වැඩි කාලයක් ගෙවනු ඇත. මෙම නොනවතින පරතරය අධ්‍යාපනය, රැකියා සහ වෙනත් අවස්ථා සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය සීමා කරයි.

## v. සමාජ සම්මතයන් සහ සංස්කෘතික භාවිතයන්

ළමා විවාහ, ස්ත්‍රී ලිංග ඡේදනය වැනි හානිකර ක්‍රියා දිගටම පවතී. ගෝලීය වශයෙන්, තරුණ කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙකු වයස අවුරුදු 18 ට පෙර විවාහ වී ඇත. ළමා විවාහ බහුල වීම ආකල්පමය මාරුවීම් සහ කාන්තාවන්ගේ සහ ගැහැනු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන නීතිමය රාමු ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි.

## vi. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිකම

ඇස්තමේන්තු කර ඇති පරිදි 2030 වන විට මිලියන 110ක ගැහැනු ළමුන් සහ තරුණියන් පාසලෙන් බැහැරව සිටිය හැක. මාතෘ මරණ අඩු කිරීමේ සහ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ ඇනහිට ඇති ප්‍රගතිය 2030 ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉලක්කගත මැදිහත්වීම් ඉල්ලා සිටී.

## vii. ආහාර අනාරක්ෂිත බව

2030 වන විට කාන්තාවන් සහ ගැහැනු ළමයින්ගෙන් සියයට 24 කට ආසන්න ප්‍රමාණයක් මධ්‍යස්ථ හා දැඩි ආහාර අනාරක්ෂිතභාවයක් අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉඩම් සහ සම්පත් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම මගින් ආහාර හා කෘෂිකාර්මික පද්ධතිවල කාන්තාවන් සවිබල ගැන්වීම ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික වර්ධනය සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ.

## viii. කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට එරෙහි හිංසනය

සෑම වසරකම මිලියන 245 ක් කාන්තාවන් සහ ගැහැනු ළමයින් සමීප සහකරුවෙකු විසින් කායික සහ/හෝ ලිංගික හිංසනය අත්විඳිති. වැඩිහිටි කාන්තාවන් ද වැඩිහිටි පිරිමින්ට වඩා දරිද්‍රතාවයේ සහ ප්‍රචණ්ඩත්වයේ ඉහළ අනුපාතවලට මුහුණ දෙයි.

## ix. ස්ත්‍රී පුරුෂ සමානාත්මතා මුල පිරීම් සඳහා ප්‍රමාණවත් අරමුදල් නොලැබීම

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා වෙන්කර ඇත්තේ සමස්ත ද්විපාර්ශ්වික ආධාරවලින් සියයට 4ක් පමණි. 2030 වන විට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍යය අතිරේක ආයෝජනය වසරකට ඩොලර් බිලියන 360ක් ලෙස ගණන් බලා ඇත.

## x. නීතිමය බාධක සහ දුර්වල ලෙස බලාත්මක කරන ලද නීති

අවම වශයෙන් රටවල් 28 ක කාන්තාවන්ට විවාහයට ඇතුළු වීමට සහ දික්කසාද වීමට සමාන අයිතිවාසිකම් ලබා දෙන නීති නොමැති අතර රටවල් 67 ක කාන්තාවන්ට සෘජු හා වක්‍ර වෙනස්කම් කිරීම තහනම් කරන නීති නොමැත. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය පවතින විට, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අභියෝගයක්ව පවතී.

## xi. පිරිසිදු බලශක්තිය සහ සනීපාරක්ෂාව සඳහා පවේශය නොමැතිකම

ඇස්තමේන්තු කර ඇති පරිදි 2030 වන විට මිලියන 341 ක කාන්තාවන් සහ ගැහැනු ළමයින්ට විදුලිය හිඟ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. විශ්වීය ප්‍රවේශය දරිද්‍රතාවය සැලකිය යුතු ලෙස අඩු කර කාන්තා සෞඛ්‍යය වැඩි දියුණු කළ හැකිය.

2030 ඉලක්ක සපුරා ගැනීමට වසර හතක් පමණක් ඉතිරිව තිබියදී, සාමූහික උත්සාහයන්

සහ අරමුදල් වෙන කවරදාටත් වඩා අවශ්‍ය වේ. ඉදිරියට යන සෑම පියවරක්ම, කෙතරම් වර්ධක වුවද, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හුදෙක් ඉලක්කයක් නොව යථාර්ථයක් වන අනාගතයකට අපව සමීප කරයි.

**3. කාන්තාවගේ සමාජ ආර්ථික තත්වය සතුට හා අභිමානය ගොඩ නැගීම සඳහා කාන්තා කාර්ය සංවිධාන වලට ඇති විභවතාවය පිලිබඳ සොයා බලමු.**

ශ්‍රී ලංකා කාන්තා කාර්යයාංශයට අනුව එම කාර්යයාංශය යටතේ ලියාපදිංචි කාන්තා කාර්ය සංවිධාන ප්‍රමාණය 12,700 කට වඩා වැඩිවේ.එක් එක් ග්‍රාම සේවා වසම් මට්ටමේ පිහිටුවා ඇති මෙම කාන්තා කාර්ය සංවිධාන ඉහත දැක්වූ කාන්තා ස්වාභිමානය උදෙසා ක්‍රියාකරනු ලබයි.එසේ වුවත් එම අභිමතාර්ථ ලගා කරගැනීම සඳහා කාන්තා කාර්ය සංවිධාන ක්‍රියාකල යුත්තේ කෙසේදැයි තරමක් සොයා බැලීම අගනේය.

කාන්තා කාර්ය සංවිධාන ක්‍රියාකාරකම් සිදුවන ග්‍රාමසේවා වසම් තුල විශාල ප්‍රමාණයක් සිවිල් සංවිධාන ක්‍රියාත්මක වේ. උදාහරණ ලෙස ගොවි සංවිධාන, විවිධ ණය දෙන සමිති, සමුපාකාර සමිති, ප්‍රජා මූල සංවිධාන, සමෘද්ධි සමිති, තුරුසවිය රබර් සමිති,කුඩා තේවතු සංවර්ධන සමිති, සුභ සාධන සමිති, වැඩිහිටි සමිති ආදී එකී සමිති විවිධ අරමුණු උදෙසා ක්‍රියාත්මක වේ. මෙම කාන්තා කාර්ය සමිති ක්‍රියාත්මක කිරීමේ කාර්යයේදී ඇතැම් විට එකී සමිති, ඔවුනට අභියෝගයක්ව පවතී.

මෙම සමිතිවල ක්‍රියාකාරිත්වය එකම ප්‍රජාවක් ඉලක්ක කොට ක්‍රියාත්මක වීම නිසා කාන්තා කාර්ය සංවිධාන කටයුතු කැපී පෙනීම සඳහා යම් බලපෑමක් ඇති වී ඇති බව පෙනේ. එමෙන්ම බොහෝ සමිති ආර්ථික කටයුතු සඳහා ප්‍රමුකත්වය ලබා දී ඇති නිසා සමාජ සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය කටයුතු කිරීම අභියෝගයක්ව පවතියි. උදාහරණයක් ලෙස කාන්තාවන් මුහුණ දෙන සමාජමය ගැටළු විසඳීම හෝ ඒවාට මැදිහත් වීම නිසා ඇතැම් විට කාන්තා සංවිධාන අනෙකුත්



සමිති ක්‍රියාකාරිත්වය තුල, ආකර්ශණීය බැවින් තොර බවක් දිස් වීම දක්නට ලැබේ. මේ නිසා ඇතැම් කාන්තා කාර්ය සමිති චක්‍රීය අරමුදල් නිකුත් කිරීම වැනි උපාය මාර්ග වලට යොමු වී ඇත.කෙසේ වුවත් කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය හා ක්‍රියාකාරී සංවිධාන බවට පත් කර ගැනීමට මුළු මහත් ප්‍රජාවගේත්, සංවර්ධනය සදහා ක්‍රියා කරන රාජ්‍ය,ජාත්‍යනතර ආයතන හා රාජ්‍ය නොවන ආයතනවලට ප්‍රධාන වගකීමක් බවට පත්ව තිබේ.

**4. ක්‍රියාකාරී සැලසුම් තුලින් කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය කරන්නේ කෙසේද?**

ඉතා ප්‍රසිද්ධ කියමනකින් ප්‍රකාශ වන්නේ "අරමුණකින් තොර ක්‍රියාකාරම් නිශ්ප්‍රයෝජන උත්සාහයක් වන බවත් ක්‍රියාකාරකම් නැති අරමුණ නපුරු සිහිනයක් " හා සමානයි වන බවත්ය. ඒ නිසා කාන්තා කාර්ය සංවිධාන සඳහා නිශ්චිත අරමුණක් තිබේ.එකී අරමුණු ලඟා කරගැනීමට ප්‍රයෝගික හා ප්‍රශස්ථ මට්ටමේ ක්‍රියාකාරකම් අවශ්‍ය වේ.උදාහරණ ලෙස

**අ) කාන්තාවන්ගේ ශාරීරික මානසික සුවතාවය සදහා පාදක ක්‍රියාකාරකම්(ක්‍රීඩා,සංගීත,විවිධ තරඟ, ආගමික වැඩසටහන් ආදිය)**

**ආ) කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන ආදායම් උත්පාදනය සදහා වන ක්‍රියාකාරකම් (මූල්‍ය පහසුකම්,ව්‍යාපාර හා ව්‍යවසායකත්වය නැංවීම)**

**ඇ) කාන්තාවන් මුහුණ දෙන අඩන්තේට්ටම්,හිරිහැර,හා අනෙකුත් නොසලකා හැරීම් පිටුදැකීම සඳහා පාදක වන ක්‍රියාකාරකම් (නෛතික ප්‍රතිපාදන,මහජන දැනුවත් කිරීම, ප්‍රජා බලපෑම් කණ්ඩායම් ගොඩනැගීම හා සේවා සපයන ආයතන හා එක්ව කටයුතු කිරීම)**

**ඇ) නියෝජනය හා සක්‍රිය සහභාගිත්වය**

සංවර්ධනය සදහා සංවිධානය වන වන විවිධ රැස්වීම්,බලමුළු ,වැඩමුළු හා පෙළ ගැස්වීම් තුළ නිරතුරු අත්‍යවශ්‍ය සංවිධානයක් ලෙස කාන්තා කාර්ය සංවිධාන කටයුතු කිරීම මෙවැනි විවිධ හා ප්‍රයෝගික හා වැදගත් ක්‍රියාකාරකම් මගින් මෙම කාන්තා කාර්ය සංවිධාන වැඩ ආකර්ෂණීය හා ක්‍රියාශීලි සංවිධානයක් බවට පත්කරගත හැකිය.කාන්තා කාර්ය සංවිධාන ශක්තිමත් කරගැනීමේ ක්‍රියාවලියේදී විවිධ පාර්ශ්වකරුවන් හා හවුල් කරුවන් සහභාගී වන නිසා ඔවුනගේ ශක්තින් වර්ධනය කරගැනීමටත්, විශ්වාසය හා කීර්ති නාමය දිනා ගැනීමටත් එය අවස්ථාවක් වේ. ඒ මගින් ඔවුන් ලංකාවේ සංවර්ධන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල හඩක් බවට පත් වීම නොනැවැත්විය නොහැක.

මෙවැනි ක්‍රියාකාරකම් මගින් කාන්තාවන් මුහුණ දී ඇති ගැටළු සදහා විසඳුම් ලබාදීමත් ඔවුන්ගේ සතුට හා අභිමානය උදෙසා කටයුතු කිරීමෙන් කාන්තා කාර්ය සංවිධාන

වඩාත් ආකර්ෂණීය හා කදිම තැනක් බවට පත් වියහැකි බව විශ්වාසයි. මෙයට අමතරව විශේෂයෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මෙන්ම ජාතික තලයේ විවිධ තීරණ ගනු ලබන බල මුළුවල මොවුනගේ නියෝජිතත්වය තහවුරු කිරීමෙන් මෙම කාන්තාවන් මුහුණ දෙන ගැටළු විසඳා ගැනීමටත්, සම්පත්, තනතුරු හා අවසථාවන් සඳහා ලඟා වීමටත් ඔවුනට හැකිවෙනු ඇත. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හා ජාතික මට්ටමේ එවැනි කමිටු සඳහා මොවුනට ගුණාත්මක සහභාගිත්වයක් දැක්වීමට හැකිවන්නේ නම් එය මුළු කාන්තා පරපුරේම ජයග්‍රහණයක් වනු නොඅනුමානයි. මෙහිදී කාන්තා සංවර්ධනයට අදාල අදහස් හා යෝජනා මොවුන් තුලින් ලඟා කර ගැනීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් එයට අවශ්‍ය සම්පත්, අරමුදල් මෙන්ම අනුමැතින් ලබා දීමෙන් කාන්තා කාර්ය සංවිධාන මේ සමාජය තුල සක්‍රිය හා වඩා පිළිගැනීමක් ඇති සංවිධානයක් බවට පත් කරගත හැකිය.

මේ සඳහා පාදක වන නියමු ව්‍යාපෘතියක් JICA ශ්‍රී ලංකා ආයතනය හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය,කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය මගින් දැනට ක්‍රියාත්මක කාන්තාවන් ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය මගින් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ JICA ව්‍යාපෘතිය මගින් දැනටමත් ආදර්ශමත් ක්‍රියාකාරී සැලසුම් සකස් කර එම ක්‍රියාකාරකම් මගින් කාන්තා කාර්ය සංවිධාන වඩා කාර්යක්ෂම හා ක්‍රියාශීලි සංවිධාන බවට පත් කිරීමේ කාර්ය මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්ක වල ආරම්භ කර ඇත.මෙයින් උගත් පාඩම් හා ප්‍රශස්ත භාවිතයන් ශ්‍රී ලංකාවේ අනෙකුත් කාන්තා කාර්ය සංවිධාන වෙත හඳුන්වා දීමෙන්,එකී සංවිධාන ද වැඩ ආකර්ශනීය හා කාන්තාවන්ගේ විමුක්තිය උදෙසා කටයුතු කරන සංවිධානයක් බවට පත් කිරීමේ කාර්ය මෙමගින් ලඟා කරගැනීමට අපේක්ෂිතය.

මෙහි ප්‍රතිඵලය වන්නේ කාන්තාවන් අධ්‍යාපනයෙන්, රැකියාවෙන්, සහභාගිත්වයෙන් හා ඔවුනගේ නිදහසෙන් පිරිමින් හා සමාන මට්ටමක කාර්යසාධනයක් පවත්වාගෙන යාමයි.එමගින් සාධාරණ හා සමානාත්මවාදී සමාජයක් බිහිවීම ක්‍රමානුකූලව සිදු වීම ආරම්භ වේ.



**ආචාර්ය නිමල්සිරි රණසිංහ**
**උපදේශන නිලධාරි**
**කොළඹ දිස්ත්‍රික්කය**

"හරිම මහන්සියි". සිමෙන්ති පොළොව මත දිගාවූ මතීෂාට සිතුණාය. ජිවිතේ දැන් බර වැඩියි. වෙනදා මෙන් සිතට දැනෙන සැහැල්ලුව දැන් දැන් මතීෂාට දැනෙන්නේ ම නැති ගාණයි. උඩුබැලි අතට දිගා වී සිටි මතීෂා පරණ උළු සෙවිලි කළ වහලය දෙස ඔහේ බලා සිටියාය. හිරු උදාවී හෝරා 03ක් විතර ගොස් ඇතත් මතීෂාට ඒ පිළිබඳ කිසිදු අදහසක් නැති තරම්ය. එකවරම ඇයගේ දෑස් පිය වී ගිය ද නිදිමතක් නොමැති බව නම් ඇය හොඳාකාරවම දන්නීය. ඒත් ඇය සිතේ මොකද්දෝ මහ හිස්තැනක් ඇති සෙයින් බලා ගත් අතම බලා ඉන්නට සිතා ගත්තාය. හිරු රශ්මිය වහලයට පතිත වී වහලයේ සිදුරකින් වැටුණු ආලෝක ධාරාව ඇයගේ දෑහැන් බිඳ දැමීය. ඒ ඇගේ සීයා කියා දුන් කතාවක් මතක් වීම නිසාවෙනි. මේ විදිහට වැටෙන ආලෝකය පොළොව මත හදන කවාකාර මලක් වැනි හැඩයට, සීයා සකඳමල කියා කී බව ඇයට හොඳාකාරව ම මතකය. සකඳමල හදන ඉර රශ්මිය වැටෙන රේඛාව දිළිසෙමින් දූවිලි අංශු ඉහළට පහළට කැරකී කැරකී චලනය වන බව ද ඇය දුටුවාය. ඇය තවදුරටත් හොඳින් පරික්ෂා කළේය. සීයා මේ හිරු රශ්මියේ රේඛාවට කිවේ බබලුවැල කියාය. නිදා සිටි ඇය ඒ එළිය දෙසම බලාගෙන නැගිට්ටාය.



දණහිස් නවා දෙකකුල් අස්සේ ගසා ගත් ඇය රන්වන් එළිය දෙස නැවත නැවත බලන්නට වූවාය.

මේ රන්වන් රේඛාවට තමන්ගේ ජීවිතය සමාන කරන්නට පුලුවන් නේද කියා ඇය සිතුව ද එය කෙසේ වන්නේ ද යන්න සිතා ගන්නට බැරි තරම්ය. අම්මලා කතා කර දුන් විවාහය කර ගත්තේ මා කරමින් සිටි දෙවන වසරේ උපාධිය ද නතර කරමින් බලාපොරොත්තු රාශියක් හිතේ රඳවාගෙනය. ඒත් ඒ බලාපොරොත්තු එකින් එක බිඳ වැටෙනවිට ඇගේ ජීවිතය කලු අන්ධකාර ගුහාවක අත්පා ගැටගසා සිරකොට තබා ඇති සෙයක් හැම විටකම ඇයට දැනෙන්නට විය. ආදරය, විවාහය, දරුවන්, නෑදෑයින්, අම්මා, තාත්තා, සහෝදරියන්, මස්සිනා ආදි සියලුම වචනවලින් මතීෂාගේ ජීවිතයට කැන්දාගෙන ආවේ වේදනාවක් මිස සතුටක් නම් නොවේය. මම පවුලේ අට වෙනියාය. මට බාල තවත් නංගී කෙනෙක් සිටියාය. ඒ මගේ අම්මාගේ දෙවෙනි කසාදයෙන්ය. එවැනි නීත්‍යානුකූල නොවන සමබන්ධතා කිහිපයක් ම අම්මාට තිබුණු බව ඇය අසා ඇති බව ඇයට මතකය. එමෙන්ම තාත්තාට ද එවැනි සම්බන්ධතා තිබුණු බවත් ඒ නිසාම දරුවන් තුන්දෙනෙකු වෙනත් නිවාසවල සිටින බව ද කනින් කොනින් ඇය අසා තිබුණාය. ඇගේ පවුලේ තවත් සහෝදරයන් දෙදෙනෙකු අම්මාගේ නොසැලකිලිමත්කම නිසාම දියේ ගිලී මරණයට පත් වූ බව ගම්මුන් කියයි. ඒවා මතක් වන විට හිත කීරි ගසා හඬන බවක් ඇයට දැනෙන්නේය. ඒත් හිත ගලක් කරගෙන ආ දුර ගමන ගැන ඇයට ඇත්තේ සානුකම්පිත ආඩම්බරයක් මෙන් ම අසීමිත වූ සතුටකි.

ඒත් වද වේදනා විඳිනවා කියලා මෙච්චර විඳවන්න ඕනේ ද? ඉතිං මං මොනවා කරන්න ද? ඇයි ඔයාට කරන්න දෙයක් ඇත්තේම නැත්ද? පෙරල පෙරලා ඇය සහ ඇගෙන් ප්‍රශ්න ඇසුව ද පිළිතුරක් සිතාගන්ට බැරි තරම් ජීවිතය පැටලිලි සහගත බව ඇය නිතරම සිතුවාය.

වට් ආ යූ ඩුයින් අම්මා ---- ඕහ්

දුව පැන්නේ බෙල්ලටය. මොකක්ද අනේ මේ දැඟලිල්ල. මම හොඳටම බය වුනා.

අනේ why අම්මා---- දුව ඇවිටිලි කරමින් එක දිගටම ප්‍රශ්න ඇසුව ද ඇය කෙරෙහි අවධානය දෙන්නට බැරි බවක් ඇයටම දැනේ. හිස කැරකෙන ගතියක් හරියටම බීමත් පුද්ගලයෙකුගේ බමන ගතිය සේ ඇයට කිසිවක් කර කියා ගත නොහැකි ව ඇඟට කිසිදු පණක් නොමැති බව ඇයට දැනෙන්නට විය.

මොකද වෙලා තියෙන්නේ දුව හොඳටම අඬනවා මෙයාට වගේ වගක් නැහැ. තමුසෙට පිස්සු ද ඕයි. දැන් උදේ දහයි. තවම උයලත් නැහැ. ඇත්තට ම මොක ද වෙලා තියෙන්නේ ගල් ගැසුනාක් මෙන් ඔහුගේ තොරතෝංචියක් නැති කතාවට ඇය සවන් දෙමින් බලා සිටින්නීය.

ඔව් මම පිස්සියක් තමයි. මගේ හඬ එකවර ම මහ හඬකින් විවර විය. වසර ගණනාවක් සිර කර සිටි වේදනාවන් එකවර එළියට පැන්නා සේ ඇයට දැනේ. තමුසෙලා එකතුවෙලා මට ඉතුරු කළේ එච්චරයි. මහ හඩින් ඈ බෙරිහන් දෙන්නට වූවාය. චටාස් චටාස් කටවහග න්නවා. වෙනදා මෙන් ම ඇයට පහර පිට පහර වැදුනේ සිතා ගන්නට බැරිතරම් කාලයක් ඇතුලතදීය. කටවහ ගන්නවා යෝදියේ. අපි මොනවද කළේ. ඇය කිසිවක් නොකියාම හිස බදාගෙනම බිම වාඩි වූවාය. සමීර ගැසූ පහරින් ඇගේ දෑස් නිලංකාර විය. ඇගේ හිත ඇතුලේ ගොඩ නැගෙන වේදනාවන් උණුවතුර බුබුලක් හා සමානය. බොර බොර ගාගා ඉහළට ඇදෙන උණුවතුර බුබුලු හාත්පස උණුසුම් කරන්නාසේ ඇගේ මුලු ඇඟම උණුසුම් වේදනාවක් පිට කරන බවක් ඇයට දැනේ. ඇය තව තවත් බිම දිගා වුනේ කර කියා ගත දෙයක් නැති නිසාම ය.

"ඇහෙනවා නම් හිත හඬන තරම් - කිසිවෙකු නැහැ ලොව හිනැහෙන්නේ" එච්. ආර්. ජෝතිපාලගේ ගීතයක් යටි ගිරියෙන් කෑ ගසා මගේ හඬ අනුකරණය කරන බවකින් ඇගේ දුක කියන්නට පොරකන බවක් ඇයට සිතේ. ඇය හරිබරි ගසා නැගිට කෙදිරිගාමින්ම කුස්සිය දෙසට පිය මැන්නාය. ඉක්මනින් ආහාර පිසූ ඇය ගුවන් විදුලියේ වැඩසටහනකින් අසා දැන ගත් දුරකථන අංකයට ඇමතුමක් ගත්තාය.



සර් මම මතීෂා. ඔව් සර් මට මගේ ජීවිතය එපා වෙලා. මම අම්පාරේ. අම්පාරේ කිව්වාට පොතුවිල්වලටත් එහා ආරුගම්බේ ළඟ. මට ජීවිතේ කිසිම දවසක සතුට කියලා දෙයක් ලැබිලා නැහැ. මට දැන් මැරෙන්න හිතෙන

වාර අනන්තයි සර්. අනේ සර් මගේ ජීවිතේ මට බරක්. මහන්සියි. මොනවා කරන්නද ද කියා හිතා ගන්නවත් බැහැ.

හරි මතීෂා ඔයාට පුලුවන් නම් මාව මුණ ගැහෙන්න. අපි නිදහසේ හිමිහිට ඔයාගේ කතාව අහමු.

දුරකතනය විසන්ධි කළ ඇය ඒ අසල තිබුණු වේවැල් පුටුවක වාඩි වුයේ කිරි කිරි හඩක් සමඟය. ඇයට ඒවා ගාණක් නැත. ආරුගම්බේ මුහුදුතීරයේ හඬ, ඒ සුළඟ ඇයට සිහිපත් විය. ඇයගේ නිවසේ සිට ආරගම්බේ මුහුදු තීරයට මීටර් දෙසීයක්වත් නැතිතරම්ය. විවිධ දුර ප්‍රදේශවලින් ඇවිත් මුහුදු තීරයේ සතුටු වූ මිනිස්සුන්ගේ හඬ ඒ සමීප රූප ඇයගේ ඇස් ඉදිරිපිට මැවී මැවී විකාර රූප ගොඩාක් මවන්නට උත්සාහ කරන බව දැනේ. ඒ සතුට අපට විඳගන්නට නොහැකිය. අපි කොච්චරනම් අවසානාවන්ත ද යන්න නිතරම ඇය සිතූ දෙයක්ම ය. කුමන ජාතික වනෝද්‍යානයට යන මිනිසුන්ට කුඩා කල රටකජු විකුණුවා මතකය. ඒ මිනිසුන් විඳින සුවපහසුව සතුට වින්දනය විඳගන්නට අපට නම් ලැබුනේම නැත. ඔවුන් විඳි සතුටට අපි බඩු වික්කා පමණයි. ඒත් සිනාසුනා නම් සිනාසුනේ ඔවුන් සමඟ පමණි යැයි ඇය සිතන්නට පටන් ගත්තේ තොරතෝංචියක් නොමැතිවය. කුඩිම්බිගල තපෝවනයට අපේ සමහර අය දානේ අරන් යන අතර තවත් අයට බැන විඳින ආකාරය ද පාරේ අයිනේ රටකුජු විකුණු අපට නම් රහසක් නෙවේ. ඔවුනොවුන් භාවනාවට හෝ වෙනත් වැඩකට තපෝවනයට යන විට කාට හරි බැන බැන විවිධ අවලාද කියමින් ගමන් කිරිම පුරුද්දක් ලෙස සිදු වීම එකල අපට නොතේරුණත් දැන් එය සිහියට නැගෙන විට මහාම මහා කළකිරීමක් ඇයගේ සිතේ ඇති වන්නේයැයි ඇයට හැඟේ.
එකවරම උපදේශන කාමරයට පැමිණියේ මහමේරු පර්වතය හිස මත තබාගෙන ඇවිදින කාන්තාවක් යැයි උපදේශන නිලධාරියාට සිතෙන්නට ඇත. ඇයි මේ කළබලයෙන් ඔයා කවුද උපදේශන නිලධාරියාගේ හඬින් එය තේරුම් ගැනීම අපහසු නොවීය. සර් මම අම්පාරේ මතීෂා



ආ එන්න එන්න වාඩි වෙන්න. අනේ සමවෙන්න මම ඔයාව දැකලා තිබුනේ නැහැනේ කමක් නැහැ එන්න වාඩිවෙන්න. ඒ ආදරණිය පිළිගැනීම ඇයට මහම මහ සතුටක් ගෙන දුන් බව ඇයගේ මුහුණ දුටුවෙකුට සිතෙනවා නොඅනුමානය.

ස්තුතියි සර්. ඇය කියාගෙනම වාඩි විය.

ඉතිං ඔයාට ටිකක් මහන්සි පාටයි. උපදේශන නිලධාරිවරයා කතාව ආරම්භ කලේය. ඔව් සර් අද විතරක් නෙමේ මගේ මුලු ජීවිතය ම මහන්සියි. මගේ කතාවේ සර්ට නොකියපු තැන් ගොඩාක් තියෙනවා මම අද ඒ කතාව කියන්නම් සර්ට.

මගේ අම්මා මට සැළකුවේ මහා වෛරක්කාරයෙකුට සලකනවා වගේ. ඇයි කියලා මම දන්නේ නැහැ. මගේ නංගිට විවාහයක් කරලා දුන්නා. හැබැයි ඉතාමත් ඉහළින් ඉඩකඩම් විකුණලා ඒවා කරා. මට විවාහය කතා කරලා දුන්නා. හැබැයි මගේ විවාහයට වියදම් කරේ මමයි මම බැඳලා ඉන්න මගේ මහත්තයායි. අඩුම තරමේ අම්මා මගේ මඟුල් ගෙදර ආවේ නැහැ. තාත්තාට එන්න දුන්නෙත් නැහැ. ඒත් තාත්තා අම්මට හොරෙන් ඇවිත් මට ලියුම් කවරයක රුපියල් 2000ක් දාලා දීලා කන්නෙත් නැතිව යන්න ගියා. එතකොට මගේ මහත්තයාටත් රැකියාවක් නැතිව කොළඹ පැත්තේ ගිහින් හිටියේ. මට කන්න දෙයක් නැතිව මම මාරි බිස්කට් කකා දවස් දහයක් විතර ඉන්න ඇති ඒත් අම්මා හැම වෙලේම බත් කනවා මට දෙන්නේ නැහැ. එතකොට නංගියි එයාගේ මහත්තයාත් හිටියා. හැබැයි එයාලා ඉඳලා හිටලා තමයි මහගෙදර ආවේ. ඒත් එයාලා වුනත් මං ගැන බැලුවේ නැහැ. එතකොට තාත්තාට අංශ භාගේ හැදිලා හිටියේ. මම හදාගත්ත බලුපැටියෙක් හිටියා ඒ සතාට පවා බත් ටිකක් දුන්නේ නැහැ අම්මා. මම මාසයක් විතර මේ විදිහට ඉන්න කොට මට කතෝලික සභාවේ සිස්ටර් කෙනෙක් කතා කරලා වැඩක් හොයලා දුන්නා. මම ඒක කරගෙන ඉන්නකොට එක දවසක් මගේ බඩු එළියට දාලා මගේ නංගියි එයාගේ මහත්තයයි මට ගෙදරින් යන්න කිව්වා. මට එදා තමයි පළමුවරට මැරෙන්න හිතුන දවස සර්.

ඇය හඬන්නේ නැත. ඇයට කිසිදු කඳුලක් එන්නේ ද නැතිතරමය. මුහුණ රත්පැහැවී මළානික ගතියක් පැවතිය ද ඇය කතාව කියන්නේ තද ගල් හිතක් තම සිතින් හදාගෙන බව පෙනෙන්නට තිබේ.



මම ඇයි කියලා ඇහුවම මට නංගි පා පහරක් එල්ල කරා. මේවා දැන් අපේ. තමුං තමුංගේ තැනක් හොයා ගන්න එකයි ඇත්තේ කියල ගස්සාගෙන ගෙට ගියේ සර් මාව කවදාවත් දැකලා නැති කෙනෙක් වගේ. මම මගේ බඩුටික පුංචි සිලිබෑග් එකට දාගෙන පාරට ඇවිත් මගේ මහත්තයාට කතා කරලා තැනක් හොයාදෙන්න කියලා කිව්වා. එයා කිව්වේ තොට ඔහොම වෙලා මිදි කියලා. මට කර ගියා

ගන්න දෙයක් නැහැ. මම මගේ යහලුවන්ට කතා කරලා දවස දෙක එයාලාගේ ගෙවල්වල හිටියා. මගේ මහත්තයා ඔන්න ඊට දවස් ගණනාවකින් පස්සේ තැනක් හොයලා දුන්නා. මම දහදුක් වින්දා සර්. මගේ කියලා කිසිම කෙනෙක් මට උදව් කළේ නැහැ. ඒ විදිහට ඉන්නකොට මහත්තයාගේ අම්මත් මට විවිධ අඩන්තේට්ටම් කළා. ඒ වනකොට එයත් රට ඉඳලා අවා විතරයි. එයත් එක්ක තමයි මගේ මහත්තයා මාව වෙනම ගෙදරක නතර කළේ. මම එයාට උයලා කෑම බෙදලා ළඟට ගෙනත් දෙන්න ඕනේ. එතකොට මට දුව ලැබෙන්න හිටියේ.මම අමාරුවෙන් වැඩ කළේ. එයා ටීවී බලලා කෑම වෙලාවට ලැබුන් නැත්තම් මට කෑ ගහලා මහත්තයාටත් කෝල් කරලා. මහත්තයා මට බැනලා මගේ ජීවිතේ එපා ම එපා කරපු තැනකට ඇදලා දැම්මා. මම ඒවා ඔක්කොම දරාගෙන කොහොමහරි දරුවා හදාගෙන ඉන්නකොට මගේ නංගි හැම ඉඩමක්ම එයාගේ නමට ලියාගෙන මට කිසිදු දෙයක් ලබා නොදී මට බැනවදිමින් සිටි බව අසන්නට ලැබුණා. මම ඒවා පස්සේ ගියේ නැහැ ඒ අතර මගේ දරුවා මම ස්කෝලෙට දැම්මා සර්. ඒත් දරුවාට පාසල් යන්න වුනේ දවස් කිහිපයයි. එයාගේ පංතිභාර ටීචර් ඒ පංතියේ ළමයෙකුව කෙනිත්තුවා කියලා කනට ගහලා තිබුණා. දින කිහිපයකින් එයාගේ කනෙන් ලේ ආවා. ඊට පස්සේ රෝහලකට ගියත් එයාලා හරි ප්‍රතිකාරයක් කළේ නැහැ. පස්සේ අපි මඩකලපු රෝහලට ගිහින් ප්‍රතිකාර ගත්තා. ඔපරේෂන් එකකුත් කළා. දුවගේ මතකය අමතක වෙලා. දැන් මම කොළඹ පැත්තට ඇවිත් ඉන්නේ.

මම රටේ තියෙන සියලුම රාජ්‍ය ආයතනවලට ගියා. සර් මට සාධාරණයක් කර ගන්න එයාලාගෙන් මට ලැබුනේ මෙන්න මේ ලිපි විතරයි. දැන් මගේ මහත්තයා මට සලකන්නේ නැහැ. මට බනිනවා. ගහනවා. ඔක්කොම තමුසේ නිසා තමයි කියනවා. මට පහර දීලා රිදවලා කියනවා තමුසෙට ආදරේටලු එහෙම කරන්නේ කියලා. දරුවට හොඳ දෙයක් කරන්න කියලා දෙනකොට ඒකටත් බනිනවා. දරුවා වැරද්දක් කලාම ඒකටත් බනිනවා .ඇය ඇයගේ කතාව කියෝගෙන ගියේ එක්ස්ප්‍රස් ගමනක් යන දුම්රියක් වගේය.



දැන් මට තේරෙනවා ඔයා ඉන්න තැන. ඔව් මිනිස්සු උනාම හැම කරදරයකටම මුහුණ දෙන්න වෙනවා. එත් ඔයා මුහුණදීලා තියෙන දේවල්වල හැටියට ඔයා ඒවාට හොඳින් මුහුණ දීලා ශක්තිමත් කෙනෙක් විදිහට වැඩ කරලා තියෙනවා. ඉතිං තව දුරටත් අපි බලමු අපේ ගැටලු ටික පෙළ ගස්සාගෙන මොන ගැටලු ද අපි ඉක්මනින් විසඳ ගන්න ඕනේ කියලා. ඔයා ඒකට කැමැති ඇති නේද?

ඔව් සර් මට ඉක්මනට ම මේ ගැටලු විසඳගන්න ඕනේ.

ඔව් මට ඒක තේරෙනවා. අපි ඉස්සෙල්ලාම මහත්තයාට කතා කරලා ඉමු. උපදේශන නිලධාරිවරයා මතීෂාගේ මහත්තයාට කතා කර හමු වීමට දිනයක් දාගෙන මතීසාට තවදුරටත් කතා කර බලගන්වමින් ඇයට අවශ්‍ය උපදේශනය ලබා දීමට උත්සාහ ගත්තේය. අනේ දැන් මට ජීවත්වෙන්න පුලුවන් සර්. මට උදව් කරන්න. මට දැනෙනවා; මට ජීවිතේ ඉතුරු ටික හරි සතුටින් ඉදලා මැරෙන්න පුලුවන් කියලා. ඇයගේ මුහුණේ උදෑසන හිරු එළියට පිපෙන මලක් සේ සුන්දරව හිනැහෙන්නට උත්සාහ කරන බවක් පෙනෙන්නට තිබුණි.

සැමියා උපදේශන නිලධාරිවරයා හමු වී තවත් දිනෙක මතීෂා ද රැගෙන උපදේශනය ලබා ගත්තේ තව දුරටත් බලාපොරොත්තු රාශියක් මුදුන්පමුණුවා ගැනීමට හැකිවේවා යැයි අපේක්ෂාවෙන්ය. යුගදිවිය තෘප්තිමත් කළ හැකි ආකාරය දෙදෙනාටම කියාදුන් ආකාරය සැම විටකම සිහිපත් කරන්නේ සතුටින්ය. උපදේශන නිලධාරිතුමා කිවේ ගැටුම් වලක්වා ගැනීම, යුගදිවියේ වින්දනය වැඩිකර ගැනීම, ගැටලු සාර්ථක ලෙස විසඳීම, යහපත් සන්නිවේදනයක් ඇතිකරලීම, ආදරයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම, ලිංගික සම්බන්ධතා වර්ධනය කරගැනීම තුළින් පවුලක සතුට,ආදරය හැමදාම පවත්වාගත හැකි බවයි. දෙදෙනාම මෙය සිහියට ගෙන කටයුතු කරන සෙයක් දැන් දැන් දකින්නට ලැබේ.

එක දවසක් සර් මම අවුරුදු ගණනාවක් ඇඳපු නැති චිත්‍රයක් අවසන් කළා. ඇය උපදේශන නිලධාරිවරයාට දුරකතනයෙන් කතා කළේ ඉතාමත් සතුටින් බව ඒ හඬ ඇසුන කාහටත් තේරෙන්නේය. ඇයට තමන්ගේ මහත්තයා වෙනදාට වඩා සලකන බවත් ඊට වඩා ආදරය කරන බවත් දැනෙන්ට විය. ඇය නිවසේ වැඩකටයුතු පාන්දරම නැගිට අවසන් කර විවිධ අත්කම් නිර්මාණය මෙන්ම නැටුම් පංතියකට ද යමින් ඉතාමත් සතුටින් කාලය ගෙවන බව ඇයගේ බොහෝ කතාවලින් පැහැදිළි වේ. අලුත් බලාපොරොත්තු සමග වෙනදා මෙන් ඇය නින්දට ගියේ සැමදාම මේ විදිහට මගේ මහත්තයා මට සලකනවා නම් හොදයි සිතාගෙනමය. ඇයට ඒ ආදරය හැමදාම අවශ්‍ය විය. දුවත් තුරුලු කර ගෙන නින්දට යනවිට මහත්තයා පැමිණ දෙදෙනාවම බදාගෙන නිදන්නට වු නිසා ඇය හදවතින් හැමදාමත් උපදේශන සේවයට පිංදුන්නාය.

# නිර්වාණය හා ස්ත්‍රිය

**ඩබ්. එම්. දිනේෂා දිල්හානි**
**සංවර්ධන නිලධාරි**
**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**

මහබෝධිසත්වයන් වහන්සේ මිනිස් ලොව උපදින්නට පඤ්ච - මහා විලෝකනයන් පිළිබඳව විමසා බලද්දී මිනිසකු ගැන විමර්ශනය කරන්නේ නම් ඒ මව පිළිබඳවම පමණි. අම්මා යනු සමස්ථ සත්ත්ව සංහතියේ ම උත්තරීතර පදවියකි. අච්ඡරිය - අබ්භූත ධම්ම සූත්‍රයෙහි සඳහන් වන පරිදි බෝධිසත්වයන් වහන්සේ කුස දරණ මව කොයිතරම් නම් පුණ්‍යවන්ත තැනැත්තියක්ද වග මොනවට පැහැදිලි වෙයි.

තවද අප ගෞතම බුදුපියාණන් වහන්සේ හට බුද්ධත්වය ලැබීම උදෙසා විවරණ දුන්නේද ස්ත්‍රියකි. ඒ බෝසත් අවදියකදී උන්වහන්සේගේ මව විසිනි. එබැවින් ස්ත්‍රියට බෞද්ධ දර්ශනය තුළ හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. "බුද්ධ මාතාව නම් ලොල් වූ සුරා දූර්තියක් නොවෙයි. කල්ප ලක්ෂයක් පුරන ලද පාරමිතා ඇති ජාතියේ පටන් පන්සිල් නොකඩන ලද්දී වෙයි; මායා දේවිය මහත් භාග්‍යය ඇත්තියකි" ප්‍රපඤ්චසුදනි අටුවාවේද එලෙස සඳහන් වේ. ගෞතම බුදුරජාණන් වහන්සේ දඹදිව පහල වන කාලය වන විට ස්ත්‍රියට එකළ සමාජය තුළ අත්ව තිබුණේ ඉතා පහත් තත්වයක් වන අතර බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව ස්ත්‍රිය දැඩි සමාජ අසාධාරණකම්වලට පත්ව තිබුණද බුදුරජාණන් වහන්සේ කාන්තාවකට දිය යුතු ගෞරවය හා අයිතිවාසිකම් උපරිම වශයෙන් ලබා දුන්හ. කාලීන සමාජ සම්මතය ඉක්මවා යමින් උන්වහන්සේගේ එම ක්‍රියාමාර්ග නිසා පසුකාලය වන විට සමාජය තුළ කාන්තාවට ගෞරවනීය සමාජ පසුබිමක් සකස් විය. බුදුන්වහන්සේ කාන්තාවන් සඳහා ගත් සහනශීලි ක්‍රියාමාර්ග අතර සමාජය තුළ පියාට හිමි ස්ථානය මවටත් ලබා දීම, භික්ෂුණී ශාසනය ඇති කිරීම, භික්ෂුණීන්ට මෙන්ම උපාසිකාවන්ට ද අගතනතුරු පිරිනැමීම හා ස්වාමි භාර්යා යුතුකම් සහ වගකීම් සමසේ පෙන්වා දීම ආදි කරුණු පෙන්වා දිය හැකිය. ජීවවිද්‍යාත්මකව ස්ත්‍රියක් සතු දුක් 03 ක්ද සමාජ සංස්කෘතීන්ට අනුව ස්ත්‍රියක සතු දුක් 02 ක්ද වශයෙන් කාන්තාවන්ට ජීවිතයේ දුක් 05 ක් පවතින බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දී ඇත. එනම් ඔසප් වීම, ගැබ් ගැනීම, ප්‍රසූතිය, ස්වාමියේ නිවසට යාමට සිදු වීම හා පුරුෂයාගේ පරිචාරිකාව වීම වේ. (අවේණික - දුක්ඛ සූත්‍රය - සං:නිකාය) යම් සමාජයන් විසින් ඇයට ස්වාධීනව හා



නිදහස්ව ජීවත් වීමට ඉඩනොදෙයි. විවාහය නැමැති උණුසුම් වූ කිරි වීදුරුව ඇයට පානය කිරීමට සිදුවේ. යමෙකු විවාහ වීම නුසුදුසු ක්‍රියාවක් බව මෙයින් අදහස් නොකරන අතර විවාහය තුළ පවතින දුක්ඛදෝමනස්සයන්, බැඳීම් හා වගකීම් නිසා ඇය නිර්වාණයෙන් ඈතට යාමක් සිදුවන බව කිවයුතු අතර නමුත් ඇයට විවාහයම උපනිශ්‍රය කර ගනිමින් නිවන් දොරටුද විවර කර ගත හැකි බවද අවධාරණය කළ යුතු කරුණකි.

උපතේ සිට මරණය දක්වා ස්ත්‍රියගේ ජීවන ගමන තුළ ඇයට ඇතිවන ක්ලේෂ මූලයන් නිසා ඇයට විමුක්තිය සොයා ගැනීමට යම් යම් අපහසුවක් ඇති බවත් ඇයට සිය ජීවන චාරිකාවේ දියණියක, සිසුවියක, තරුණියක, පෙම්වතියක, බිරිඳක, මවක හා මිත්තණියක ආදී වශයෙන් ගොඩනගා ගැනීමට සිදුවන භූමිකාවන් තුළ පවතින පුද්ගල බැඳීම්හි උස්පහත් බව අනුව ඇයට නිර්වාණයේ හෝ ඇය සොයන විමුක්තියේ සැනසිලිදායක බව වෙනස් වේ. විශේෂයෙන් මවක් වෙනුවෙන් සමාජය මතු බුදු වන්නට ප්‍රාර්ථනා එක් කළද ඇයට මවක් වීමේ වගකීම සිය හිස මතට පැටවූ මොහොතේ පටන් දාරක ස්නේහය මත ගොඩනැගෙන කෙලෙස් මූලයන්ගෙන් ඇයට මිදිය නොහැක.

තවද සමාජය තුළ විවාහය යන සංකල්පයට වඩා වටිනාකමක් ලබා දී ඇති අතර මිනිසාගේ ලිංගික ජීවිතය පාලනය කිරීමටත් එය විධිමත්ව සංස්ථාපනය කිරීමටත් විවාහය යන ආයතනය ගොඩනගා තිබේ. එය පවුල නම් සමාජ සංස්ථාව සමග ඉතාමත් කිට්ටු සම්බන්ධතා පවත්වන සර්ව විශ්වීය සමාජ සංස්ථාවකි. එබැවින් සමාජය තුළ විවිධාකාර විවාහ ක්‍රම දක්නට ලැබෙන අතර ඒග විවාහ, බහු පුරුෂ විවාහ, බහු භාර්යා විවාහ, සමූහ විවාහ හා සමසිරි විවාහ ආදී වශයෙන් විවිධ වූ විවාහක්‍රම දක්නට ලැබේ.

මොනයම් ප්‍රවේශයකින් හෝ විවාහය පිළිබඳව අර්ථකතන ඉදිරිපත් කළද විවාහය හෝ පවුල නිර්වාණයට බාධාවක් බව ප්‍රඥාවෙන් පිළිගත යුතු ප්‍රස්තුතයකි. පංචේන්ද්‍රියෙන් ලබා ගන්නා අරමුණු මගින් ඇති කරගන්නා රාග, ද්වේෂ හා මෝහ යන අකුසල චෛතසිකයන් මුල් වන්නේ අවිද්‍යාවද හේතුවෙනි. එය තව දුරටත් අවුලෙන් අවුලට පත්වන තැන 'පහ අවුල' හෙවත් පවුල බව නිරුක්ති ධර්මයේ විස්තර වෙයි. මේ පිළිබඳ වාදයක් ඇති කර ගැනීමට වඩා ප්‍රඥාවෙන් මේ පිළිබඳව විමර්ශනය කිරීම වඩා සුදුසු බව හැගේ.

පවුලක මවකට හිමිවන භූමිකාව තුළ ඇයට පැවරෙන වගකීම් හා කාර්යභාර්යන් මත ගොඩනැගෙන බැඳීම් සමග ඇයට නිර්වාණයට යාමට පහසුද යන ප්‍රශ්නය ඔබෙන් අසමි. මවකට පමණක් නොව පවුලේ අනෙක් සාමජිකයන්ටද එසේමය. අප සමාජය තුළ දක්නට ලැබෙන පවුල් ප්‍රශ්න දෙස බැලූ කළ එහිදී කාන්තාවන් පීඩාවට පත්වන අවස්ථා බොහෝය. කාන්තවක් ලෙස ඉපදීම නිසා සමහර සමාජ වල කාන්තාවට ඇති වන්නේ මහත් වූ හිංසනයන්ය. සමහර සමාජ තුළ අඩු වයසින් විවාහ විය යුතු වීම, දරුවන් බිහි කිරීමට නොහැකි වුවහොත් නින්දා අපහස කිරීම, සමාජීය උත්සව පුද පූජාවන්ට ස්ත්‍රිය සහභාගි කර නොගැනීම, විලාසිතාවන් කිරීම සම්බන්ධයෙන්ද තහංචි පැනවීම, සැමියා මිය ගියහොත් තමාද සියදිවි හානිකර ගත යුතු යැයි සම්මත කරන ලද සමාජ ද පවතී.

එබැවින් පවුල තුළ හිංසාවට ලක්වන කාන්තාවන් පමණක් නොව සමස්ථ ලෝකය පුරාම වෙසෙන කාන්තාවන්ට විවිධාකාරයේ ගැටලු වලට මුහුණපාන්නට සිදුවේ. නමුත්, පවුල හෝ ස්ත්‍රීත්වය හෝ ස්ත්‍රියක් වීමෙන් විඳින්නට සිදු වන හිංසනයන් නිර්වාණයට ඉඳුරාම බාධාවක්ම නොවන බව මෙහිදී අවධාරණය කරගත යුතු කරුණකි.

එසේ නම් ස්ත්‍රියකට නිවන බොහෝ දුරද? නැත. කිසිසේත්ම නැත. දුගී පවුලක අනේකවිධ දුක්කම්කටොලු විඳින, ජීවන බර - පවුල් බර විඳවමින් කල්ගෙවන අන්ත අසරණ යැයි සමාජය ලේබල් කළ ස්ත්‍රියටත් මහා මන්දිරයක සියලු සැප විඳිමින් කල්ගෙවන සමාජ බලය හිමි ස්ත්‍රියටත් මේ ශාසනය තුළ නිවන් මඟ පූර්ණය කළ හැකිය. එය හුදෙක් මාගේ මතයක් නොවන බවත් එය බුද්ධ දේශනාව තුළ සඳහන් කරුණක් බවත් අවධාරණය කරමි. එදා ශාසනය තුළ අම්බපාලියටත්, පටාචාරාවටත්, කිසාගෝතමියටත්, විශාකාවටත්, යශෝදරාවටත්, උත්පලවන්නාවටත් මෙන්ම ප්‍රජාපතියටත් හිමි වූවේ උසස් ස්ථානයකි. එම ස්ත්‍රීහු නිර්වාණයේ ශාන්තිය අත්විඳගත් උතුම් ස්ත්‍රීන් බවට ඉතිහාසයට එක්විය.

යමෙකුට නිවන් මඟ පූර්ණය කර ගැනීමට පාරමිතාවන් සම්පූර්ණ විය යුතු අතර හේතුඵල ධර්මතාවයද ඊට බලපානු ඇත. තවද විශේෂයෙන් කල්‍යාණ මිත්‍රත්වය, ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය මෙන්ම යෝනිසෝ මනසිකාරය නිර්වාණයේ උතුම් සැනසීම ලබන්නට ප්‍රධාන සාධක වේ. එබැවින් මේ සියල්ල එක් වූ කළ එක් ක්ෂණයකින් නිර්වාණයේ දොරටු විවර විය හැකි බව බුදු දහමේ විස්තර වේ.

එබැවින් නිර්වාණය යනු කිසිදා ළඟාකර ගත නොහැකි, විශාල දුරකින් පිහිටා ඇති, පාර භෞතික දෙයක් නොවන බවත් තව්තිසාව වැනි දිව්‍ය තලයක්ද නොවන බවත් එය මරණය සමග ඒකාබද්ධව පවතින තත්වයක් නොවන බවත් ප්‍රඥාවෙන් දැකිය යුතුය. එය මානසිකව ලබා ගන්නා අවබෝධයකි. උසස් මානසික තත්වයකි. ලෝක යථාර්තය පිළිබඳව ප්‍රඥාවෙන් දකින්නට හැකි චිත්ත තලයකි. මහා ගැඹුරු හා නොතේරෙන දෙයක් ලෙස අනාදිමත් කාලයක සිට ජනවිඥානය තුළට ගිල්වා ඇති නිර්වාණය තමා තුළින්ම අවබෝධ කරගත හැකි බව දැන් ඔබට වැටහෙනු ඇතැයි මා විශ්වාස කරමි. එබැවින් එය අවබෝධ කර ගැනීමට පුරුෂයකුම විය යුතු නැත. ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් යන ඕනෑම අයෙකුට එම නිවන කරා ළඟාවිය හැකි බව පැහැදිලිය.

අනිච්ජ, දුක්ඛ හා අනත්ත යන ත්‍රිලක්ෂණය මැනවින් අවබෝධ කර ගත් තැනැත්තාට නිර්වාණය දුර නැත. ඔහු හෝ ඇය අටලෝ දහමට කම්පා නොවනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරති. කිසිවක් තමන්ට කැමති සේ නොපවතින බවත් එමඟින් තමාට ඇති වන්නේ දුකක්ම බවත් එනිසා එය අසාර බවත් මැනවින් අවබෝද කරගත් තැනැත්තාට ජීවත් වීමට පහසුය. සතර සතිපට්ඨානය ඇතුළු බොහෝ සූත්‍රවල ඉතා අපූරු ධර්ම කරුණක් විස්තර වෙයි. ආරණ්‍ය ගතෝවා, රුක්ඛ මූල ගතෝවා, ජන ශුන්‍ය ගතෝවා එම ධර්ම කරුණු වේ. මෙහි ඉතා රසවත් වූ යටි අරුතක් විස්තර වේ.

එනම්, නිර්වාණය කරා ගමන් කරන තැනැත්තා තමාගේ මනස ආරණ්‍යයක් බඳුව සකසා ගත යුතු බවත් 'රණ' හෙවත් යුද්ධයකින් තොර වූ සාමකාමී මනසක් සකස් කර ගත යුතු බවත් එමගින් විස්තර වේ. තවද රුක්ඛ මූලයක් පරිදි සිය මනස සකසා ගත යුතු අතර එනම් සවි ශක්තිමත් මූලයක් පවතින මහ වෘක්ෂයක් ලෙස බාහිරින් එල්ල වන කම්පනයන් හමුවේ නොසැලී එම කම්පනයන් අනුව අනුගත වෙමින් ජීවත් වන්නෙක් විය යුතු බවයි. එපමණක්ද නොව ජනශූන්‍ය බවකින් පිරි මානසික මට්ටමක් ඇති කර ගත යුතු බවත් එහිදී ඕනෑම මානව සම්බන්ධතාවයක් සමග සාමකාමීව කටයුතු කිරීමට හැකියාවක් ඇති කර ගත යුතු බවත්, තවද කිසිදු මානව සම්බන්ධතාවයකදී කිසිසේත්ම මානසික වශයෙන් ඇලීමක් ඇති කර නොගත යුතු බවත් එහිදී විස්තර කෙරේ. එමගින් තමා නිවීමටත් නිවීමේ සැනසීමටත් ඒකාන්තයෙන්ම පත්වන බව බුදුපියාණන් වහන්සේ තම ආර්ය ශ්‍රාවකයන් හට දේශනා කොට ඇත.

එබැවින් ධර්මය තේරුම් ගැනීමටත් ධර්මයේ හැසිරීමටත් ස්ත්‍රී පුරුෂ භේදයක් අවශ්‍ය නොවන බව ඔබට පැහැදිලි වනු ඇතැයි මා විස්වාස කරමි. ස්ත්‍රියක්වීම මගින්ම ඉදුරාම ඇයට නිර්වාණය දුරස්ථ වන්නේ නැත. විවාහයකින් පසු පවුලක මවක්, බිරිඳක් වීමෙන් අනතුරුව නිර්වාණයේ සියලු දොරටු වැසෙන්නේ ද නැත. නිවන් මග වඩන්නට යම් දුරකට බාධාවක් පමණක් විය හැකිය. තමාගේ හිත ශක්තිමත් කර ගනිමින් ජීවිතය පිළිබඳ යථාවබෝධයෙන් දකින තැනැත්තාට සිය ජීවිතයේ ඕනෑම භූමිකාවකදී සාර්ථකව ජීවත් වීමට හැකියාව ඇත. ජීවිතයට පැමිණෙන දුක් කරදර වලට නොබියව මුහුණ දීමටද හැකිය. ඒ සියලු අත්දැකීම් නිවනට උපනිශ්‍රය කර ගත හැකිය. ඒ අනුව බුදුපියාණන් වහනසේගේ ශාසනය තුළ බිරිඳක් ලෙස සැමියෙක් ලෙස පවුලක ජීවත් වියයුතු ආකාරයද පෙන්වා දී ඇත්තේ සියලු සත්වයිනට එකවරම නිවන් අවබෝධ කර ගැනීමට නොහැකි බව උන්වහන්සේගේ මහා ප්‍රඥාවට ප්‍රත්‍යක්ෂ වූ හෙයිනි. අවුරුදු හතෙන් සෝවාන් වූ විශාකාව දරුවන් තිස්දෙකක මවක් වූවාය. ඇය යහපත් පවුල් ජීවිතයක් ගත කළාය. ඇය සියලු සැප සම්පත් විඳිමින් ඉතාමත් සුන්දර ස්ත්‍රියක් ලෙස ජීවත් වූවාය. බුද්ධ කාලයේදී ශාසනයටද විශාල මෙහෙවරක් ඉටු කළාය.

මිනිසුන්ගේ අතින් අතට ගිය කාම සේවනයේ යෙදුනු අම්බපාලියද නිවනින් සැනසුනාය. සිය ස්වාමියා, දරුවන් හා දෙමාපියන්ගේ මරණයන් හමුවේ උන්මත්තක වූ පටාචාරාවට ද නිර්වාණයේ ශාන්තිය හිමි වූවාය. සිය දරුවාගේ මරණය පිළිගැනීමට නොහැකිව අසරණ වූ කිසාට බුදු හිමියන් පිහිට වූයේ නැවත කිසිදු භවයක දරුවන්ගේ මරණයේ වේදනාව අත්විදීමට ඉඩ නොදීය.

බුදුරජාණන්වහන්සේට බුද්ධත්වය ලබා ගැනීමට උපකාර කළ උතුම් ස්ත්‍රී රත්නයන් තුන් දෙනෙකි. ඒ නම්, මහමායා උත්තමාවිය, ප්‍රජාපතිය හා යශෝදරාවයි. මේ මුලු විශ්වයේම ප්‍රේමණීයතම ආදර කථාව සනිටුහන් කළේ සිද්ධාර්ථ හා යශෝදරාවයි. සිය සැමියා ලෝක සත්වයා වෙනුවෙන් නිර්වාණය සොයා යන ගමනට මුළු ජීවිතයම කැප කළේ ඇයයි. ලෝක සත්වයාව දුකින් මුදවා ගැනීමට තමා හට ලොව එළිය දකින්නට සිය ගැබ

පූජා කළේ මහමායා නම් වූ උතුම් ස්ත්‍රියයි. මවම නොවුනත් සෙනෙහසේ බල මහිමෙන් සිය ලේ කිරට හරවා ආදරයෙන් පෝෂණය කොට රැකබලා ගත් උතුම් වූ ස්ත්‍රිය වූයේ මහා ප්‍රජාපතියයි. එබැවින් බුද්ධත්වයෙන් පසු මාතෘ දිව්‍යරාජයාණන්හට ධර්මය දේශනා කිරීමට දිව්‍ය තලයට වැඩම කළ බුදුහිමියන් යශෝදරාවන් ද බැහැදැකීමට වැඩම කළේ ඇයට කල්‍යාණ මිත්‍රයකු සේ හිඳ ශ්‍රී සද්ධර්මය දේශනා කොට තමා වෙනුවෙන් විඳි සියලු වේදනාවන් දුරලා ඇයව මේ සසරින් එතර කිරීමේ උතුම් බලාපොරොත්තුවෙනි. එපමණක් ද නොව ශාසනය තුළ පැවිද්ද ලබා දීමට අවසර දුන්නේද, අවසානයේ බුද්ධ ශරීරය ස්පර්ශ කිරීමට අවසර දුන්නේද උතුම් වූ මහා ප්‍රජාපති ගෝතමියට පමණයි. එබැවින් මේ ලෝක සත්වයා දුකින් මුදවා ගැනීම උදෙසා විශ්වය තුළ පවතින්නාවූ උතුම්ම පදවිය තමා වෙත ලබා ගැනීමට උපකාර කළ සුවිශේෂී කාන්තාවන් තිදෙනා උදෙසා බුදුහිමියන් කළගුණ සැලකුවේ එලෙසය.

එබැවින් බුද්ධ ශාසනය තුළ ස්ත්‍රිය ගෞරවණීය චරිතයක් වන්නීය. බෞද්ධ දේශනාව තුළ ඇයට නිර්වාණය දුරස්ථ වූයේ නැත. යමෙකු උතුම් නිර්වාණය අවබෝධ කරගත් දා පටන් මේ විශ්වයෙහි සියලු ලෝකසත්වයන් කෙරෙහි ඇතිවන්නා වූ කරුණාව නිසාම ඔවුන් මේ වාතලයට මුදා හරින සුදු කිරණ මගින් මුළු මහත් විශ්වයක්ම සුවපත් කළ හැකියි. එසේ සුවපත් කළ හැකි අය අතර ස්ත්‍රියක් වී නම් ඒ ස්ත්‍රිය කොතෙක් නම් පිංවන්ත විය හැකිද?. ඔබත්, මමත්, අපිත් මේ සංසාරය තුළ පිංවන්තවූවන් බව අමතක නොකරන්න. මන්ද නිර්වාණය යනු අප සියල්ලන්ටම ළඟාකර ගත හැකි සුන්දර වූ අපූරු තිළිණයක් බැවිනි.



# Violence against women
## The Human Rights Perspective

**P.H. Sashika Chamali Ariyawansa**
**Human Rights Officer**
**Human Rights Commission of Sri Lanka**

"Every women has the right to be free from violence in both the public and private spheres". Violence against women is one of the most pervasive yet hidden forms of human rights abuses throughout the world. Without freedom from violence we are unable to enjoy other human rights. Women suffer from physical and mental violence in the home, the workplace and the community. We will only be free and equal to enjoy our human rights when society, governments and the international community act together to say "NO" to violence.

Gender-based violence is defined as violence that reflects the existing asymmetry in the power relations between men and women and that perpetuates the subordination and devaluation of the female as opposed to the male. This violence exists within the framework of the patriarchy as a symbolic system that engenders an array of day-to-day practices which deny women their rights and reproduce the existing imbalance and inequity between the sexes. The difference between this kind of violence and other forms of aggression and coercion lies in the fact that in this case the risk factor or source of vulnerability is the mere fact of being a woman.

The first recognition of violence against women as a human rights problem- by the CEDAW committee developed alongside feminist readings of international human rights law. Modern international human rights law developed in the years following World War II (1939-1945) as a response to catastrophic violence perpetrated by States against their own citizens, as well as civilians of the States they were fighting against. At first, there was more focus on civil and political rights - the right to life, the right not to be tortured, the right to liberty, and the right to a fair trial. The human rights framework began with

the Universal Declaration of Human Rights (GA Resolution 217A), a resolution of the United Nations General Assembly, and was developed subsequently through international and regional treaties and resolutions. The human rights law framework sought to bind States to legal obligations to not violate human rights of individuals, and was not considered initially to bind the activities of private individuals with respect to the way they treat each other.

Violence against women is a social problem. Among these problems, Sexual violence comprising the major chunk of violence against women is a universal but an invisible phenomenon. So much is the prevalence of sexual violence that women's physical, mental and sexual integrity ever remain at the risk for survival, in all societies in all regions of the world. Sexual violence is the most extreme and effective forms of patriarchal control, which simultaneously damages and constrains women's lives and individual and collective resistance among women. The occurrence of sexual violence is at the heart of the struggle over what constitutes women's rights as human rights, the physical territory of which is women's bodies. In terms of war and peace, women's human rights are violated daily and often systematically. The fact remains that a woman need not be arrested or live in a war torn area to be incarcerated and tortured. In words of Charlotte Bunch: “significant numbers of world's population are routinely subjected to torture, starvation, mutilation and even murder simply because they are female. Crimes such as these against any group other than women would be recognized as civil and political emergency as well as gross violation of the victim's humanity”.

Women throughout the world face systemic attacks on their human rights and chronic, routinised and legal discrimination and violence. Much of it is justified through cultural and religious arguments. Even where discrimination is prohibited, it often persists in practice. By any reasonable measure, the state’s failure to uphold women's rights as full and equal citizens, sends an unmistakably clear message to the broader community that women's lives matter less and that violence and discrimination against them is acceptable.

# ඔබ සතුටින් සිටින්නේ ද?

**නීතීඥ අකලංකා රත්නායක**
**සහය උපදේශක**
**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**

ඔබ යමෙකුගෙන් තමන්ට මෙලොව වැඩිම වටිනාකමක් ඇති පුද්ගලයා කවරෙක් ද යන්න පිළිබඳව විමසුව හොත් ඔබට විවිධාකාර පිළිතුරු ලැබෙනු ඇත. ඒ අතර තම මව, පියා, දරුවන්, ජීවන සහකරුවා හෝ වෙනත් යමෙක් සිටිය හැක. එහෙත් ඒ සියල්ල අතරින් තමාව ඒ සඳහා තෝරා ගන්නා පුද්ගලයන් ඉතා විරලය.

එහෙත් අපි මේ එළඹ සිටින්නේ තමාට ආදරය කිරීම, තමා වෙනුවෙන් හඬක් නැගීම හෝ තමාගේ වටිනාකම තේරුම් ගැනීම පිළිබඳව වෙනදාටත් වඩා බොහෝ පිරිස් උනන්දු විය යුතු කාලයකි. ජීවන අරගලය මෙන්ම ඒ හා බැඳුණු වෙනත් කාරණා, මානසික වියවුල් ආදිය හේතුවෙන් අද සිය දිවි හානි කරගන්නා පුද්ගලයන් ගේ ගණන දිනෙන් දින ඉහළ යමින් පවතී. ලෝකයේ තරුණ ප්‍රජාව අතර බොහෝ සේ වර්ධනය වන සිය දිවි නසා ගැනීම කෙරෙහි විවිධාකාර වූ ගැටළු හේතු වුවත් සිය දිවි නසා ගැනීම කිසිසේත්ම අනුමත කළ හැකි ක්‍රියාවක් ලෙස පිළිගත නොහැක. එය අනුමත කළ නොහැකි වුවත් ඒ ඒ පුද්ගලයාගේ දරාගැනීමේ ශක්තිය මානසික තත්ත්වය ආදී කරුණු මත එය තීරණය වන බව වටහා ගත හැකි කරුණකි. මේ අතර කාන්තාවන්ද වීම කනගාටුවට කරුණකි. විටෙක කාන්තාවන් මේකී ගැටළු හේතුවෙන් තම දිවිය අවසන් කරගැනීමෙන් පමණක් නොනැවතී තම දරුවන්ගේ ද ජීවිතය අවසන් කිරීමට ඉතා දැඩි එහෙත් අපහසු තීරණවලට එළඹෙති.

තමාට ආදරය කිරීම ආරම්භ කිරීමට කල් යැවීම සුදුසු නොවේ. ඔබට එය අද සිටම ආරම්භ කළ හැක. ඔබගේ රැකියාව, ඔබගේ සමේ වර්ණය, ඔබගේ කැමැත්ත, ඔබගේ භාෂාව හෝ ජාතිය කුමක් වුවත් තමා වෙනුවෙන් හඬක් නැගීම ආරම්භ කරන්න. තමාට ආදරය කරන්න. ඔබ තරම් ඔබට ආදරය කිරීමට වෙනත් අයෙක් මේ ලොව නොමැත. බොහෝ දෙනෙක් අද අසතුටින් කල් ගෙවන්නේ ද තමාට ආදරය නොකරන්නේ ද තමා කැමති දෑ කිරීමට නොපෙළඹෙන නිසාවෙන් හෝ ඒ සඳහා අවස්ථාවක් නොලැබෙන නිසාවෙන් යැයි කිව හැකිය.



අධ්‍යාපනයේ දී, රැකියාවේ දී මෙන්ම වෙනත් කුමන කාරණයක දී වුවත් කෙනෙක් යමකට ආදරය කළත් දෙමව්පියන්ගේ පෙළඹවීම හා බල කිරීම මත වෙනත්

යමකට යොමු වී ආතතියෙන් පෙළෙමින් එකී කාර්යයන්හි නියැලෙනු ඔබ දැක ඇත. එවන් විටක ඔබ කරන කාර්යය ඔබව සතුටට පත් නොකරන්නේ නම් හෝ ඔබගේ කාර්යය ඔබට විඳීමට අපහසු නම් එයින් ඉවත් වීම වඩා නුවණට හුරු තීරණයක් විය හැක. කෙසේ වුවත් එවන් තීරණයක් ගැනීම වඩා සිතා බලා පරිස්සම් සහගතව කිරීම වැදගත් වේ. මෙකී කාරණයේ දී බොහෝ විට තම සතුට කැප කරන්නා කාන්තාව විය හැකිය. කුඩා කාලයේදී හෝ තරුණ කාලයේ දී සපුරා ගැනීමට අපේක්ෂා කරන සියළු බලාපොරොත්තු දරුවන් හෝ පවුල ඉදිරියේ මරා දමා කාන්තාව අනෙකුන් වෙනුවෙන් ජීවත් වීමට පෙළඹෙති. එය ඔවුන්ගේ තෝරා ගැනීම වුව ද කාන්තාවට ඇවැසි ඇගේ සිහින දකින්නට ඕනෑම අයෙක් සහය දැක්විය යුත්තේ ද එබැවිණි.

වර්තමානයේ තරුණ ප්‍රජාව බොහෝ විට තමා කෙරෙහි ඇති අවදානය අඩු කරමින් බොහෝ විට ඉතා කාර්ය බහුල ජීවිත ගත කරති. එවන් අයට ඉතා ළඟින් ආශ්‍රය කිරීමට තරමේ මිතුරෙක්, සහෝදරයෙක් හෝ ඥාතියෙක් හෝ නොමැති අවස්ථාවන් ද දැක ගැනීමට හැකිය. සමාජයට සිනහව පෙන්වා ඇතුළතින් මානසික අවපීඩනයට ලක්වන බොහෝ දෙනා අවසානයේ දී තෝරා ගන්නේ තම ජීවිතය අත් හැරීමයි. තම ජීවන අරගලයෙන් හෙම්බත්ව සිටින සාමාන්‍ය පුද්ගලයෙකුට අනෙකාගේ දුක අවබෝධ කර ගැනීමට ද උකටහය. එහෙත් පුද්ගලයෙකුගේ අන්‍යොන්‍ය නිදහසට ගරු කරමින් අනෙකාගේ මානසික නිදහසට බලපෑම්ද නොකර එහෙත් ඇවැසි මොහොතක අත්වැලක් වීමට හැකියාව ඇති නම් ඉහත කී සිදුවීම් වළක්වා ගැනීමට අපිට බොහෝසෙයින් හැකියාව පවතී.

මෙවන් වකවානුවක මෙවන් සිදුවීම් බහුල තත්ත්වයක, හැකි පමණින් තමාගේ වටිනාකම තේරුම් කර ගැනීමට යමෙක් උනන්දු කරවිය හැකිනම් බොහෝ වටිනා කරුණක් විය හැක. තමා ඊයේ දිනයේ වරදක් සිදු කළා වන්නට හැක. එහෙත් ඊයේ දිනයේ වරද සිදු කළ මා ම අද දිනයේත් සිටී. හෙට දිනයේත් සිටී. ඊයේ දින සිටි මා හට වඩා අද දින සිටින මා වෙනස් අයෙකි. හෙට දින සිටින මා අදටත් වඩා වෙනස් අයෙකි. වඩා සංවර්ධනය වූ අයෙකි. සමහරවිටක හෙට දිනයේ දී තමා අද දිනට වඩා ඉතා සාර්ථක පුද්ගලයෙක් විය හැකිය.

ඔබ තනිවම කල්පනා කරන්න. තමා යම් හෝ දිනක තමාව සතුටින් තැබීමට යමක් කර තිබේ ද? කැමති ආහාරයක් මිලදී ගෙන තමා කැමති චිත්‍රපටයක් නරඹා තමන් ඇවිදින්නට කැමති ස්ථානයක ඇවිද තිබේ ද? බොහෝ දෙනෙකුට එයට වේලාවක් නොමැත. නොඑසේනම් තමන් තමාවම නොසළකා හැර ඇත.

සෑමවිටකට තම හෘදසාක්ෂියට එකඟව කටයුතු කරමින් තමාට අවංක වෙමින් කටයුතු කළ විට තමාට සතුටු වීමට කාරණයක් නිර්මාණය කර ගැනීමට හැකියාව ලැබෙයි. තම ජීවිතය හැකිතාක් තවත් කෙනෙක් සමඟ සංසන්දනය නොකර පෙර සිටි තමා සමඟ තමාවම සංසන්දනය කිරීම අපිට සතුටෙන් සිටීමට උපකාරී වන කරුණක් විය හැකිය. එමෙන්ම හැකි හැම විටම වර්තමානයේ ජීවත් වන්න. එවිට ඔබට හැකි සෑම විටකම ඔබගේ පෞද්ගලික දියුණුව කෙරෙහි අවධානය යොමු කළ හැකි වේ.

මදක් සිතන්න. ඔබ සතුටින් සිටිනවා ද? තීරණය ඔබ සතුය.

# ශ්‍රී ලංකා කාන්තාවන්ගේ සමාජ තත්ත්වය ලිබරල් ස්ත්‍රී න්‍යායේ උපයෝගීතාවය

**පවිත්‍රා රසාංජලී ජයරත්න**
**සංවර්ධන නිලධාරී**
**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**

ස්ත්‍රීවාදය ( Feminism ) හා ස්ත්‍රීවාදියා ( Feminist ) යන පද ලොව පුරා බොහෝ දුරට කතා බහට ලක්වෙමින් හා විමර්ශනයට ලක් වන මාතෘකාවකි. එමෙන්ම මෙම පදීතය බොහෝ විට සතුරු ප්‍රතික්‍රියා දක්වන ආවේගශීලී වචනයක් බවට පත්ව ඇත .ස්ත්‍රීවාදය යනු පවුල තුළ වැඩපළෙත් සමාජයෙත් පවත්නා ස්ත්‍රී පීඩනය සූරාකෑම පිළිබඳ අවබෝධය හා එම තත්ත්වය වෙනස් කිරීමට ස්ත්‍රීන් විසින් ගන්නා ලද දැනුවත් ක්‍රියා ද අදහස් වන පරිදි මෙම වචනයෙහි අර්ථය පුළුල් වී ඇත . මෙම නිර්වචනයට අනුව ස්ත්‍රීවාදීන්ට විරුද්ධව කෙරෙන වෙනස්කම් නැති කිරීම සඳහා සම අයිතීන් හා නෛතික ප්‍රතිශෝධන ඉල්ලා සිටින සමානාත්මතා සහ විමුක්ති ව්‍යාපාරයෙන් ඔබ්බට යයි .

ගැහැනු හා පිරිමි යනු ජීව විද්‍යාත්මක ප්‍රභේදනයක් වුව ද එයට සමාජමය වශයෙන් තිබෙන අර්ථකථනයන් පාදක කොට ගෙන සමාජයේ බොහෝ ස්ථරයන් හි පිරිමින්ට වඩා අඩු තක්සේරුවක් සැලකිල්ලකට භාජනය වීමටත් ඇතැම් අංශයන් ගෙන් පැහැදිලි ලෙසම ප්‍රතික්ෂේප වීමටත් අසාධාරණයට ලක් වීමටත් සිදුව ඇත . මෙකී සම්බන්ධතාව ස්ත්‍රීවාදය සමඟ අත්‍යන්ත සම්බන්ධතාවක් දක්වයි . ස්ත්‍රී වාදය පිළිබඳ වඩා සංවේදී වන්නන්ගේ මතය වන්නේ ඕනෑම සමාජයක පවත්නා වූ විවිධාකාර වර්ගීකරණයන් මත පදනම්ව බලන කළ පිරිමින්ට සාපේක්ෂව ගැහැනිය දැඩි පීඩනයකට පත්ව ඇති බවයි. සම්පිණ්ඩාර්ථයෙන් ගත් කළ ගැහැනුන්ටත් පිරිමින්ටත් එක සමාන තත්ත්වයක් ඉල්ලා සිටින න්‍යායකින් පටන් ගෙන විදාරණය වෙමින් ප්‍රසාරණය වී ඇති විවිධාකාරයේ සමකාලීන න්‍යායන් කිහිපයක් දැක්විය හැකිය.

- ලිබරල්වාදී න්‍යාය (Liberal feminisms)
- සමාජවාදී ස්ත්‍රීවාදී න්‍යාය (Socialist feminisms)
- රැඩිකල් ස්ත්‍රීවාදී න්‍යාය(Radicalfeminisms)
- මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්‍යාය (Marxist feminisms)
- මනෝ විශ්ලේෂණවාදි ස්ත්‍රීවාදී න්‍යාය( Phychoanalytic feminisms)

මෙකී න්‍යායන් බටහිර සමාජය තුළ බිහි වුවත් ස්ත්‍රීවාදය යන්න බටහිර සමාජයට පමණක් ආවේණික වූවක් නොවේ. එය වූ කලී සර්ව භෞමික වූ සංකල්පයකි. විශේෂයෙන් ආසියානු සම්භවය සහිත සන්දර්භයෙහි ස්වදේශික සංස්කෘතික සම්ප්‍රදායන් හා සාරධර්මයන්ට නොගැළපෙන්නක් ලෙස බැහැර කර ඇත. මෙසේ පටු ලෙස කල්පනා කිරීම බොහෝ විමුක්ති අරගලයන්හි ස්වභාවික ලක්ෂණ යයි.

නමුත් පෙරදිග සමාජ ව්‍යුහය තුළ ද ස්ත්‍රීවාදය පිළිබඳ චින්තනයක් දැක ගත හැකිය. ඉතිහාසයේ විවිධ තැන්හි චීනය, ජපානය, ඉන්දියාව, ඊජිප්තුව, ඉන්දුනීසියාව වැනි රටවල විවිධ ස්වරූපයෙන් ස්ත්‍රීවාදි සංකල්ප පැවත ඇත. නමුත් ලේඛනගත සාක්ෂි නොමැත. මෙම න්‍යාය බටහිර සන්දර්භයෙහි ගොඩනැගුණු චින්තනයක් ලෙස බැහැර කිරීමට පෙරදිග සමාජය උත්සුක වී ඇත. අපරදිග සමාජයෙන් මතු වූ ස්ත්‍රීවාදී න්‍යායන්හි ඇතැම් සංකල්ප පෙරදිගට ගළපා ගැනීමේ දී යම් යම් සීමාවන් මතු වීම සැබවින්ම ස්වභාවිකය. ස්ත්‍රීවාදි සංකල්පය ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාව සම්බන්ධයෙන් අනුකූලතාවයක් දක්වනු ලැබේ. මාක්ස්වාදීන්ගේ විග්‍රහයට අනුව පීතෘ මූලිකත්වයෙන් මිදීමට පවතින අපහසුතාවයත් ගෙදර දොර දෛනික කටයුතුවලට වැටුපක් ඉල්ලා සිටීම වැනි විකල්ප අප සමාජයට ආරෝපණය කර ගැනීමේදී අසීරුතා පැවතියත් කාන්තාවට හා පිරිමින්ට ආවේණික කාර්යය කොටස් හි සමාජානුයෝජනයක් ඇති කිරීම වැනි කරුණු වර්තමාන සමාජය තුළ මතුව ඇති බව සඳහන් කළ යුතුය.




රැඩිකල්වාදින් ලිංගික ක්‍රියාවලිය පහත් වූ දෙයක් ලෙසත් හෙළා දකින අතර ඔවුන් කුඨප්‍රාප්ති ගත කරනුයේ සමලිංගික සම්බන්ධතාවන අතර එවැනි සංකල්ප ලාංකේය සමාජයට ආරෝපණය කිරීමේදි ගැටලු මතුවේ .තවද මනෝවිශ්ලේෂණ ස්ත්‍රීවාදයෙහි මුඛ්‍ය අදහස වන්නේ උපතින්ම සිදුවන ගැහැනු පිරිමි වශයෙන් කාර්යය කොටස් බෙදුම "එහි ඇති විද්‍යාත්මක පදනම වෙනස් කිරීම කොතෙක් දුරට සාධාරණ ද යන්න මතු කළ හැකි තවත් ගැටලුවකි . සමාජවාදි මෙන්ම ලිබරල්වාදි න්‍යායන් තුළ ද මෙවැනි එකඟ විය හැකි මෙන්ම එකඟ විය නොහැකි ලක්ෂණ දැකගත හැකිය.

**ලිබරල්වාදි කාන්තා න්‍යාය** (Liberal Feminism thought)

ලිබරල්වාදී කාන්තා න්‍යාය හරහා උත්කර්ෂයට නංවනු ලබන්නේ ගෘහීය වපසරිය තුළත් වැඩබිම් අවකාශය තුළත් කාන්තාව ලක් වන පීඩනයෙන් මිදීට ඉදිරිපත් වී ඇති නිදහස් චින්තනයක් ලෙසයි .මෙම මතයට පක්ෂ මතධාරීන් කාන්තාවන්ගේ ජීවිතයේ ගුණාත්මක වෙනස්කම් ඇති කිරීමට උත්සුක වී ඇත . ඕනම සිවිල් සමාජ පුද්ගලයකුටම කතා කිරීමේ නිදහස, දේපළවලට හිමිකම් කීමේ අයිතිය, නිදහසේ ජීවත් වීමේ අයිතිය, ඡන්දය භාවිත

කිරිමේ අයිතිය ආදී ලිබරල් නිදහසක් තිබිය යුතු බව ඔවුන්ගේ අදහස වන අතර, එම නිදහස ඇය වෙතින් අහිමි කිරීම නිරායාසයෙන්ම ඇය සමාජය තුළ අසාධාරණයට ලක් කිරීමක් බවත් පෙන්වා දී ඇත . ඔවුන් න්‍යායේ මූලිකාර්ථය වන්නේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෑම පුද්ගලයෙකුටම සෑම කටයුත්තක දීම සම තැන් හිමි විය යුතු බවයි.

ලිබරල්වාදී චින්තනය18 වන ශත වර්ෂයේ ආරම්භ වූ අතර එහි වර්ධනය 20වන ශත වර්ෂය දක්වා වර්ධනය වී ඇත. මේරි වොල්ට්සන්ක්‍රාෆ්ට් (Mary waltsoncraft) නැමති ලිබරල්වාදිනියගේ අදහස මෙහි දී වැදගත් වේ. ඒ ඇයගේ ‘A Vindication of the Right of Women’ නැමති කෘතිය හරහා ඇ සිය න්‍යාය සම්බන්ධව කරුණු ඉදිරිපත් කරයි. ‘ ගැහැනු පිරිමි දෙපාර්ශවයටම අධ්‍යාපනය අවශ්‍යයි’ ඇයට අනුව ගැහැනු පිරිමි දෙපාර්ශවයටම සිය හැකියාව වර්ධනය කර ගැනීමට අවස්ථාවක් තිබිය යුතු බවත් කාන්තාව නිසි පරිදි ඇයගේ හැකියාවන් ඔපවත් නොකර ගැනීමෙන් ඇය බාහිර ලෝකයෙන් ඈත්වන බවත් ඇයගේ අදහසයි. කම්කරු කාන්තාවක් මධ්‍යම පාන්තික කාන්තාවකට වඩා නිදහස් ජිවිතයක් ගෙවන බව ඇගේ අදහසයි. කාන්තාව සතු විය යුතු පෞද්ගලික අවකාශය(personhood) තීරණ ගැනීමේ අයිතිය ස්වාධීන බව ආදිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම තත්ත්වය නොලැබීම නිසා කාන්තාව සමාජයේ පීඩනයට පත් වී ඇති බවත් මෙම තත්ත්වයෙන් කාන්තාව මුදවා ගැනීමට ඇති එකම මාර්ගය 'අධ්‍යාපනය' බවත් යන්න ඇයගේ අදහසයි.

19 වන සියවසේ මෙහි ඉදිරිපියවරක් දැක ගත හැකිය. ඒ ටේලර් මිල් (Taylor Mill) ජෝන් ස්ටුවර්ඩ් (Stewart Mil)යන යුවල අතිනි. ඔවුන් ගේ අදහස මේරි වොල්ට්සන්ක්‍රාෆ්ට්ගේ අදහසට සමගාමී වූවද ඊට වඩා ඉදිරි පියවරක් දැක ගත හැකිය. පුරුෂයන්ට සාපේක්ෂව කාන්තා සමාජය තුළ අත් විදින පීඩනය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස වූයේ යමෙකු ලිංගිකත්වය මත හෝ ස්ත්‍රී පුරුෂභාවය මත සාධාරණත්වයක් ගැන කතා කරන්නේ නම් කාන්තාවට අධ්‍යාපනය ලබා දීමෙන් පමණක් සෑහීමට පත් විය නොහැකි බවත් පිරිමින් විසින් අත්විඳින සෑම සිවිල් නිදහසක්ම හා ආර්ථික වරප්‍රසාදයක් ඇයට ලබා දිය යුතු බවත් ය. ඔවුන් සිය අදහස තම 'the subjection of women 1970' කෘතිය හරහා සිදු කර ඇත. මෙම යුවලගේ අදසහස මේරි වොල්ට්සන් ක්‍රාෆ්ට්ගේ අදහසට වඩා ඉදිරි පියවරක් වනුයේ අධ්‍යාපන අයිතිවාසිකමට වඩා පුරුෂයින් අත්විදින සෑම අයිතිවාසිකමක්ම කාන්තාවන්ටත් උරුම විය යුතු බව දැක්වීමයි. හැරියට් ටේලර් මිල්ගේ අදහස වඩා කාන්තා වාදී ස්වරූපයකින් ඉදිරිපත් වී ඇත. මෙය මැනවින් නිරූපණය වී ඇත්තේ යුවල විසින් රචිත 'Early Essays on Marriage and Divorce’ 1832 මිනිසෙක් හා ගැහැනියක් අතර සිදුවන දික්කසාදයකදී දරුවන්ගේ අයිතිය මව සතු විය යුතු බව දක්වා ඇත. නමුත් ජෝන් ස්ටුවර්ට් මිල් දික්කසාදය පිළිබඳ මීට වඩා වෙනස් අදහසක් දක්වයි. ඔහුගේ අවධානය යොමුව ඇත්තේ දික්කසාදය වළකාගත හැකි ක්‍රමෝපායන් පිළිබඳවය. ඒවා අතර,

- කල් පමාවී විවාහ වීම
- ප්‍රමාද වී දරුවන් හැදීම
- විස්කෘත පවුල ලෙස ජීවත් වීම

ආදී විසදුම් ඉදිරිපත් කර ඇත. කාන්තාවට සම්පූර්ණ නිදහස ලබා ගැනීමට නම් සාම්ප්‍රදායික, ගතානුගතික, මෙන්ම නීතිමය අංශවලින් ද වෙනස්කම් ඇති විය යුතු බව අවධාරණය

කරයි. තවද කාන්තාව ගෘහීය ජීවිතයට අමතරව ශ්‍රම වෙළෙඳපොළට ද දායක විය යුතු බවත් ඒ සඳහා ඇයට අධ්‍යාපන මෙන්ම සාධනීය ඉඩක් ආර්ථික ක්‍රියාවලියට සහභාගී වීමටත් ලබා දිය යුතු බවයි. නමුත් මානව සම්බන්ධතාවලදී කාන්තාව කුමන වරප්‍රසාද හා අවස්ථා ලැබුණ ද ඇය විසින් තොරා ගනු ලබන්නේ විවාහය හා මාතෘත්වයයි

20 වන ශතවර්ෂය ලිබරල්වාදයේ සන්ධිස්ථානමය සියවසකි. මෙහිදී පුරෝගාමීත්වය දෙනු ලැබුවේ බෙටිෆීඩන් නම් කාන්තාවාදිනි යයි. ඇයගේ ප්‍රධාන තර්කය වූයේ ගෘහීය පරිසරයෙහි පීඩනයෙන් මිදීමට නම් ඇය සිය ගෘහීය පරිසරයෙන් මිදී රැකියාවක නියලිය යුතු බවයි. ඉන් ඇයට මෙන්ම ඇගේ පවුලේ සාමාජිකයන්ට පවා යහපතක්ම සිදු වන බවයි. මෙහිදී ඇය විශේෂයෙන් අවධාරණය කළේ මවක බිරිඳක ලෙස ඇය විසින් සිදු කරන කැප කිරීම කිසි විටකත් රැකියා වෙනුවෙන් කැප නොකළ යුතුබවත් ය. සැබවින්ම මෙය වූ කලී යහපත් වූ මෙන්ම අතිශය සාධනීය වූ මතවාදයකි. ඇය කුමන රැකියාවක නිරත වී සිටිය ද මවක , ගෘහනියක ලෙසට ඇයට එම භූමිකාවෙන් මිදීමට අතිශය අපහසුය. ඇය එසේ එම භූමිකාවන්හි සිය කාර්යයභාරයන් අතපසු කළහොත් සිදුවන හානිය ද පසු කොට තැකිය නොහැක.

කාන්තාවක වශයෙන් රැකියා සහ කුටුම්බගත ජීවිතය සමබරව ගෙන යන්නේ කෙසේ ද යන්න ඇයගේ 'Second Stage' නැමති කෘතියෙන් පෙන්වා දී ඇත. ඇයගේ පළමු ග්‍රන්ථයෙන් සිදු වූ අතපසු වීම් සහ අපහැදිලි ගැටලු සහිත ස්ථාන මෙම කෘතිය හරහා පැහැදිලි කර ඇත. කෙසේ වෙතත් 18 වන සියවස සිට 20 වන සියවස දක්වා මෙම ලිබරල්වාදී න්‍යාය විකාශනය වූ අතර ඔවුන්ගේ අරමුණ වූයේ පැහැදිලි ලෙසම කාන්තාව වෙත එල්ල වී ඇති පීඩනය අවම කිරීමයි.



ශ්‍රී ලාංකේය කාන්තාවගේ සමාජ තත්ත්වය අධ්‍යයනයෙහි ලා ලිබරල්වාදි කාන්තා න්‍යායයෙහි අදාළත්වය

මෙම විග්‍රහයේදී අවධානයට යොමු වන ශ්‍රී ලාංකේය සමාජය දකුණු ආසියාතික කලාපයට අයත් රටකි. තුන්වන කලාපයට අයත් රටවල් ලෙස හඳුනාගත් රටවල් සහ දියුණු යැයි සම්මත ධනේෂ්වර රටවල්වල සමාජ සංස්කෘතික ව්‍යුහයන් දකුණු ආසියාතික කලාපයේ රටවල්වලින් වෙනස් වේ. ශ්‍රී ලංකාව හා පාකිස්ථානය වැනි රටවල්වල දැකිය හැකි සාම්ප්‍රදායික චින්තනය තුළ කාන්තාව විග්‍රහ කිරීමේදී ජාතිය ආගම කුලය වැනි සන්දර්භයන්ගේ බලපෑම වැදගත් වේ.

කාන්තාව කුමන ජන වර්ගයකට, ආගමකට, කුලයකට

අයත් වූවත් තමා විසින් ගනු ලබන කාර්යය අනුව ඇයට හිමි වන්නේ දෙවන ස්ථානයයි. ලාංකේය වපසරිය තුළ ද මෙම ක්‍රියාවලිය මේ ආකාරයෙන්ම සිදු වේ. එනම් විවිධ වර්ගයේ ස්ථරයන්ට ලාංකේය කාන්තාව වර්ග කළ හැකි වූවත් ඒ සෑම මාදිලියක් තුළම සාම්ප්‍රදායික කාන්තාවගේ ආකෘතිය පවතී.

සාම්ප්‍රදායික කාන්තාවගේ තත්ත්වය විග්‍රහ කර බැලීමේ දී ඇය බාහිර ලෝකයට විවෘත නොවූවාය. තම ස්වාමියා හා දරුවන් සම්බන්ධයෙන් ඇය යුතුකම් හා වගකීම් ඉටු කළ යුතුය. මීට අමතරව සිය ස්වාමියාගේ උපාය මාර්ග සඳහා සහයෝගය දීම ද ඇය කළ යුතු විය. එහි දී කෘෂිකර්මාන්ත කටයුතු ආදිය දී වල් නෙලීම, ගොයම් කැපීම, ඇඹුල ගෙන ඒම ආදි කාරණයන්ට ඇයගේ සහයෝගය අවශ්‍ය විය. කෙසේ වෙතත් සාම්ප්‍රදායික වපසරිය තුළ දැඩි ලෙස සාම්ප්‍රදායික හා ගතානුගතික සීමාවන්ට යටත්ව ජීවත් වීමට ඇයට සිදු වී ඇත. එපමණක් ද නොව ඇයට සිය පෞද්ගලික අවකාශය තුළ පවා නිදහස බොහෝ විට සීමා පනවා තිබේ. හඬ නගා සිනාසීම පිරිමියාට ඉහළින් කතා කිරීම ආදිය අසංවරකම් ලෙස සළකමින් ඇයගේ පුද්ගලික අවකාශය පවා බොහෝ කොට සීමා කර තිබුණි.

ක්‍රි.ව පස්වන සියවසේ දි පමණ රචිත දීප වංශය හා ඊට සියවසකට පමණ පසු රචිත මහා වංශයට අනුව ලංකා ඉතිහාසයේ රාජ්‍යත්වයට පවා පත්ව ඇති කාන්තාවන් පිළිබඳ සඳහන් වේ. නමුත් අධ්‍යාපනය සම්බන්ධ කරුණුවල දී ඇයට නිවසේ කටයුතු කර ගෙන සිටීමට තරම් අවබෝධයක් පමණක් තිබීම ප්‍රමාණවත් බව විශ්වාස කළ බවක් දැක ගත හැකිය. නමුත් ලිබරල්වාදින්ට අනුව දැක්වෙන්නේ සියලු මානව ප්‍රජාවට සම අයිතීන් තිබිය යුතු බවයි. සම අධ්‍යාපන අයිතීන් ලැබුණේ බ්‍රිතාන්‍ය පාලනයෙන් අනතුරුවය. ඉන් අනතුරුව ඇයට විශ්ව විද්‍යාල අධ්‍යාපනය පවා හිමි විය. ඊට සාපේක්ෂව කාන්තා ජනගහනයේ සේවා නියුකත්ති අනුපාතය ද බොහෝ සෙයින් ඉහළට ගොස් ඇත . නිදසුනක් වශයෙන් මෑත වසරවල දී නිමවුම්, වාණිජ, කෘෂිකාර්මික යන අංශයන්හි ස්ත්‍රීන් සඳහා රැකියා අවස්ථා වර්ධනය වීම සේවා වියුක්ති අනුපාතය තියුණු ලෙස පහත වැටීමට හේතුභූත වී ඇත. කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වය පිළිබඳ සමස්ත විශ්ලේෂණය කිරීමේදී ආර්ථික හා ගෘහීය භූමිකා අතර ද්විභේදාත්මක වර්ග කිරීමක් නොමැතිව පාරම්පරික වශයෙන් ශ්‍රී ලාංකේය කාන්තාවෝ ආර්ථික නිදහසේ කොටස්කරුවෝ වූහ. ලිබරල්වාදීන් පවසන පරිදිම ආර්ථික ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වයේ ගුණාත්මක වර්ධනය ලාංකේය කාන්තාවන් සම්බන්ධයෙන් අපේක්ෂා කළ හැකිය. එසේම මේ වන විටත් ලාංකේය සමාජය තුළින් පුරුෂාධිපත්‍ය මිදී නැත. කාන්තාව සම්බන්ධයෙන් ලාංකේය සමාජය තුළ පවතින ගතානුගතික අදහස් සම්පූර්ණයෙන්ම මිදී ඇත.

වොල්ට්සන් ක්‍රාෆ්ට් විසින් අවධාරණය කළ තවත් පැතිකඩක් ලෙස "කාන්තාව සතු පෞද්ගලිකත්වය" දැක්විය හැකිය. පුරුෂාධිපත්‍ය මුල් බැස ගෙන ඇති සමාජයක කාන්තාවගේ පෞද්ගලිකත්වය හුදු විහිලුවක්ම පමණි. හැරියට් ටේලර් මිල්ගේ සහ ජෝන් ස්ටුවර්ට් මිල් යුවලගේ ප්‍රධාන තර්කය වූයේ යමෙකු ලිංගිකත්වය මත හෝ ස්ත්‍රී පුරුෂභාවය මත සාධරණත්වයක් ගැන කතා කරන්නේ නම් හෝ එහි දී කාන්තාවන්ට අධ්‍යාපනය පමණක් ලබා දීමෙන් සෑහීමකට පත් විය නොහැකි බවත් පිරිමින් විසින් භුක්ති විඳින්නා වූ සෑම අයිතිවාසිකමක්ම හා වරප්‍රසාද මෙන්ම නිදහස ද කාන්තාවන්ට ලබා දිය යුතු බවයි. කෙසේ වෙතත් ලිබරල්වාදින්ට අනුව රැකියාවක නියලීම හෝ අධ්‍යාපනය ලැබීම හෝ නූතන

සමජය තුළ කාන්තාවට නිදහසේ ජීවත් වීමට ලද වරප්‍රසාදයක් ලෙස සැලකිය නොහැකි බවයි. තම සේවා ස්ථානවලදී ස්වාමියාගෙන් හෝ වෙනත් විරුද්ධ පාර්ශවයන්ගෙන් හෝ මග තොට දී ගමනාගමනයේදී පවා නොයෙකුත් ආකාරයේ පීඩාකාරී ස්වාභාවයන්ට හා අතවරයන්ට අසාධාරණයන්ට මුහුණදීමට ලාංකේය කාන්තාවන්ට සිදුව තිබේ. ඒ අනුව හැරියට් ටේලර් මිල්ගේ සහ  ජෝන් ස්ටුවර්ට් මිල් යුවලගේ ලිබරල්වාදී අදහසට අනුව කාන්තාවට සමාජය තුළ නිදහසේ ජීවත් වීමේ වරප්‍රසාද පිරිමින්ට සාපේක්ෂවම අවශ්‍ය බව පිළිගත යුතුය. ලිබරල්වාදින්ට අනුව සාම්ප්‍රදාය විසින් පමණක්ම නොව නීතිය තුළින් පවා කාන්තාවට යම් අසාධාරණයක් සිදුව ඇති බවයි. ශ්‍රී ලංකාව 1978 ව්‍යවස්ථාවේ 12 වන වගන්තියෙන් ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය මත කිසිම පුද්ගලයක්ට අසාධාණයක්  විය නොහැකි බවයි. එසේම එම වගන්තියෙන් කාන්තාවන්ගේ අභිවෘද්ධිය පදනම් කර ගනු ලබන යම් විශේෂ ප්‍රතිපත්තියක් තහනමට ලක් නොකරන බවත් ප්‍රකාශිතය. ලාංකේය කාන්තාවට හිමි දේශපාලන නිදහසට අමතරව 1985 පනතකින් පෞද්ගලික අංශයේ සේවයකරන කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු වැඩි කිරීම  වැනි පහසුකම් ද නීත්‍යනුකූලව ලබා දී ඇත.

ජාත්‍යන්තරව සිදු වූ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට (CEDWE) සමගාමීව යමින් 1993 කාන්තා ප්‍රඥප්තියට නිකුත් කරමින් ආර්ථික, සමාජීය, දේශපාලන යන සෑම අංශයකින්ම කාන්තාව පිරිමි හා සම අයිතිවාසිකම් ලබා  ගැනීමේ අවශ්‍යතාව පිළිගෙන ඇත.

සංක්ෂිප්තාර්ථයෙන් ගත් කල ලිබරල්වාදී චින්තතනයේ එන මූලික අදහස ලාංකේය සමාජයේ කාන්තාවන් සම්බන්ධයෙන් උක්ත ආකාරයෙන් සාකච්ඡාවට ලක් කළ හැකි අතර 18 වන සියවසේ සිට 20වන සියවස දක්වා ව්‍යාප්ත වූ ලිබරල්වාදී චින්තනය හරහා ඔවුන් අපේක්ෂා කළේ කාන්තාවන්ට පිරිමි හා සමතැනක්  ලබා දීම බව පැහැදිලිය. එම අදහස කොතෙක් දුරට ලාංකේය සමාජය තුළ අඩු වැඩි වශයෙන් ප්‍රතිෂ්ඨාපනය වී ඇති ද යන කරුණ පිළිබඳ සමබර අධ්‍යනයට මානයකි. ස්ත්‍රී වාදයේ න්‍යාය සංකීර්ණ වූවද න්‍යායේ ප්‍රධාන තර්කයට අනුව ඕනෑම සමාජ ක්‍රමයක ජීවත් වන  ජීවත් වන ස්ත්‍රීන් පීඩනයෙන් මුදාගෙන ස්වාධීනව නැගී සිටීමට අවශ්‍ය ශක්තිය හා ගාමක බලවේගයක අවශ්‍යතාව උත්කර්ෂයට ලක් කර ඇත.

# ආර්ථිකයට සවියක් වන ' ඇය '

**ආර් ගයනි අනුරාධා**
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**
**ශ්‍රී ලංකා මානවහිමිකම් කොමිෂන් සභාව**



කිරි සුවඳැති පුංචි බිළිඳියක් වී ලොවට පා තබන ඇය දඟකාර දියණියක්, ළයාදර සොයුරියක්, සෙනෙහෙවන්ත බිරිඳක්, ආදරණීය මවක් මෙන්ම පින්බර අත්තම්මෙක් වී සිය ආදරයෙන් මුළු ලොවම සනසන්නීය. සිය ශක්තියෙන් ලොවක් දරා සිටින්නීය. මුළු ලෝකයේම ජීවනාලිය ඇයයි. ඇයගෙන් තොර වූ සංස්කෘතියක් සාහිත්‍යයක් සිතීමටත් අසීරුවනවා සේම ජීවයේ සොඳුරුම ඇරයුම ඇයයි.

ගණ ගෝත්‍ර යුගයේ කාන්තාව නිවසේ වැඩකටයුතු වලට පමණක් සීමා විය. ඇගේ මූලික කාර්යය වූයේ ස්වාමියා දඩයමේ ගොස් රැගෙන එන ආහාර පිසීම, දරුවන් හැදීම, ඔවුන් පෝෂණය කිරිම හා නිවසේ මහලු වූවන් සහ ආබාධිත අයෙක් සිටී නම් ඔවුන්ට ඇප උපස්ථාන කිරිම හා රැකබලා ගනිමින් නිවසේ රැඳී සිටීමය. ක්‍රමයෙන් සමාජය විකාශනය වීමත් සමඟ ගෘහයට පමණක් සීමා වූ කාන්තාව ඉන් පරිබාහිරව පිරිමියා සමඟ උරෙනුර ගැටී බාහිර ලෝකය සමඟ කටයුතු කිරිම ඇරඹිණි. ශ්‍රී ලංකා ජනගහනයෙන් 51% ක් හොබවන්නේ ඇයයි. රන් දහඩිය හෙළමින් සිය සියුමැළි අතැඟිල්ලෙන් නෙළනා තේ දල්ලේ රන් කහට

ලෝකයක් හමුවේ කියාපාන්නේ ඇගේ ධෛර්යයි. 21 සියවසේ අගභාගයේ වුවද තවමත් සමාජයේ රජයන බමුණු මත බිඳගෙන තම අරමුණු හඹා ඉදිරියට යන ඇය, අද වන විට අහස, සමුදුර ජයගෙන හමාරය. පිරිමි හා උරෙනුර ගැටෙමින් ජීවන අරගලය දිනාගනු වස් සටන් කරන ඇය විටෙක මහා පර්වතයක් සේ නිසලය. විටෙක මහා පොළොව සේ ශක්තිමත්ය.

වර්තමානය වන විට ආර්ථිකයට ඇය සෘජු ලෙසම දායකත්වයක් සපයයි. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හදුන්වා දීමත් සමග ඇය විදේශ විනිමය ලබා දීම සඳහා සෘජු ලෙස දායක විය. ශ්‍රී ලංකාවේ මුලු ශ්‍රම බලකාය 53% කි. එකී ශ්‍රම බලකායට කාන්තා දායකත්වය 24 % කි ( ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2022). ඇය වෘත්තීමය ලෙස කුමන තනතුරක් දැරුවද නිවසේ දී ඇය මවක්, බිරිඳක් මෙන්ම ගෘහනියක් යන සියලු භූමිකාවන් රඟ දක්වන්නීය. ලාංකේය ඇඟලුම් ක්ෂේත්‍රය මූලික වශයෙන් රදා පවතින්නේ කාන්තා සවියෙනි. ඇගලුම් ක්ෂේත්‍රයේ නිරත වන පිරිස් අතරින් 65%ක ප්‍රතිශතියක් නියෝජනය කරනු ලබන්නේ කාන්තාවයි. එසේම අද වන විට පෞද්ගලික, රාජ්‍ය අංශ මෙන්ම නොයෙකුත් ස්වයං රැකියාවන් වලද නිරත වෙමින් ඇය නිවසේ ආර්ථිකයට විශාල සවියක් වන්නීය. 2022 වර්ෂය අවසානය වන විට රැකියාවකට නොගොස් නිවසේ සිටින කාන්තාවන්ගෙන් 75% ක ප්‍රතිශතයක් කුමන හෝ ස්වයං රැකියාවක නිරත වේ. එහිදි රෙදි මැසීම, නව නිර්මාණ කිරිම, ආහාර වෙළෙදාම ආදී වූ ස්වයං රැකියාවන් ගණනාවකම කාන්තාවෝ නිරත වී ඇත. එසේම රාජ්‍ය සේවය යටතේ ඇති ගුරු සේවය සලකා බැලීමේදී ගුරුවරුන් බහුතරයක් කාන්තාවන්ය. එසේම රාජ්‍ය ආරක්ෂක අංශය සලකා බැලීමේ දී පොලිසිය, ගුවන් හමුදාව, නාවික හමුදාව, යුද්ධ හමුදාව වැනි ක්ෂේත්‍රයේද වර්තමානය වන විට කාන්තා නියෝජනය වැඩි වෙමින් පවතී. රාජ්‍ය පාලන අංශය නියෝජනය කළ කාන්තාවන් අතීතයේ අවම වුවද වර්තමානය වන විට එම තත්ත්වයන් වෙනස් කරමින් කාන්තාව සියලු දේශපාලන අංශවලින්ද ඉහළටම ගොස් තමන්ගේ පෞද්ගලික ආර්ථිකයට මෙන්ම රාජ්‍ය ආර්ථිකයට විශාල ලෙස දායකත්වයක් සපයන්නීය.

ඉහළ අධ්‍යාපනික අවස්ථාවන් ලබමින් අධ්‍යාපනික ක්ෂේත්‍රවලද ඉහළට යමින් ඇය නිවසේ මුළුතැන්ගෙට පමණක් සීමා නොවූ කෙනෙකු බව අද වන විට මුළු මහත් ලෝකයටම දන්වා ඇත. කෘෂිකාර්මික අංශය මෙන්ම කාර්මික වැඩකටයුතු වලද නිරතවෙමින් ඇය ඇයගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගනිමින් ඉදිරියටම යමින් සිටී. එසේම ව්‍යාපාරික ක්ෂේත්‍රයේද ඉතා සාර්ථක ගමන් මාර්ගයක් ඇය සතු වේ. එසේම ලාලිත්‍යයෙන් හෙබි සුන්දර ලලිත කලාවක් වන ඇය අදවන විට එක් පැතිකඩකින් සැමට අභියෝග කරන උත්සහවන්තියකි.

අද්‍යයතන අවධිය වන විට අප දරුණු ආර්ථික පසුබෑමකට මුහුණ දෙමින් සිටින බැවින් පවුලක එක් සමාජිකයෙකු පමණක් රැකියාවක් කිරීම ඉහළ යන ජීවන මිලට රුකුලක් නොවේ. මූලික මිනිස් අවශ්‍යතා සඳහා පමණක් වැයවන මුදලද ඉහළ අගයක් ගැනීම

මෙන්ම මුදලේ වටිනාකම අවප්‍රමාණය වීම ද හේතුවෙන් තනි පුද්ගලයෙකුගේ වේතනය පමණක් න්‍යෂ්ටික පවුලක යැපීමටද ප්‍රමාණවත් නොවන තත්ත්වයක් උද්ගත වී ඇත. එමෙන්ම පවුලක දරුවන්ට හොද අධ්‍යාපනයක් ලබා දීම, එම දරුවන්ගේ ජීවිතයට හොඳ ආයෝජනයකි. එහෙත් වර්තමානයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන්ද වැය කළ යුතු මුදල දැනට ආසන්න වසරක කාලයක පමණ සිට කිහිප ගුණයකින් වැඩි වීමක් පෙන්නුම් කරයි. තම පවුලට සහ තම ස්වාමි පුරුෂයාට සවියක් වීම දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු ආදිය සඳහා වැයවන මුදල් කලමනාකරණය කර ගැනීම අරමුණු කර ගනිමින් නිවසේ  පිරිමි පාර්ශවය සේම කාන්තාවද රැකියාවක නිරත වීම වත්මන් සමාජයෙහි වැඩි ප්‍රවණතාවයක් පෙන්නුම් කරන කරුණකි. කාන්තාවන් රැකියාවක නියැලීම හුදෙක් තම පවුලේ හෝ තමාගේ  අවශ්‍යතා වෙනුවෙන් මුදල් ඉපයීමක් පමණක් නොවේ. තමන්ගේ උගත්කම, ස්වාධීනත්වය ප්‍රකට කිරිම මෙන්ම තම දිවියට තමා විසින්ම වටිනාකම් ඇති කර ගැනීමකි.



කාන්නාව නිවසේ වැඩකටයුතු වලට මෙන්ම මුළුතැන්ගෙට පමණක් සීමා වී කල් ගෙවිය යුතු නැත. ඇයට ඇගේ දක්ෂතා, හැකියා අවස්ථාවන් ලබාගැනීමේ අයිතිය ඇත. අතීතයට සාපේක්ෂව අද වන විට කාන්තාව සියලු අංශවලින් ඉදිරියට පැමිණ ඇත. ඒ අතර ආර්ථිකය තුළ විශාල ශක්තියක් ඇය සපයන්නීය. ඇයට සමතැන ලැබිය යුතු නැත. රටක ආර්ථිකයට මෙන්ම ඇයගේ පවුලට ශක්තියක් වන ඇයට නිසි තැන ලබා දී ආරක්ෂාකාරී මෙන්ම ආදරණීය, ගෞරවනීය පරිසරයක ජීවත් වීමට අවකාශය ලැබීම ඇයට ලැබෙන ඉහළම ගෞරවය වේ.

# “ඇයට බුද්ධිය හා ශක්තිය”

**ආචාර්ය ගීතාංගනී ප්‍රදීපා සේරසිංහ**

## 1.හැඳින්වීම.

'ඇය' සඳහා වන බුද්ධියත් හා ශක්තියක් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්නේ 'ඔහුට' එබඳු දේ අනවශ්‍ය නිසාද නැතහොත් දැනටමත් ඔහුට ප්‍රමාණවත් බුද්ධියක් හා ශක්තියක් පවතින නිසාද යන සංසන්දනාත්මක ප්‍රශ්න යමෙකු තුළ පහළ විය හැකිය. බැලූ බැල්මට මෙබඳු සංශය ඇතිවීම සාධාරණ බවක් මතුපිටින් පෙනී යා හැකිය. එහෙත් ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රායෝගික භාවිතාවන් අවධානයට ගැනීමේදී ඇයට සුවිශේෂී වන පරිදි බුද්ධිය හා ශක්තිය සැලසීමේ අවශ්‍යතාවක් පවත්නා බව විශේෂයෙන් සාධාරණීකරණය කළ යුතු නොවේ. කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ ජාත්‍යන්තර සම්මුතියට (CEDAW) අපේ රට අත්සන් තබා ඇත්තේ එබඳු අසමාන සැළකීම් කෙරෙහි වන අවධානය නිසා බව ඉතා පැහැදිලි වේ.

එබැවින් මෙහිදී අපගේ අවධානය යොමු වන්නේ ඇයට බුද්ධිය හා ශක්තිය ලබා දීමේ වටපිටාවක් පොදු ජන සමාජය තුළ නිර්මාණය කළ යුතු ආකාරය කෙරෙහි ය. කාන්තා විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ "කාන්තාවන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ සමාජ ආරක්ෂාව සැලසීම" පිණිස වන මෙහෙවර ප්‍රායෝගික යථාර්තයක් බවට පත්කිරීමෙහිලා අවධාරණය කළ යුතු කරුණු කිහිපයක් මෙහිදී විවරණය කෙරේ.

## 2. ගෘහ මූලික ඇය වන කුටුම්භයක

'ඇය' තිස්වසරක සිවිල් ගැටුමෙහි අනිසි විපාක තවමත් විඳවන රටක කාන්තා ගෘහමූලික කුටුම්භ හේතුකොට ගෙන නිර්මාණය වී පවත්නා අනන්‍ය සමාජයීය පරිසරය කෙරෙහි මෙහිදී ප්‍රථම අවධානය යොමු කෙරෙයි. ප්‍රායෝගික යථාර්තය තුළ හමුදා සහ පොළිස් වැන්දඹුවන්ද, හිටපු කාන්තා සටන්කරුවන්ද මුහුණ පා සිටින්නේ උක්ත කුටුම්භය මුහුණ පා සිටින පොදු තත්ත්වයට ම බව මෙහිදී විශේෂයෙන් සැලකිය යුතු වේ.මෙම කාන්තා කණ්ඩායම් සැලකිල්ලට ගනිමින් දැනට පවත්නා ඇතැම් නීති ඇගයීමටද අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමටද එකග වන තරමට අදාළ සියලු පාර්ශව සංවේදී වීම අත්‍යවශ්‍ය වේ.

ඔවුන් සඳහා ලබා දෙන ඇතම් වරප්‍රසාද සැපයීම කෙරෙහි මෙන්ම එම සැපයුම් සඳහා උපයෝගී කර ගන්නා නිවැරදි විශ්ලේෂණ ඔස්සේ යථාවත්කිරීම කෙරෙහිද රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු කළ යුතු වේ. මෙම සමාජීයය උප කුලකයට සේවා සපයන සෞඛ්‍ය ක්ෂේත්‍රය ප්‍රමුඛ රාජ්‍ය සේවාවන් සපයන සියළුම ක්ෂේත්‍රන්හි සක්‍රීය සේවයේ නිරතවන අපේ රාජ්‍ය නිලධාරීන්, ඔවුන් මුහුණ දෙන ගැටලු පිළබඳ සංවේදී වීම අත්‍යවශ්‍ය වේ. ඒ ඔස්සේ ඔවුන් අත්දකින මනෝසමාජීයය අවශ්‍යතාවන්ට විසඳුම් ලබා දී



මෙම කාන්තාවන්ට බුද්ධිය ලබා ගැනීමේ මානසික පරිසරය තහවුරු කරන අතරම ඔවුන් සඳහා වන තිරසර ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කරමින් මෙම කාන්තාවන්ට ආර්ථික ශක්තිය නංවාලීමේ භෞතික පරිසරය සකස්කිරීමද කළ හැකි වේ.

**3. සමාජ මාධ්‍යන්හි "ඇය"**

ගෝලීය ගම්මාන සංකල්පය තුළ සියළුම සමාජීය උපකුලකයන්හි වෙසෙන සියල්ලන්ගේ එදිනෙදා ජීවිතය උඩුයටිකුරු කරවන තරමට සමාජ මාධ්‍ය ජාලා විසින් මිනිස් ක්‍රියාකාරකම් තම අණ සකට ගනිමින් පවතිද්දී ස්ත්‍රියගේ ප්‍රධාන භූමිකාවන් තුනම මේ වන විට අභියෝගයට ලක් වෙමින් පවතියි. ලෝකයේ වෙනස් නොවන එකම සංසිද්ධිය වෙනස්වීම බව දැන සිටිමින් ම ස්වකීය අනන්‍යතාව පවත්වා ගනිමින් සමාජ මාධ්‍ය ජාලා තුළ හැසිරීම පිණිස කාන්තාව බුද්ධියෙන් මෙන්ම ශක්තියෙන්ද බල ගැන්විය යුතු වේ.

ජීවිතය අපතේ යවන කාලය කා දමන්නෙකු වශයෙන් සමාජ මාධ්‍ය ජාලා නිශේධනීයව බලගැන්වීම වෙනුවට එහි පවත්නා අනන්‍ය ලක්ෂණ ඵලදායී ලෙස භාවිත කළ හැකි බව වටහා ගැනීම මෙහිදී මූලික වේ. නව ගැටුම් නිර්මාණය වීමට මෙන්ම පවත්නා ගැටුම් සාධනීය ලෙස කළමනාකරණය කිරීම පිණිසද සමාජ මාධ්‍ය භාවිත කළ හැකි වීම සරල උදාහරණයකි.

සමාජ මාධ්‍යන්හි වහලෙකු නොවී එකී මාධ්‍ය ජාලා කාර්යයක්ෂම උපකරණ බවට පත්කර ගැනීමෙන් ඇයට බුද්ධිය සොයා යාමේ නව මංපෙත් නිර්මාණය කර ගත හැකි වේ. මෙහිදී විශ්වසනීයත්වය ගොඩ නගා ගැනීම කළ යුතු ආකාරය කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වන්නේ , ව්‍යාජ තොරතුරු ජනගත කිරීම පිණිස ද සමාජ මාධ්‍ය ජාලා අද වන විට පහසු භාවිතයේ පවත්නා බැවිනි.

තොරතුරු ලබා දීමේ තරඟයක නිරත වන විවිධ සමාජ මාධ්‍ය ජාලා කණ්ඩායම් ප්‍රමාණාත්මකව මුහුදේ ජලය තරමට සුලභ වී තිබේ. එසේ වුව ද මුහුදු ජලය පානය කළ නොහැකි තරමට ලවණ රසයෙන් යුක්ත වන්නා සේ මෙසේ පිරිනමන බොහෝ තොරතුරු අගයෙන් තොර වේ. එබැවින් බලහත්කාරයෙන් අත්ලටම ගොඩවන මෙම

තොරතුරු සීරුවෙන් තෝරා බේරා පෙරා කඨින ජලය, පානීය ජලය බවට පත් කර ගන්නා මෙන් අවශ්‍යතාවන්ට අනුරූපී ලෙස සංවිධානය කර ගැනීමෙන් පමණක් බුද්ධිය හා ශක්තිය විස්තාරණය කර ගත හැකි බව ඇය විසින් වටහා ගත යුතු වේ.

ස්වකීය ප්‍රතිරූපය සාධනීය ලෙස නිර්මාණය කර ගැනීමට හා තම කුඩා ව්‍යාපාරය සාර්ථකව ඉහළ නංවාලීමට සමාජ මාධ්‍ය ජාලයන්ට ඇති හැකියාව මෙන්ම තමාගේ චරිතය ඝාතනය වන්නට ඉඩ සැලසීමට ද සමාජ මාධ්‍ය ජාලාවන්හි පවත්නා අනන්‍ය අවදානම හඳුනා ගැනීම ඇයගේ වගකීමකි.

## 4. ඇය වෙනුවට විකල්ප පවතියි ?

වසර ගණනාවක් පුරා සිදු කෙරුණු පර්යේෂණ රාශියකට පසුව පසුගිය වසරේ නිෂ්පාදනය කරන ලද "කෘත්‍රිම කාන්තාව" චීනය විසින් මෑතකදී වෙළඳපොළට නිකුත් කරන ලද බවට පුවතක් පසුගිය දා වාර්තා විය. සිලිකන් පාදක කෘත්‍රිම රසායනික ද්‍රව්‍යවලින් තනා, "HOORI" වශයෙන් නම තබා ඇති ඇය කෘත්‍රිම බුද්ධිය මත ක්‍රියාකරන බවද, ඕනෑම භාෂාවක් කතා කරන බවද, ගේ දොර වැඩ සියල්ල නොපිරිහෙලා ඉටු කරන බව ද අදාළ ප්‍රවෘත්තියේ දැක්වේ. "ඇය"ට ආහාර අවශ්‍ය නොවන්නාක් මෙන්ම එක් වරක් ආරෝපණය (charge) කළ පසුව පැය හැත්තෑ දෙකක් පුරා සක්‍රීයව පවතින බව තවදුරටත් වාර්තා කර තිබේ. HOORI කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් නොකරන අතර කිසිවක් නියෝග නොකරන බව මෙම ප්‍රවෘත්තිය අනාවරණය කරන්නේ සදය උපහාසයක් ද සමගිනි.

HOORI ගේ තීරණාත්මක විශේෂතාවය වන්නේ " ආත්මයක් " නොපැවතීමයි. ඒ නිසාම HOORI "ඇය" නොව එය බවට පත්වේ! සියළු භෞතික නියෝග ඉටු කරන ඒකාබද්ධ යන්ත්‍රයක් මිස HOORI, ඇය වෙනුවට විකල්පයක් නොවන්නේ එබැවිනි. ඇයගේ විශේෂතාව වන්නේ ද හැඟිම්, දැනීම්වලින් සජීවීකරණය වීමය. කිසිදු කාන්තාවක් තවත් කාන්තාවකට හාත්පසින් ම සමාන නොවන්නේ මේ ජීව්‍යතාවය නිසාය.

ඇයට බුද්ධිය හා ශක්තිය ප්‍රාර්ථනා කරන අප හැමදෙනා මේ සහජ අනන්‍යතාව වටහාගෙන එක් එක් කාන්තාවගේ සුවිශේෂිතා දරාගැනිමට ද එකඟවිය යුතුය.

## 5. සමාලෝචනය

ඇය ගෘහමූලික කුටුම්බයක් කරට ගන්නේ මරණය වෙනුවට ජීවත් වීම තෝරාගත් ඕනෑම පුද්ගලයෙකුට එය හොඳම විකල්පය වන තීරණාත්මක අවස්ථාවකය. එබඳු පසුබිමක වෙසෙන කාන්තාවකට කොන්දේසි විරහිතව සහය වීම සියල්ලන්ගේ වගකීමය. දොර ජනෙල් හැර දමා හමන මඳ පවනට පිවිසෙන්නට ඉඩහසර සලසන්නට එකඟ වන අතර ම නල මුදු සුවඳම මිස සුළගේ එතී ගොඩ වන රොඩු බොඩු නිවසේ රොක් කර නොගන්නට ද කල්පනාකාරී වන්නා සේ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සැරිසැරීම සඵලදායී කර ගැනීමට තරම් ඇය සබුද්ධික විය යුතුය.
ඇය වෙනුවට බොහෝ විකල්ප ඇති බවක් හැඟී යතත්, ඇය වෙනුවට යාන්ත්‍රික විකල්ප අත්හදා බැලිය හැකි බවක් පෙනී යතත් ඒ හැඟීම්, දැනීම් යථාර්ථය නොවේ. එබඳු

පර්යේෂණ සාර්ථක වන්නේ HOORI වැනි නිෂ්පාදන ගෘහනියට නොව ගෘහයේ භෞතික කාර්යයන් කිහිපයකට විකල්පයක් වශයෙන් පමණකි. අම්මාට, අක්කාට, නංගීට, දියණියට, බිරිඳට, අත්තම්මාට පමණක් නොව නැන්දම්මාට හා නැනාට පවා විකල්ප නැත! ඇය රැකගැනීම අප විසින් අප රැක ගැනීමක් වන්නේ එබැවිනි.

කාන්තාවකට ඇය සතු වන බොහෝ ශක්තීන්ට පාදක වන්නේ ඇයට හිමි ආර්ථික ශක්තියයි. ගෞරවනීය සමාජයක සාධාරණ ආර්ථික වත්කමක් සහිතව ජීවත් වීමේ හිමිකම සෑම ස්ත්‍රියක උදෙසාම සහතික කිරීමට පොදුවේ සමාජයීය වශයෙන් සියල්ලෝම බැඳී සිටිති. කාන්තාවකගේ බුද්ධිය සඳහා පදනම වන්නේ මානසික පීඩාවෙන් තොර සතිමත් හැසිරීම් සහතික කරන නිරවුල් මනසයි. යමෙකුගේ මානසික සහනය සනාථ වීම හේතු කොට ගෙන සමස්ත ජන සමාජයම සුවපත් සිත් ඇති මිනිසුන්ගෙන් පරිපූර්ණ වෙයි. එබැවින් ම අපි සියල්ලෝම ඒ පරිපූර්ණතාවය නිර්මාණය කිරීමේ වගකීමට දායක විය යුත්තෝ වෙමු.

ඇයට බුද්ධිය හා ශක්තිය ලබා දීම ඔස්සේ මුළු මහත් ජන සමාජයම බුද්ධියෙන් මෙන්ම ශක්තියෙන් ද පරිපූර්ණ වෙයි. එබැවින් ඇයට බුද්ධියත්, ශක්තියත් පිරිනැමීම සමස්ත මානව සංහතියේ ම පොදු වගකීමක් වෙයි. රාමුගත නොවුණු රටක, සිරගත නොවන මනසක මනහර මිහිර විඳින්නට මිහිමත වෙසෙන සෑම පුද්ගලයෙකුට ම සමාන හිමිකමක් සනාථ වන්නේ එවිටයි!



# අපරාධ වින්දිතභාවය හා කාන්තාව

**ආචාර්ය කෞශල්‍යා හේවාවසම්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

අපරාධ වින්දිතභාවය යනු යම්කිසි සාපරාධීමය ක්‍රියාවක් හේතුවෙන් කායික, මානසික, ලිංගික, චිත්තවේගීමය හෝ මූල්‍යමය වශයෙන් පීඩාවට හෝ හිංසාවට පත්වීමයි. මෙම සංකල්පය 1980 දශකයේ ස්ත්‍රීවාදී න්‍යායයන් තුළින් අභියෝගයට ලක්කරනු ලැබූ අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද තර්කය වූයේ යම්කිසි සම්බන්ධතාවයක් හෝ අවස්ථාවක් හමුවේ අසමමිතික තත්ත්වයකට මුහුණපාන තැනැත්තෙකු වින්දිතයා ලෙස අර්ථ ගැන්වෙන බවයි. මෙහි දී අසමමිතික තත්ත්වයක් වශයෙන් හැඳින්වූයේ යම්කිසි දෙයක අසමතුලිතතාවය, සූරාකෑමට ලක්වීම, පීඩාකාරී තත්ත්වයන් ගෙන දෙන්නා වූ මෙන් ම නිසඟ වශයෙන් ම දුක්ඛිත තත්ත්වයට පත්වන්නාවූ තැනැත්තෙකු යන්නයි (හේවාවසම්, 2013). මෙවන් අවස්ථාවලදී නූතනයේ වැඩි අවධානය යොමු වන පිරිසක් ලෙස කාන්තාව හඳුන්වා දිය හැකිය. අපරාධ විද්‍යාත්මක පැතිකඩකින් විමසා බැලුවහොත් අපරාධ වින්දිතභාවයට පත්වන වඩාත් අවධානම් සහගත කණ්ඩායම් කිහිපයකි. එනම්, තරුණ පුද්ගලයින්, මහලු වින්දිතයන්, මානසික වශයෙන් දුර්වල පිරිස්, සංක්‍රමණික පිරිස්, රටක ප්‍රදේශයක සුළුතර පිරිස මෙන් ම මේ අතරට ප්‍රධාන ස්ථානය ගන්නා පිරිසක් ලෙස කාන්තාව හඳුන්වා දියහැකිය (Hentig, 1948). ඒ අනුව මෙම ලිපියෙන් මූලික අවධානය යොමු වනුයේ කාන්තාවන් හා සම්බන්ධ අපරාධ වින්දිතභාවය හා හිංසනය සම්බන්ධයෙනි.

කාන්තාව යන්න විවිධ අර්ථ නිරූපණ ඔස්සේ නිර්වචනය කරගත හැකිය. ඇයව හැඳින්වීම උදෙසාත් විවිධ වදන් සිංහල සාහිත්‍ය තුළ භාවිතා කරන ආකාරයක් පෙනේ. බොහෝ

අවස්ථාවලදී කාන්තාව සතුවන්නා වූ සිනිඳු, මටසිලිටු හා සුන්දර ගති ලක්ෂණ තුළින්, ඇය තුළ ජනිත වන්නා වූ මෘදු මොළොක් ගතියද ඉස්මතු කිරීමට බොහෝ සාහිත්‍යධරයින් උත්සාහ දරා ඇති බව පෙනේ. ඒ සියලු විග්‍රහයන් තුළින් පැහැදිලි වන කරුණක් වනුයේ පුරුෂයාට සාපේක්ෂව ඇයගේ ශරීර ශක්තිය හා ප්‍රමාණය අඩු තත්ත්වයක පවත්නා බවයි. මෙකී තත්ත්වය හේතුවෙන් කාන්තාවන් පුරුෂයින්ට වඩා දෙවන ස්ථානයක් ගන්නා ලබන ආකාරයක් ද හඳුනාගත හැකිය. මෙය ජීව විද්‍යාත්මක වශයෙන්ද සත්‍ය කරුණකි. මේ ආකාරයෙන් ශරීර ශක්තියෙන් මෙන් ම ප්‍රමාණයෙන් වෙනස්වන්නා වූ ස්ත්‍රිය හුදෙක් පුරුෂයින්ට සාපේක්ෂව ඉහළ අගයකින් අපරාධ වින්දිතභාවයට පත්වීමේ ඉහළ අගයක් ගන්නා බව විවිධ අවස්ථාවලදී කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වයන් හා සම්බන්ධ සිදුවීම් අනුව පැහැදිලිවන්නකි (Department of Police, 2015- 2019). සංඛ්‍යා දත්ත දෙස බැලීමේ දී වාර්තා වී ඇති අපරාධ සම්බන්ධයෙන් යම් අදහසක් ගත හැකිවුවත්, ඒවා සිදුවන අපරාධමය සිදුවීම්වල සැබෑ තත්ත්වය නොවන බව ද සඳහන් කළ යුතු කරුණකි. විශේෂයෙන් ම සංඛ්‍යා දත්තයන්ට ඇතුළත් නොවන බොහෝ අපරාධ අප සමාජයේ සැඟවී යන බැවින් කාන්තාවන් මෙන් ම ගැහැණු ළමුන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය නොඑසේ නම්, කාන්තා අපරාධ වින්දිතභාවය සම්බන්ධයෙන් නිසි අදහසක් සපයා ගැනීම අපහසු කරුණකි.

විශේෂයෙන් නූතන සමාජයේ කාන්තා අපරාධ වින්දිතභාවයේ ස්වරූපයන් හඳුනාගැනීමේ දී එය විවිධාකාර බවක් ගන්නා බව පැහැදිලිය. මේ අතර කැපී පෙනෙනුයේ කාන්තාවන්ට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය ප්‍රකාශ කිරීම හා ලිංගික ප්‍රචණ්ඩත්වයයි. ඒ අනුව බොහෝ ගැහැනු දරුවන් විශේෂයෙන් ම කුඩා දරුවන් ලිංගික වශයෙන් අපයෝජනයට පාත්‍රවීම මෙහිදී විශේෂයෙන් හඳුනාගත හැකි කරුණකි. මෙකී තත්ත්වය ගැහැනු දරුවන් දැනුවත්ව මෙන් ම නොදැනුවත්වම සිදුවන බව වාර්තා වන සිදුවීම් හරහා නිගමනය කළ හැකිය. එහිදී ඉතා කුඩා වයසේ පසුවන දැරිවියන් නොදැනුවත්භාවය නිසා තමාගේ ළඟම ඥාතීන්ගේ ගොදුරක් වන ආකාරය හා සම්බන්ධ විවිධ සාක්ෂි පවතී. මෙම ඥාතීන් අතර තම පවුලේම පිරිමි සාමාජිකයින් සිටීම අතිශය ශෝචනීය කරුණකි. මෙම තත්ත්වය ඉතා කනගාටුදායක මෙන් ම වහ වහා පිළියම් යෙදිය යුතු අවස්ථාවකි. නිවස ආරක්ෂාකාරී ස්ථානයක් ලෙස අප සැළකුවත් නූතනය වන විට මෙවැනි අපරාධ සම්බන්ධයෙන් අතිශය තීරණාත්මක ස්ථානයක් බවට පත් වී හමාරය.

විශේෂයෙන් ම බොහෝ ගැහනු දරුවන් නොදැනුවත්භාවය හා අනාරක්ෂිත වීම හේතුවෙන් මෙවැනි අපරාධ වින්දිතභාවයට පත්වීම නිසා කුඩා ගැහනු දරුවන්ට තම ශරීරය පිළිබඳ පවත්නා ආරක්ෂාව පිළිබඳවත්, එය සළසා ගත යුතු ආකාරය පිළිබඳවත් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. අනෙක් අතට දරුවාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවම වශයෙන් දරුවාගේ දෙමාපියන්ට, විශේෂයෙන් මවට තිබෙන වගකීම අතිශය විශාල එකකි. සෑම අවස්ථාවකදීම සැලකිලිමත්ම කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වනුයේ නූතන සමාජය සෑම

පැතිකඩකින් ම විනාශ මුඛයට පත්වී ඇති බැවිණි. නවීකරණය වූ සමාජ සන්දර්භය තුළ ඥාති සබඳතා ඈත්වීමත්, නවීන තාක්ෂණික මෙවලම්, අන්තර්ජාලය සෑම පුද්ගලයෙකුම යටපත් කොට ගෙන තිබෙන බැවින් ලිංගික අපරාධ ඉහළ යාමේ තත්ත්වයක් දැක ගත හැකිය. එබැවින් තම දරුවාගේ ආරක්ෂාව පිළිබඳ ඉතා ඉහළ වගකීමකින් කටයුතු කිරීමට දෙමාපියන්ට වගකීමක් පවතී.

අනෙක් අතට දැනුවත්වම මෙවැනි අපරාධවල ගොදුරක් වන යෞවන වයසේ පසුවන දැරිවියන් හා සම්බන්ධ විවිධ පුවත් වාර්තා වේ. බොහෝ අවස්ථාවලදී පාසල් වයසේ පසුවන දැරිවියන් ප්‍රේම සබඳතා මුල්කොට ගෙන ලිංගික අපරාධවල ගොදුරු බවට පත්වේ. මෙවැනි තත්ත්වයකට යොමු වීම චිත්තවේගීමය හෝ භාවාත්මක බැඳීමකින් නොඑසේ නම්, හැඟීම්වලට මුල්තැන දීමක් වුවද ඉන් අනතුරුව සිදුවන හිංසනය සම්බන්ධයෙන් නැවත නැවතත් අවධානය යොමු කළ යුතුවේ. මෙවැනි ආකාරයේ අපරාධ වින්දිතභාවය නිසාවෙන් තරුණ වයසේ සිටින බොහෝ ගැහැනු දරුවන්ගේ අනාගත ජීවිතය සම්පූර්ණයෙන් ම පාහේ විනාශ වන බැවින් නව යොවුන් වයසේ සිටින දැරිවියන්ට තවදුරටත් ලිංගික අධ්‍යාපනය හා තම ශරීරය හා සම්බන්ධ ආරක්ෂාව කුමන අවස්ථාවක වුවද සළසා ගත යුතු ආකාරය පිළිබඳ අධ්‍යාපනය ලබාදිය යුතුය. එය මෙවැනි හිංසනයන් වළක්වා ලීමට වඩාත් සුදුසුම පිළියම වශයෙන් හඳුන්වා දිය හැකිය.

ලිංගික ප්‍රචණ්ඩත්වය හා හිංසනය මෙන් ම කාන්තාවන් තවත් ආකාරයේ අපරාධ වින්දිතභාවයට පත්වන අවස්ථාවක් ලෙස පවුල තුළ සිදුවන කායික හා මානසික ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම හඳුනාගත හැකිය. බොහෝ විට තම ස්වාමිපුරුෂයා හෝ සහකරුවගේ ප්‍රචණ්ඩත්වයට පාත්‍රවීමට බොහෝ කාන්තාවන්ට සිදුවනු ඇත. මෙකී තත්ත්වයට හේතු විය හැක්කේ අප සමාජයේ තරයේ ගිලා බැස ඇති ස්ත්‍රී පුරුෂ සමාජ අසමානතාවය හා සම්බන්ධ ඇගයීමයි. පවුල තුළ ප්‍රධානියා වශයෙන් පුරුෂයා ක්‍රියාත්මක වන විටත්, ස්ත්‍රී පුරුෂ අසමාන වූ සම්පත් මෙන් ම කාර්යයභාර විභේදනයත්, සමාජීය ඇගයීම කාන්තාවට ද්විතීයික ස්ථානය හිමිවීමත් නිසා ඇය නිරන්තරයෙන් පුරුෂයාගේ යටහත් පහත් තත්ත්වයට පත්වීම හේතුවකි.

විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි දකුණු ආසියාතික රාජ්‍යයක් තුළ ක්‍රියාත්මක වන පුරුෂාධිපත්‍ය මෙන් ම ඉහත කී ස්ත්‍රී පුරුෂ අසමාන බල ව්‍යාප්තිය මෙවැනි හිංසාවන්ට හා ප්‍රචණ්ඩත්වයන් වර්ධනය වීමට හේතුවක් වනු ඇත. එසේ නම් කළ යුත්තේ මෙම අසමාන බල ව්‍යාප්තිය දුරුකිරීමයි. විශේෂයෙන් ම පවුල තුළ මෙවැනි අසමානාතා දුරුකිරීමට පුද්ගලානුබද්ධ වශයෙන් මෙන් ම සාමූහික වගවීමක් ද සංස්ථාපනය කළ යුතුය. දරුවන්ට කුඩා වයසේ සිටම මෙම ධර්මතා, පිළිගැනීම, චර්යා හුරුපුරුදු කළ යුතුය. සෑම පුද්ගලයෙකුටම ගරු කිරීමටත්, අයිතීන් සුරකීමටත්, වගකීම් ඉටුකිරීමටත් කියා දිය යුතුය. අනෙක් අතට වැඩිහිටියන් වශයෙන් තම සාම්ප්‍රදායික හණමිටි අදහස් ඉවත ලා

සමානාත්මතාවයට ඉඩ දීම සඳහා එක් තැන්වීම අත්‍යාවශ්‍ය කරුණකි.

බොහෝවිට සාමාජීය වශයෙන් පවත්නා ස්ත්‍රී පුරුෂ අසමානතාවය තුරන් කිරීම කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසාව හා පීඩාව මෙන් ම අපරාධ වින්දිතභාවය අවම කිරීමට සුදුසුම පිළියමක් වියහැකිය. අනෙක් අතට සමාජයේ ගැඹුරින් ගිලා බැස ඇති ආර්ථික සාධකවල අසමානතාවය තුරන් කළ යුත්තකි. හුදෙක් ආර්ථික සාධකය හා බලය යනු එකම කාසියේ දෙපැත්තක් වන බැවින් කාන්තාවන් ද ආර්ථික වශයෙන් පුරුෂයා හා සමාන කිරීම නිසා ප්‍රචණ්ඩත්වය වළක්වා ගත හැකිය. ඇය ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කළ යුතුය. එහිදී අධ්‍යාපනය හා හැකියාවන් අතින් සමෘද්ධිමත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙකී තත්ත්වය විශේෂයෙන් ම පවුල තුළ සිදුවන වින්දිතභාවයට පිළියමක් වනු ඇත. අනෙක් අතට සංස්කෘතික හා ආගමික විශ්වාස මත සිට කාන්තාවන් පීඩාවට හා හිංසාවට පාත්‍රකිරීමත්, ඉන් අපරාධ වින්දිතභාවයට පාත්‍රකිරීමත් අවම කිරීම සඳහා සමාජීය වශයෙන් ඉතා ඉහළ වගකීමක් සෑම පුරවැසියෙකු සතුව ම පවතිනු ඇත. ආගම හෝ සංස්කෘතිය පැවතිය යුත්තේ හුදෙක් පුද්ගල සංවර්ධනය (ලෞකික හා ලෝකොත්තර) මෙන් ම සමාජ සංවර්ධනයට විනා පීඩාවට නොවිය යුතු බැවින්, කාන්තාවන්ගේ වින්දිතභාවය වළක්වාලන මෙවලමක් ලෙස ආගමික හා සංස්කෘතික අගනාකම් දියුණු වීම අවශ්‍යයෙන් ම සිදුවිය යුතුය. මෙවැනි තත්ත්වයන් තුළ ද ගැහැනු දරුවන් හා කාන්තාවන්ට නිසි ගෞරවය හා ආරක්ෂාව සැලසීම සෑම පුරවැසියෙකුම සතු වගකීමක් ලෙස සිතන්නේ නම් දිනෙන් දින වාර්තා වන කාන්තා හිංසනය හා අපරාධ වින්දිතභාවය සැබවින්ම වළක්වා ගත හැකිය.

මූලාශ්‍ර

• හේවාවසම්, කේ. එන්. (2013). අපරාධ වින්දිතයෝ. මරදාන, ගොඩගේ ප්‍රකාශකයෝ.
•Hentig, H. V., (1948), The Criminal and his Victim, New Heaven, Yale University Press.
• Women victims by type of grave crimes against persons 2015 – 2019. Retrieved tatistics.gov.lk/GenderStatistics/StaticalInformation/ViolenceAgainstWomen/WomenVictimsByTypeOfGraveCrimesAgainstPersons2015-2019



# Invest in Women: Accelerating progress through poverty Reduction in Sri Lanka

**R.A.C Kanchana**
**Lecturer in Development Studies**
**Department of Geography**
**University of Kelaniya**
**chesikak@kln.ac.lk**

The UN WOMEN theme of women's day 2024 is "Invest in Women Accelerating progress". Investing in women tackles one of the most critical social and economic issues of current time. As with most threats to well-being, poverty has an accentuated impact on women. To tackle these issues, it is required integrated action addressing the challenges women face in the world today's world. There are distinctions between poverty, economic security, economic insecurity, wealth, assets, but they are used interchangeably in achieving Development.

When focus on to Sri Lankan context one of the major development challenges for women is facing is Poverty. Sri Lanka has a track record of strong human development achievements compared to other South Asian and comparable economies. The country achieved the overarching Millennium Development Goals (MDGs) target of halving poverty at the national level seven years before the 2015 MDG deadline, and between 2002 and 2012-2013 alone reduced poverty from 13.2 to 3.2 percent of people living on less than $1.25 a day.

A long tradition, dating back to post-independence, of extensive investment in success's, health and poverty alleviation programmes, coupled with economic growth averaging 6-7 percent a year over the past decade explain Sri Lanka' development success. Yet covid 19 pandemic and the current economic crisis have worsened the situation. As the entire world is emerging multiple issues that are putting enormous pressure on the people and their communities, achieving gender equality is more vital than ever.

"Transforming our world: the 2030 Agenda for Sustainable Development", (2030 Agenda) declared that eradicating poverty in all its forms and dimensions, including extreme poverty, is one of the greatest global challenges and priorities and an indispensable requirement for sustainable development." (IPS, UNWOMEN,2017). Sustainable Development Goal 1 (SDG 1) directed to eradicate extreme poverty everywhere by 2030, reduce the proportion of women, men and children of all ages living in poverty in all its dimensions by half, and to provide social protection covering them. It also sets out the need for everyone to have access, ownership and control over productive resources and essential services. "Globally, 383 million women and girls are estimated to live on less than USD 1.90 a day, compared with 368 million men and boys. The vast majority live in just two regions: sub-Saharan Africa (63%) and Central and Southern Asia (21%)" (SDG Action,2021). Interventions that aim to reduce poverty and increase economic security would be the effective solutions to address the poverty in women.

The UNWOMEN poverty reduction strategy aims to address poverty related risk factors and following protective factors.

Table 01: Poverty Reduction Strategy
Level Risk Factors Protective factors

| Level | Risk Factors | Protective factors |
|---|---|---|
| Individual | Economic insecurity (women and men) | Economic security (women and men) |
| | Poverty-related stress and poor behavioral coping strategies (men and women) | Psychosocial wellbeing (men and women) |
| | Low self-efficacy and self-esteem (women) | High efficacy and self-esteem (women)<br>Financial autonomy (women) |

| | | |
|---|---|---|
| Interpersonal | Insecure and unstable household economic status (including low wealth, financial assets and food security) | Secure and stable household economic status (including high wealth, financial assets and food security) |
| | High levels of household stress and intra-household conflict | Low levels of household stress and intrahousehold conflict |
| | High levels of inequality in intimate partner and in-law relationships | Intimate relationships characterized by gender equality including shared decision making and household responsibilities |
| Community | High levels of poverty and unemployment | Low levels of poverty and unemployment |
| | High levels of economically motivated crime | Low levels of economically motivated crime |
| Societal | Low levels of women's employment | High levels of women's employment |
| | Economic shocks (including economic downturns, disasters, conflict) | Strong economic social safety nets and social protection |
| | | Economic stability |

Source: UNWOMEN, WHO, 2020

As indicated in table 01, between the individual and interpersonal risk factors always prevail an obstacle in achieving development. The proposed protective factors focus on supporting a person or household to develop economic assets through increased employment, labor force participation or earning. When focusing on poverty reduction strategies in Sri Lanka it is required to focus on rural sector as rural sector compromise the higher poor population in Sri Lanka.

"Poverty has risen since 2019, from 11.3 to 12.7 in 2020, adding over 300,000 new poor in that period. It continued to increase in 2021, and it then doubled between 2021 and 2022, from 13.1 to 25.0 percent ($3.65 per capita, 2017 PPP). This increase has added an additional 2.5 million people into poverty in 2022. Households have been impacted from different fronts as prices rose by 46 percent in 2022, jobs in services and industry contracted" (World Bank,2023). Urban and rural poverty are estimated to have tripled and doubled, to respectively 15 and 26 percent in 2022, Poverty is projected to remain above 25 percent in the next few years due to the multiple risks to households' livelihoods (World Bank,2023). Spatial inequality is also one of the major concerns.

The key areas that the Sri Lanka can focus on inclusion of women into the development process and invest can be identified with special reference to several key areas; Along with investing in agriculture, funding and encouraging female education, creating employment opportunities, enable access to financial assistance for non-farming jobs would be all beneficial for poverty eradication in Sri Lanka.
According to the World Bank, 45.5% of Sri Lanka is agricultural land. Accordingly, increase agricultural productivity is a prerequisite for further economic growth. In 2021, the World Bank data showed that more than 30% of Sri Lanka's population worked in the agricultural sector and that it makes up 7.4% of its national GDP. Considering afore factors Sri Lanka has a lot of potential in the agricultural industry, due to its fertile land, however, productivity is lacking. "Agriculture still engages nearly a third of the country's workforce, with a quarter in the industrial sector, and 67 percent of all workers being informally engaged in 2019.

Women's participation in the paid workforce at 36 percent was among the lowest in the region, while high levels of educated youth unemployment are worrisome features as the population ages rapidly and skills" (UNWOMEN,2022). As agricultural small holders and home gardeners, rural women play significant roles in food production, towards household food consumption, while keeping nutrition levels from deteriorating. Women engage in minor crop cultivation, livestock management, food preparation, seed

conservation, and the transmission of traditional knowledge, while building climate resilience. Despite their critical contributions, they remain invisible in national data and policy frameworks, and several barriers remain as obstacles in achieving equitable participation in agriculture knowledge development, technology transfer, climate smart cultivation, market promotion, and key government initiatives in agricultural advancement.

"Rural women constitute a quarter of the global population and are the driving force behind food systems, poverty reduction, climate resilience, and the overall well-being of rural communities. Their unwavering commitment and resilience lay the very foundation upon which the prosperity of our rural landscapes is built" (UNDP,2023). According to the ILO, ensuring the equal opportunities for women with men could help rise agricultural production by 2.5% to 4 % in the poorest regions and the number of malnourished people could be reduced by 12 to 17 percent globally (UNDP,2023). Yet, women's potential is seriously hindered due to exclusion, particularly in terms of their access to land, livestock ownership, water sources, extension services, credit, and markets. They are equal paid and remain unrepresented in decision-making processes. To overcome aforesaid issues, increasing women's access to and control over economic opportunities, resources and services is a timely need. Therefore, the government policies and programmes should focus on increasing women's economic, social, and political leadership at all levels, including through women's organizations and collectives.

Macro-economic policies aim to support the creation of full and productive employment opportunities and decent work for women. Proper financial assistance required to achieve the target. The government should focus on expanding or reprioritize public expenditure towards gender responsive social protection for both men and women. As there are higher number of informal women employments it should necessarily focus on including minimum wages and secure labor contracts, worker benefits and labor rights for informal workers. Workplace discrimination and gender-based violence should be eliminated as this situation may directly affect the individuals working less effectively. Accordingly, as there is

urgent need for equitable engagement of both male and female into the development process it is vital to government and other respective authorities to focus on invest in imperative fields under key goals and objectives emphasize virtuous vison and mission in development arena.

References

• Azcona, G. (2023, March 6). Poverty is not gender-neutral. SDG Action. https://sdg-action.org/poverty-is-not-gender-neutral/#:~:text=Globally%2C%20383%20million%20women%20and

• Department of Census and Statistics. (2020) Sri Lanka Labour Force Survey. Annual Report - 2020. [online]. Available at:http://www.statistics.gov.lk/LabourForce/StaticalInformation/AnnualReports/2020[Accessed 10 May 2022].

• Hartmann, H. I. (2012). Women, Work, and Poverty. Routledge.
International Women's Day 2024: "Invest in women: Accelerate progress." (2023, December 14). UN Women - Headquarters. https://www.unwomen.org/en/news-stories/announcement/2023/12/international-womens-day-2024-invest-in-women-accelerate-progress

• Poverty reduced. (n.d.). Retrieved February 23, 2024, from https://www.unwomen.org/sites/default/files/Headquarters/Attachments/Sections/Library/Publications/2020/RESPECT-implementation-guide-Strategy-summary-Poverty-reduced-en.pdf

• Sustainable Development Goal 1: No poverty. (n.d.). UN Women. https://www.unwomen.org/en/news/in-focus/women-and-the-sdgs/sdg-1-no-poverty#:~:text=By%202030%2C%20ensure%20that%20all
World Bank. (2023). "Poverty and Equity Brief: South Asia, Sri Lanka [Review of Poverty and Equity Brief: South Asia, Sri Lanka]". World Bank Group.

• UNDP .( 2023),"Celebrating rural women as heroes in enhancing Sri Lanka's food security". Retrieved February 24, 2024, from https://www.undp.org/srilanka/blog/celebrating-rural-women-heroes-enhancing-sri-lankas-food-security#:~:text=Rural%20women%20constitute%20a%20quarter

# ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩසටහනක් සඳහා ව්‍යාපෘති වාර්තාවක් ලියන්නෙ කොහොම ද ?

## ව්‍යවසායිකාවන් ලෙස ගොඩනැගෙන්නට වෙරදරන දිරිය කාන්තාවන්ට

**පී එල් සුසන්ත ධර්මකීර්ති.**
MA (Geo) Kelaniya, BSc. (Bio) Ruhuna, Dip. (Planning) MAFS,
**නියෝජ්‍ය අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය.**

කාන්තාවන් නිවසේ, හෝ සමාජයේ විවිධ වූ බහුවිධ කාර්යයන් සඳහා විශිෂ්ඨතාවයක් නිතැතින්ම දක්වනවා. නිවස බිරිඳක, මව, වර්තමානයේ මේ කාන්තාව මවක භූමිකාවෙන් මිදී රැකියාවක, ව්‍යාපාරයක යෙදෙමින් පවුලට ශක්තියක් වෙන්න ඇගේ සමාජ-ආර්ථික පසුබිම පෙළඹවීමක් කරනවා. පවතින ක්‍රමය තුළ රැකියාවක යෙදෙන්න හැම කාන්තාවකට නොහැකි වෙලා තියෙන්නෙ. නමුත් කුමන හෝ ආකාරයක ව්‍යාපාරයක යෙදන්න යම් කිසි ඉඩක් කාන්තාව ට තියෙනවා. ඒක තමන්ගෙ හැකියාව හා දක්ෂතාවය අනුව වෙනස්. ගමේ කොළ කැඳ කඩයක ඉඳල ජාත්‍යන්තර වෙළඳපොළ එක්ක සම්බන්ධ ඇඟලුම් කම්හලක් දක්වා වෙනස් වෙන්න පුලුවන්. කාන්තා ව්‍යවසායිකාවක් කියල හඳුන්වන්නෙ මෙවැනි කාන්තාවන්.

සංවර්ධන ක්‍රියාවලියේ දී මේ හැම එකක්ම හඳුන්වන්නෙ ව්‍යාපෘති කියලයි. පුද්ගලයෙක් හෝ කණ්ඩායමක සංවර්ධන අපේක්ෂාවක් යතාර්ථයක් බවට පත්වෙන්නෙ මේ ව්‍යාපෘතියක් හරහා යි.

ව්‍යාපෘතියක් පිළිබඳ කිසියම් අදහසක් ඇති වූවහොත් ඒක යම් ලේඛනයක ට පරිවර්තනය විය යුතුමයි. එවැනි ලියවිල්ලක් හඳුන්වන්නෙ ව්‍යාපෘති වාර්තාව කියලයි. එවැන්නක් ලියන්න ප්‍රවේශයක් විදිහට, ව්‍යාපෘති පිවිසුම නැත්නම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක ප්‍රමුඛතාවන්, අපේක්ෂාවක්, විභවතාවක් ('විභවතාව' යනු පුද්ගලයෙක් සතුව පවතින හැකියාවන් හෝ යම් ස්ථානයක පවතින සම්පතක් ඵලදායී කටයුත්තක ට යෙදවීමේ හැකියාවයි) ව්‍යාපෘතිය දක්වා පැමිණීම ගැන යම් අදහසක් ලබා ගැනීම වැදගත් වෙනවා.

### ව්‍යාපෘති පිවිසුම.

රටක ජීවත්වන ජනතාවට යහපත් ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය වන සමාජ හෝ ආර්ථික පසුබිමක් නිර්මාණය කර ගැනීම මූලික අවශ්‍යතාවක්, ඒ සඳහා එම ජනතාවගේ ප්‍රමුඛතාවයන්, අපේක්ෂාවන් හෝ ඒ සඳහා පවතින විභවතාවන් විධිමත් ව කළමනාකරණය කිරීම අවශ්‍ය වේ.


යම් රටක ජනතාවක විසින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකින් පත් කරගන්නා පාලන ව්‍යුහයක් තුළ ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම අනිවාර්යය වන අතර, රජය එම ප්‍රමුඛතාවයන් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයක් වනුයේ ඒ සඳහා සුදුසු 'ප්‍රතිපත්ති' සම්පාදනයයි. වාර්ෂික අය වැය ප්‍රකාශය එම ප්‍රතිපත්ති රාශියක එකතුවයි.

මෙම ප්‍රතිපත්ති තුළ ජනතාව ඒ ඒ විෂය පිළිබඳ ප්‍රවීණයන් හෝ මහජන නියෝජිතයින් විසින් හඳුනාගන්නා වූ එක් එක් ප්‍රමුඛතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාපිතව බලය පැවරී ඇති ආයතන විසින් 'සැලැස්ම' සකස් කරනු ලබන අතර, ඒ සැලැස්ම තුළ විවිධ 'වැඩසටහන්' අන්තර්ගතව පවතී.

නිදසුනක් විධියට අය වැය ප්‍රතිපත්ති ප්‍රකාශයේ රටේ සියලුම ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙනවා කියල සඳහන් වෙලා තියෙනවා නම් 'පානීය ජලය' විෂය භාර අමාත්‍යාංශය ඒ සඳහා ජාතික 'සැලැස්ම' සකස් කළ යුතුයි. ඉන් පසුව එක් එක් ප්‍රදේශ පදනම් කරගෙන ඒ සඳහා ගැලපෙන 'වැඩසටහන' ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල සකස් කරනවා. මේ වැඩසටහන් නල ජලය, ළිං ජලය, වැසි ජලය කලමනාකරණය වගේ ප්‍රදේශයට ගැලපෙන විධියට වැඩසටහන් කීපයක් වෙන්න පුලුවන්. ඉන් පසුව නිශ්චිත ප්‍රදේශ, නිශ්චිත ප්‍රතිලාභීන් ඉලක්ක කරමින් වැඩසටහන් තුළ හඳුනාගත් 'ව්‍යාපෘති සැලසුම් කරනවා.

'වැඩසටහන' අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතර, වැඩසටහන 'ව්‍යාපෘති' රාශියක එකතුවකි. මෙම ව්‍යාපෘති සමාජ-ආර්ථික ගැටළු නිරාකරණය සඳහා සකසන ලද අරමුණු, ක්‍රියාකාරකම්, යෙදවුම් හා නිමැවුම් කට්ටලයකි. නැතහොත් නිශ්චිත මුදලකට නිශ්චිත කාලයක් තුළ නිශ්චිත අරමුණක් හෝ කීපයක් ඉටුකර ගැනීමට කරනු ලබන සැලසුම් සහගත ක්‍රියාවලියකි' ලෙස විවිධ අර්ථ දැක්වීම් හා නිර්වචන පවතී.

රූපය 1 ඃ ව්‍යාපෘති පිවිසුම.




## ව්‍යාපෘතිය

ඒ අනුව ජනතාවගේ ප්‍රමුඛතාවන් සඳහා බිම් මට්ටමේ දී ලබා දෙන, ගැටලුවකට විසඳුමක් හෝ විභවතාවයක් සංවර්ධනය කිරීමක් ලෙස ව්‍යාපෘති සරලව හැඳින්විය හැකිය. ඒ අනුව ව්‍යාපෘතිය

- නිශ්චිත අරමුණ හෝ අරමුණක්
- නිශ්චිත කාල සීමාවක්

- එකිනෙක බැඳුනු ක්‍රියාකාරකම් සමූහයක්
- නිශ්චිත භෞතික හෝ මානව සම්පත්
- නිශ්චිත ප්‍රතිලාභීන්
- අපේක්ෂිත තත්වයන්
- නිශ්චිත ඇස්තමේන්තුවක්
- නිශ්චිත භූගෝලීය ප්‍රදේශයන් යන සුවිශේෂීතා රාශියක එකතුවකි.

ඒ අනුව ව්‍යාපෘතිය සමාජීය හෝ ආර්ථික සංවර්ධන කාර්යයන් මෙහෙයවනු ලබන ආයතනයකට හෝ නිලධාරීන්ට වඩාත් සමීප සංවර්ධන මෙවලමකි.

රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සම්බන්ධව විශේෂයෙන් සැලකීමේ දී, ව්‍යාපෘතියේ ස්වභාවය, ප්‍රමාණය හා කාර්යභාරය වැනි සාධක මත විවිධ බෙදීම් දැකිය හැකිය. එනම්

- ජාතික සංවර්ධන ව්‍යාපෘති
- ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති
- ආයතනික සංවර්ධන ව්‍යාපෘති
- පවුල් සංවර්ධන ව්‍යාපෘති
- ව්‍යවසායක සංවර්ධන ව්‍යාපෘති

කාන්තා ඔබට ව්‍යවසායක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම වැදගත් නිසා මෙහි දී විශේෂ අවධානය යොමු කරන්නෙ සුළු හෝ මධ්‍ය පරිමාණයේ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය මූල්‍ය, ද්‍රව්‍ය හෝ උපදේශනාත්මක අනුග්‍රහයක් සඳහා ආයතනයක් වෙත ඉදිරිපත් කල යුතු ව්‍යාපෘති වාර්තාව පිළිබඳවයි.

යම් කිසි ව්‍යාපෘතියකට මේ මූල්‍ය පහසුකම් එක වරම ලබා ගන්න බැහැ. අනුග්‍රාහක ආයතනය හෝ බැංකු වැනි මූල්‍ය ආයතනයන් ඒ සඳහා යම් සොයා බැලීමක් සිදු කරනවා. ඒ සඳහා ආයතනයෙන් ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව හෝ ව්‍යාපෘති වාර්තාවක් ඔබෙන් ඉල්ලන්න පුලුවන්.

මොකක් ද මේ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව හෝ ව්‍යපෘති වාර්තාව කියන්නෙ? සංවර්ධන විෂය ගැන වැඩි අවබෝධයක් නැති නම් එක විට අදහසක් එන්නෙ නෑ.

## ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව

ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව කියන්නේ සැලසුම් කළ ව්‍යාපෘතියකට මූල්‍ය, ද්‍රව්‍ය හෝ උපදේශනාත්මක අනුග්‍රහයක් අපේක්ෂා කරන්නේ නම් එම අනුග්‍රහය ලබාදෙන ආයතනයට ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘතිය පිළිබඳ මූලික විස්තරයයි.

එය ව්‍යාපෘතිය වැදගත් වන්නේ ඇයි ද යන්න සහ එයින් ප්‍රතිලාභ ලබන්නේ කවුරුන් ද යන්න ප්‍රකාශ කරන පැහැදිලි, උද්‍යෝගිමත් භාෂාවක් භාවිතා කරමින්, ව්‍යාපෘතියේ

අරමුණු, අරමුදල් හෝ පහසුකම් සැපයෙන ආයතනයේ අරමුණු සමඟ ගැලපෙන බව අනුග්‍රාහකයාට පෙන්වීම සඳහා වඩාත් සුදුසු ආකාරයකින් සකස් කළ යුතු වෙනවා. මේ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව සඳහා වන නිශ්චිත ආකෘතියක් නිර්මාණය කරලා නෑ. ව්‍යාපෘති සංකල්පය ඉදිරිපත් කරන ආයතනය අනුව ආකෘතිය වෙනස් වෙන්න පුලුවන්. ඒ වගෙ නිශ්චිත අකෘතියක් හඳුන්වා දී නොමැති අවස්ථා වලදී ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා පහත ආකෘතිය භාවිතා කළ හැකියි.

### පිට කවරය

- ව්‍යාපෘතියේ නම
- සකස් කළ දිනය
- ආයතනය, සංවිධානය හෝ ඉදිරිපත් කරන අයගේ නම
- ලිපිනය, දුරකතන අංක, ෆැක්ස් අංක, විද්‍යුත් ලිපිනය

### 1 කොටස

- විධායක සාරාංශය
- ක්‍රියාත්මක ආයතනය

(ආයතනය/සංවිධානයෙ හෝ ඉදිරිපත් කරන අයගේ නම, ලිපිනය, දැක්ම හා මෙහෙවර, සංවිධාන ව්‍යුහය, සම්පත්, පලපුරුද්ද හා හැකියාවන්)

### 2 කොටස

- ව්‍යාපෘතියේ නම
- අංශය
- ව්‍යාපෘති වර්ගය
- පිහිටීම
- අවශ්‍යතාවය සාධාරණීකරණය හෝ තාර්කික බව
- අරමුණු
- පුළුල්/සංවිධාන අරමුණ
- විශේෂිත අරමුණු
- නිමැවුම
- ක්‍රියාකාරකම්
- පාරිසරික බලපෑම
- ව්‍යාපෘතිය සඳහා ඇති විකල්ප
- අවදානම් සහ උපකල්පන
- ඇස්තමේන්තුව
- ක්‍රියාත්මක සැලැස්ම
- කාන්තා සහභාගීත්වය

ඔබ ඉදිරිපත් කරන ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව අනුව අනුග්‍රාහක ආයතනය මේ සංකල්පයට අනුව සාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න පුලුවන් කියල තීරණය කළොත් ආයතනය මේ සඳහා ව්‍යාපෘති වාර්තාව ලබා දෙන්න දන්වනවා.

ආකෘතියෙ සියලුම දේ වැදගත් නමුත් ව්‍යාපෘතියෙ විධායක සාරාංශය නම, අවශ්‍යතාවය හෝ සාධාරණීකරණය, අරමුණ, පාරිසරික බලපෑම, ඇස්තමේන්තුව, වඩා වැදගත් වෙනවා. මේ අතරින් විධායක සාරාංශය වඩා වැදගත්. විධායක සාරාංශය කියන්නෙ ව්‍යාපෘතිය සම්පූර්ණ විස්තරය ඉතා සරලව හා කෙටියෙන් විස්තර කරන සටහන. ඔබ ඉදිරිපත් කරන ආයතනයේ කළමණාකාරිත්වය මුලින් ම බලන්නෙ මේ කොටස ඒ තුළින් ගන්න මූලික අදහසින් තමයි ව්‍යාපෘති සංකල්පය තව දුරටත් සලකා බලනවද කියල තීරණය කරන්නෙ.

## ව්‍යාපෘති වාර්තාව

ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව මගින් ඉදිරිපත් කළ ව්‍යාපෘතියකට මූල්‍ය, ද්‍රව්‍ය හෝ උපදේශනාත්මක අනුග්‍රහයක් ලබාදීමට එකඟ වූ ආයතනයට හෝ පුද්ගලයෙකුට ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘතිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවයි.

ව්‍යාපෘති වාර්තා සඳහා ද නිශ්චිත ආකෘතියක් නිර්මාණය කරල නැහැ. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ආයතන හෝ සංවිධාන විසින් තමන්ගෙ අවශ්‍යතාවය අනුව ආකෘති නිර්මාණය කරන්න පුලුවන්. ඒ වගෙ නිශ්චිත ආකෘතියක් තියෙන අවස්ථාවක ඒ ආකෘතියෙන් ම ලබා දිය යුතුයි.

ඒ අනුව නිශ්චිත අකෘතියක් හඳුන්වා දී නොමැති අවස්ථාවල දී ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන්න මෙම ආකෘතිය භාවිතා කළ හැකිය. ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක ඇතුළත් කරුණු වගේම තවත් අමතර කරුණු රාශියක් මේ ව්‍යාපෘති වාර්තාව ට ඇතුළත් වෙනවා.

## පිටකවරය

- ව්‍යාපෘතියේ නම
- සකස් කළ දිනය
- ආයතනය, සංවිධානය හෝ ඉදිරිපත් කරන අයගේ නම
- ලිපිනය, දුරකතන අංක, ෆැක්ස් අංක, විද්‍යුත් ලිපිනය

## 1 කොටස

- විධායක සාරාංශය
- ක්‍රියාත්මක ආයතනය
- (ආයතනය/සංවිධානයේ නම, ලිපිනය, දැක්ම හා මෙහෙවර, සංවිධාන ව්‍යුහය, සම්පත්, පලපුරුද්ද හා හැකියාවන්)


## 2 කොටස

- ව්‍යාපෘති පසුබිම / හැඳින්වීම.
- තත්ත්ව විග්‍රහය / ගැටළු හඳුනාගැනීම
- අවශ්‍යතාවය සාධාරණීකරණය හෝ තාර්කික බව
- ව්‍යාපෘති අරමුණ
- සමස්ත අරමුණ
- විශේෂිත අරමුණු
- ව්‍යාපෘති උපායමාර්ග
- ඉලක්ක කණ්ඩායම / ප්‍රතිලාභීන් (සෘජු හා වක්‍ර)
- අපේක්ෂිත නිමැවුම
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම
- ඇස්තමේන්තුව
- මෙහෙයුම හා ඇගයීම
- පාරිසරික බලපෑම
- අවදානම් සහ උපකල්පන
- කාන්තා සහභාගිත්වය
- තිරසාරකත්වය
- ඇමුණුම් / උප ග්‍රන්ථ

## ව්‍යාපෘති වාර්තා ලිවීම

සාර්ථක ව්‍යාපෘති වාර්තාව ලිවීම යම් තාක්ෂණික අවබෝධයක් සහ හැකියාවක් සහිතව කල යුතු කාර්යයක් නිසා ඒ සඳහා හොඳ සූදානමක් සහිතව යොමු වීම අවශ්‍යයි. විශේෂයෙන් ව්‍යාපෘතියක පියවරයන්, එහෙම නැත්නම් ව්‍යාපෘති චක්‍රය ගැන අවබෝධය අවශ්‍යයි.

## ව්‍යාපෘති චක්‍රය




රූපය 2 : ව්‍යාපෘති චක්‍රය.

ව්‍යාපෘති චක්‍රයේ 'සකස් කිරීම' කියන පියවර තමයි සරලව ව්‍යාපෘති වාර්තාව ලියවෙන අවස්ථාව. මේ සඳහා ව්‍යාපෘතිය පිළිබඳ පූර්ව අවබෝධයක් සහ ඉදිරිය ගැන පුරෝකතනය කිරීමේ හැකියාවක් තිබීම වැදගත් වෙනවා.

ඔබට ව්‍යවසායිකාවක් වශයෙන් හෝ ඒ සඳහා මඟපෙන්වන්නෙක් ලෙස ව්‍යාපෘති වාර්තාව ලිවීම පිළිබඳ පහත කරුණු වලින් අවබෝධයක් ලබා දෙන්නයි උත්සාහය.

**ව්‍යාපෘතියක් ලේඛනගත කිරීම අවශ්‍යය ඇයි ?**

ව්‍යාපෘතියක් යනු අනාගතයේ දී ඉටුකර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සමූහයක් කල්තියා සැලසුම් කිරීම කියලයි හඳුන්වන්නෙ. මෙම සැලසුම් කිරීම සිතිවිල්ලක් හෝ වචනවලට සීමා වූ කල්පිතයක් නොකොට ලේඛනගත කිරීම අවශ්‍යය වෙනවා. එමගින්

- ව්‍යාපෘතියට සම්බන්ධ සියලු දෙනාම ව්‍යාපෘතිය, එහි අරමුණු ඉටුකරවා ගැනීමට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත සැලැස්ම පිළිබඳ දැනුවත්වීම.
- ව්‍යාපෘතිය සාමූහික ප්‍රයත්නයකි, එයට සම්බන්ධ සියලු දෙනාටම තමාගේ වගකීමද, කවදා කොතනකදී කොතරම් පිරිවැය සීමාවක් තුළ ක්‍රියාත්මක කළ යුතුද දැනුවත්වීම.
- ව්‍යාපෘතිය නියාමනය හා ඇගයීමට පහසුවීම.
- අපේක්ෂිත අරමුණට ළගාවීමට නිරන්තරව අධ්‍යයනය කිරීමේ හැකියාව. ලැබෙනවා.

**ව්‍යාපෘති වාර්තාවක් ලිවීමේ රීතීන්.**

ව්‍යාපෘති වාර්තාවක් ලිවීම ගැන අනුගමනය කරනු ලබන යම් රීතී කීපයක් තියෙනවා. එයින් ව්‍යාපෘති වාර්තාවට වැඩි වටිනාකමක් ලැබෙනවා.

- ඍජුව කීම : ඉදිරිපත් කරනු ලබන කරුණු ප්‍රස්තුත කරුණු අදාලව ඍජුව ඉදිරිපත් කිරීම.

- පැහැදිළි බව : අර්ථ ව්‍යාකුල නොවන පරිදි තොරතුර ඵලදායක ලෙස ඉදිරිපත් කිරීම.

- සරල බව : ගැඹුර නොවන ක්ෂණිකව වටහාගත හැකි පරිදි භාෂාව භාවිතා කිරීම.

- සංක්ෂේපය : දීර්ඝ වාක්‍ය භාවිතා නොකර, පහසුවෙන් අවබෝධ වන කෙටි වාක්‍ය භාවිතා කිරීම.

- ප්‍රාණවත් බව : කියවන්නාට උනන්දුවක් ඇතිවන පරිදි ප්‍රාණවත් බස් වහරක් භාවිතා කිරීම

ඉහත කරුණු ගැන අවබෝධයක් සහ අවධානයක් යොමු කරමින් ව්‍යාපෘති වාර්තාවක අඩංගු විය යුතු ප්‍රධාන කරුණු කීපයක් ගැන මේ විධිහට විස්තර කරන්න පුලුවන්.

- **පිටකවරය**

1 ආයතනය / සංවිධානයේ ලාංඡනය
2 ව්‍යාපෘතියේ නම
3 සකස් කළ දිනය
4 ආයතනයේ නම
5 ලිපිනය, දුරකතන අංක, ෆැක්ස් අංක, විද්‍යුත් ලිපිනය, අන්තර්ජාල අඩවිය

■ **පටුන**

ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සකස් කළ පසුව පිටු අංකනය කළ යුතුය. මාතෘකා හා අනු මාතෘකා අනුව පහසුවෙන් පරිශීලනය කළ හැකි පරිදි සකස් කළ යුතුය

■ **විධායක සාරාංශය**

සවිස්තරාත්මක ව්‍යාපාති වාර්තාව සකස් කළ පසුව, ව්‍යාපෘතියේ වැදගත් කරුණු අවධාරණයට ලක් කරමින් ව්‍යාපෘතිය පිළිබඳව කෙරෙන සාරාංශයයි. ව්‍යාපෘතියේ අරමුණු හා උපායමාර්ග, ප්‍රතිලාභීන්, ව්‍යාපෘති නිමවුම, ව්‍යාපෘති කාලය, ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පිරිවැය හා ඇගයීම, තිරසාරකත්වය විස්තර කළ යුතුය.

කුඩා පරිමාණ ව්‍යාපෘතියක් සඳහා පේළි කීපයකද මහා පරිමාණ ව්‍යාපෘතියක් සඳහා A4 පිටුවක ප්‍රමාණයේ ද සාරාංශයක් ප්‍රමාණවත්වේ. (තනි කොලයේ ලේඛනය - One Page Document) ඉහත කරුණු ඇතුළත් වෙන්නෙ ව්‍යාපෘති වාර්තාවේ පළමු කොටසට, ව්‍යාපෘතිය ගැන අවධානය යොමු කරන කෙනාට මූලික අවබෝධයක් ලබා දෙන්නයි.

ව්‍යාපෘති වාර්තාවේ දෙවන කොටස තමයි ඉතාම වැදගත් වෙන්නේ. ව්‍යාපෘතිය පිළිබද සියලු විස්තර අඩංගු වෙන්නෙ මේ කොටසෙයි

■ **ව්‍යාපෘතිය හැඳින්වීම.**

ව්‍යාපෘතිය පිළිබඳ මූලික හැඳින්වීමක් අපේක්ෂා කරයි. ව්‍යාපෘතියේ ස්වභාවය, ව්‍යාපෘතියේ පිහිටීම, පරිපාලන, භෞතික පිහිටීම දැක්වීමයි. අවශ්‍ය අවස්ථාවන් හිදී දත්ත හා තොරතුරු වගු, ප්‍රස්ථාර, සිතියම්, ඡායාරූප ආදී වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

■ **තතත්ව විග්‍රහය හෝ ගැටළු හඳුනාගැනීම**

ව්‍යාපෘති අවශ්‍යතාවයේ පවතින සැබෑ තත්ත්වය හෝ විසඳුම් ලබාදිය යුතු ගැටළු හඳුනාගැනීම මෙහිදී විස්තර කල යුතුය. පවත්නා දත්ත හා තොරතුරු උපයෝගී කරගෙන පවත්නා තත්ත්වය විග්‍රහ කළ යුතුය. එම විග්‍රහය තුළින් ගැටළුව පෙන්වා දීම කළ යුතුයි. ඒ සඳහා යොදාගනු ලබන සැලසුම් මෙවලම් (Planning Tools) කීපයක් මේ විධියට දක්වන්න පුළුවන්.

- ගැටළු ගස විග්‍රහය
- SWOT (ශදුඅත විශ්ලේෂණය)
- සහභාගීත්ව ගැමි පිවිසුම
- සීඝ්‍ර ගැමි පිවිසුම
- ක්‍රියාකාරී සමීක්ෂණ ක්‍රමය
- අවශ්‍යතාවය සාධාරණීකරණය හෝ තාර්කික බව

ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමෙන් පසුව එහි අන්තර්ගතය හා වැදගත්කම වාර්තාව ඉදිරිපත් කරන ආයතනයට තර්කානුකූලව දක්වන සටහනයි.

- ව්‍යාපෘතියේ වැදගත්කම
- ව්‍යාපෘතිය හඳුනාගැනීම
- ක්‍රියාත්මක කිරීම තුළින් පවත්නා ගැටළු විසඳීමේ හැකියාව.
- ප්‍රතිලාභීන්
- ආයතනික, ජාතික හා ගෝලීය විෂය පථය හා ප්‍රතිපත්තීන්ට ඇති සම්බන්ධතාවය
- සම්පත් අවශ්‍යතාවය
- තිරසාරකත්වය
- ආයතනික හැකියාව, වැනි කරුණු ඇතුළත් කළ හැකිය.

ව්‍යාපෘතිය අනුමත වීම තීරණය වන ප්‍රධාන සාධකයක් වන්නේ ව්‍යාපෘති සාධාරණීකරණයයි. නීතිඥවරයෙකු තම පාර්ශවය වෙනුවෙන් අධිකරණය ඉදිරියේ තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඇති සාධාරණීය බව ආයතනයට පෙන්වා දීමට සමානයි කියලත් කියනවා.

- **ව්‍යාපෘති අරමුණු**

ව්‍යාපෘතිය මගින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන, අපේක්ෂාව හෝ අපේක්ෂාවන් තීරණය කර ඒ සම්බන්ධව කරනු ලබන ප්‍රකාශය අරමුණ ලෙස හඳුන්වයි. ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන අවසන් ප්‍රතිඵලයයි. අරමුණ හෝ අරමුණු ආකාර 2කින් ප්‍රකාශ කරයි.

- සංවර්ධන හෝ පුළුල් අරමුණු
- සුවිශේෂ අරමුණු

ව්‍යාපෘතියේ පුළුල් අරමුණ ව්‍යාපෘතිය මගින් සාක්ෂත් කරගැනීම අපේක්ෂා නොකරන අතර, දැක්මක් ඇති කරයි. සුවිශේෂ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල වන අතර, පුළුල් අරමුණ කෙරෙහි යාමට දායක වේ. පරමාර්ථයන් ළඟාකර ගැනීමට අදාලව මැනිය හැකි හා අවසන් ඵලයන් සුවිශේෂී අරමුණ වේ. සුවිශේෂී අරමුණ ‘SMART’ වියයුතුය යන්න සැලසුම්කරණයේ දී සඳහන් වේ.

- Specific - සුවිශේෂී
- Measurable - මැනිය හැකි
- Achievable -ළඟාකරගත හැකි
- Realistic - යථාර්ථවාදී
- Timeliness - කාලය

සුවිශේෂී අරමුණු ප්‍රකාශනයෙන් "කුමක් ද ?, කාට ද ?, කෙසේ ද ?, කවරදා ද ?, කොපමණ ද ?" යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

### ■ ඉලක්ක කණ්ඩායම / ප්‍රතිලාභීන්

ව්‍යාපෘතිය විශේෂයෙන් ඉලක්ක කෙරෙන කණ්ඩායම හා ඉන් සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලබන කණ්ඩායම පිළිබඳ විස්තරය අවශ්‍ය වේ. එය ස්ත්‍රීපුරුෂ භාවය, වයස් කාණ්ඩ අනුව, ආර්ථික මට්ටම අනුව හඳුනාගත හැකිය.

### ■ අපේෂිත නිමවුම.

ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන අවසන් නිමැවුම, නිෂ්පාදනය, නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ කරුණු පැහැදිලි කළ යුතුය. ඉන් ජනිත වන ආදායම, රැකියා අවස්ථා ගණන, වෙළඳපොළ තත්ත්වය වැනි කරුණු පැවතීම වඩා වැදගත් වේ.

### ■ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

ලේඛනයක් ලෙස ඉදිපත් කළ ව්‍යාපෘති සැලැස්ම යථාර්තයක් බවට පත් කිරීම 'ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම' වේ. එහි දී වන්නේ ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල හෝ සංවිධාන සැලැස්ම මැනවින් ඉදිරිපත් කිරීමයි. එය තුළ අදාල ක්‍රියා මාර්ගය, කාල සීමාව, වගකීම් දරණ අය දැක්විය හැකිය.

### ■ ව්‍යාපෘති ඇස්තමේන්තුව.

මෙය වාර්තාවේ වැදගත්ම කොටසකි. එහි දී ව්‍යාපෘතියේ 'ප්‍රාග්ධන වියදම්' හා 'පුනරාවර්තන වියදම්' වෙන් වෙන් ව දැක්විය යුතුය. ප්‍රාග්ධන වියදම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික වියදම හෙවත් ආයෝජනය කරනු ලබන මුදලයි. පුනරාවර්තන වියදම යනු ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා වන වියදම හෙවත් සේවක වැටුප්, සේවා හා පහසුකම් (විදුලිය, ජලය, සන්නිවේදන වැනි) සඳහා දරනු ලබන වියදමයි.

### ■ මෙහෙයුම්කරණය හා ඇගයීම - Monitoring & Evaluation (M&E)

මෙහෙයුම්කරණය යනු ව්‍යාපෘතිය ක්‍රියාත්මක අවධියේ සිදු කරනු ලබන සොයා බැලීම් වන අතර ඇගයීම යනු ව්‍යාපෘතිය ආරම්භයට පෙර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ දී හා ව්‍යාපෘතිය අවසානයේ කරනු ලබන සොයා බැලීමයි.

මෙහෙයුම්කරණය ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ දී ව්‍යාපෘති සැලැස්මට අනුව අපේක්ෂිත නිමැවුම් හා ක්‍රියාකාරකම් කොතෙක් දුරට සිදුවන්නේද යන්න විමසා බැලීම සිදු වෙයි. ප්‍රගති වාර්තා, ක්ෂේත්‍ර නිරීක්ෂණ, රැස්වීම් මගින් සිදුකරණ ආකාරය සඳහන් කළ යුතුය.

ඇගයීම ලෙස විනිශ්චයට අවශ්‍ය තොරතුරු රැස්කිරීම හා ඉන් තීරණ වලට එළඹීම ඇගයීමයි. අපේක්ෂිත අරමුණු ඉටුවන්නේද, ප්‍රතිඵල ඉලක්ක කණ්ඩායමට ලැබුනේද, වියදමට සරිලන ප්‍රතිලාභ ලැබුනේද යන්න සොයා බැලීමයි. පරීක්ෂණ, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි, සම්මුඛ

සාකච්ඡා මේ සඳහා යොදා ගැනීම හා එය සිදුකරණ පාර්ශවය පිළිබඳ සඳහන් කළයුතුය. ව්‍යාපෘති මෙහෙයුම්කරණය ව්‍යාපෘති කණ්ඩායම විසින් සුදුසු ක්‍රමවේ ද ඔස්සේ කරනු ලබන අතර, ඇගයීම වෙනත් බාහිර පාර්ශවයක් විසින් සිදු කිරීම කරනු ලබයි.

■ **පාරිසරික බලපෑම**

ව්‍යපෘතියෙන් පරිසරයට හෝ පරිසරයෙන් ව්‍යාපෘතියට යම්කිසි බලපෑමක් වන්නේද හා එය වලක්වා ගැනීමට ගන්නාවූ ක්‍රියාමාර්ග සඳහන් කළයුතුය.

කුඩා පරිමාණ ව්‍යාපාති සඳහා පළාත් පාලන ආයතන වෙතින් ද මහා පරිමාණ ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවී ව්‍යාපාති වාර්තාව සමග ඉදිරිපත් කළ යුතුය. වර්තමානයේ අවධානය යොමු කෙරෙන ප්‍රධාන අංගයකි.

. **කාන්තා සහභාගිත්වය**

ව්‍යාපෘතිය සඳහා කාන්තා සහභාගිත්වය ලබා ගන්නා ආකාරය පිළිබඳව කරුණු ඇතුළත් කළ යුතුය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සමස්ථ රටවල් 192 විසින් එකගවී ඇති වර්ෂ 2030දී ළඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් 17 අතරින් 5වන ඉලක්කයක් ලෙස 'ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහුනු ළමුන් සවිබල ගැන්වීම් හඳුනාගෙන තිබීම නිසා ව්‍යාපෘතිය සඳහා කාන්තා සහභාගිත්වය ලබාගැනීම බොහෝ සංවර්ධන වැඩසටහන්වල වැදගත් සාධකයකි.

විශේෂයෙන් ජාත්‍යන්තර සංවිධාන විසින් අරමුදල් සැපයීමේ දී විශේෂ අවධානයක් යොමු කරනු ලබන කරුණකි.

■ **තිරසාරකත්වය**

ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම ප්‍රධාන සංවර්ධන ආධාර අවසන් වූ පසුවද ප්‍රතිලාභ පැවතීම. දිගු කාලීන ප්‍රතිලාභ අඛණ්ඩව ලැබීමේ සම්භාවිතාව. ශුද්ධ ප්‍රතිලාභ කාලානුරූපීව ගලායාමේ අවධානමට ඔරොත්තු දීම වැනි කරුණු සලකා බලනු ලබයි.

කුඩා හෝ මධ්‍යම පරිමාණයේ ව්‍යාපෘති බොහොමයක් අසාර්ථක වීම සඳහා හේතු වී ඇත්තේ මේ පිළිබඳව දක්වන අවධානය අවම වීමයි.

■ **ඇමුණුම්**

ව්‍යාපෘතිය වාර්තාව අවසානයේ වැඩිමනක් තොරතුරු හෝ විශේෂිත කරුණු අනුග්‍රාහක ආයතනයේ අවධානය සඳහා යොමු කිරීමට ඒවා ව්‍යාපෘති වාර්තාව අවසානයේ ඇමුණුම්

ලෙස ඉදිරිපත් කළ යුතුය.
තත්ත්ව විශ්ලේශන වාර්තා, සිතියම්, ඡායාරූප, ගමන් විස්තර, සහතික පත්‍ර, මූල්‍ය විග්‍රහයන්, වැඩ විස්තර, ප්‍රගති වාර්තා ආකෘති, ජීව දත්ත හා වෙනත් වාර්තා මෙලෙස ඉදිරිපත් කළ හැකිය.

ව්‍යාපෘතියට අදාලව තොරතුරු සපයා ගැනීමට යම් මූලාශ්‍රයන් (පොත් පත්, අන්තර් ජාලය, ප්‍රකාශන) භාවිතා කළේ නම් එම තොරතුරුද ඇතුළත් කළ හැකිය.

ඒ අනුව ඉහත ආකෘතිය හා මාර්ගෝපදේශයන් යටතේ සැලසුම්කරණ ලද ව්‍යාපෘතියක්.

- ආර්ථික වශයෙන් ක්‍රියාත්මක කළ හැකිවිය යුතුය.
- මූල්‍යමය වශයෙන් දැරිය හැකිවිය යුතුය.
- තාක්ෂණික වශයෙන් සාධ්‍යතාවයක් තිබිය යුතුය.
- සමාජීය වශයෙන් පිළිගත හැකිවිය යුතුය.
- පරිසරයට අනුගත විය යුතුය.

ඒ අනුව සාර්ථක ව්‍යාපෘතියක හිමිකාරිත්වය හෝ කොටස්කරුවකු වීම සඳහා කාන්තා ඔබට මෙම කරුණු හා ඒ ඔස්සේ තවදුරටත් අධ්‍යයනය කිරීම තුළින් හැකි වනු ඇත.

# මිහි කත

සුමධුර හඬින් පරදාලන කුරවි සර
සුකොමල රුවින් දකිනා නෙත එකළු කර
සතුටින් දරන පිරිමින් නොදරනා බර
ගැහැනිය තමයි මේ දැනට නැගෙන ඉර

සෙනෙහස පිරි දෙනෙත පරදන මල් ඉද්ද
රතු කර විටක කෝපයේ හී සර විද්ද
සැනෙකින් වෙනස් විය හැකි නොකරම සද්ද
කත වන් අරුමයක් මේ ලොව තුළ ඇද්ද

පළවා හේතු හිමියන් හට ගැහැට වෙන
දරුවන් තනා නෙත් පාදා ලොවට දෙන
නෑ සියයන් පවා සුමගට රැගෙන එන
නූතන විශාඛාට අවමන් නොකළ මැන

ගැරහුම් අවලාද ලැබෙනා දුක් ගැහැට
කඳුළක බරක් පමණක් කරගෙන ඇහැට
නොසැලී නියමු වී සිට පවුලේ රැහැට
අම්මා විනා දෙවියකු වේවිද පිහිට

හිමියෙකු ඇතත් තනිවම කරමින් යුද්ද
මඟහැර යමින් බැහැරින් වැටෙනා මද්ද
දරුවන් බර සමඟ පවුලේ ගැල ඇද්ද
කත දුර්වලයි යන කියමන බොරු නැද්ද


ලැබෙනා දුක් ගැහැට කරදර උදේ හවා
දරම්සිරිකතව සෙනෙහෙන් ලොවම නිවා
දරනා තැනට කත ගරුකර සිරස නවා
මිහි කත ලෙසින් නම් වූවා පොළොව පවා

කේ.පී. ලැනරෝල්,
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## ඇය ගැහැණිය...

තබා නොපෙනෙන ඉමක කඳුලැලි
මිහි තලය මෘදු කළෝ
ගැහැණුය..
මවාලූ මිහිරිතම අමළුල
හිරු කිරණ රැස් කළෝ
ගැහැණුය...
නිවා සරතැස දුරු කරනු රිසි
සෙවන දුන් තුරු මුදුන්
ගැහැණුය...
මවා සොඳුරුම ලොවක් දනවෙත
පොළොව ළය මත දැරූ
ගැහැණුය...

හිරුණි විහංගා ලියනගේ,
ප්‍රථම වසර,
ඉංජිනේරු පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය.



ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
இலங்கை பெண்கள் பணியகம்
Women's Bureau of Sri Lanka

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு
Ministry of Women, Child Affirs and Social Empowerment